ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය

தேசிய நீரியல்வள முகாமை

NATIONAL AQUATIC RESOURCES AGENCY

NARA
06-12-1994
LIBRARY

# 1989

# NARA

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

வருடாந்த அறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT AND ACCOUNTS

# මුහුදු ජීව විද්‍යාත්මක සම්පත් අංශය.

## 1989 වාර්ෂික වාර්තාව.

1989 වර්ෂයේ මෙම අංශය විසින් භාරගනු ලැබූ පර්යේෂණ වැඩ සටහන සඳහා පර්යේෂණ නිලධාරීන් නියුක්ත වන ලදී. ඩී.එස්.ජයකොඩි මහතා එක්සත් රාජධානියේ ස්ටර්ලිං විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධි වැඩසටහන අවසන් කොට 1989.04.23 දින පෙරළා සිය රටට පැමිණියේය.

සී.අමරසිරි මහත්මිය එක්සත් රාජධානියේ බැන්ගෝ නුවර උතුරු වේල්ස් හි විශ්ව විද්‍යාල කොලීජියේ විද්‍යාපති උපාධි පාඨමාලාවක් අවසන් කොට 1989.04.10 දින ශ්‍රී ලංකාවට පෙරළා පැමිණියාය.

සමහර පළාත්වල ප්‍රවාහණ පහසුකම් නොමැති වීම හා රටෙහි පැවැති සිවිල් නොසන්සුන් තාවය ද හේතුකොට ගෙන මේ වර්ෂයේ සමහර මාසවල මෙම පර්යේෂණ කටයුතු අඩාල විය. ඉහත දැක්වූ හේතු නිසාම දකුණු පළාතේ තාරා/අයිපිටිපි තියැඳි වැඩසටහන අධීක්ෂණ කටයුතු දිගටම පවත්වා ගෙන යාමට නොහැකි විය.

අදාල කාල සීමාව තුල ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ඉල්ලීම් මත මෙම අංශය විසින් නව ව්‍යාපෘති දෙකක් දියත් කරවන ලදී. ඒවා නම්: -

පුත්තලම් කලපුවේ/වෙරළබඩ ප්‍රදේශවල ට්‍රෝල් ධීවර කර්මාන්තය අධ්‍යයනය කිරීම හා උපතිතල අධ්‍යයන කිරීමත්ය

පර්යේෂණ කටයුතුවල සංක්ෂිප්ත විස්තරයක් මෙහි පහත දැක්වේ :-

1989 වර්ෂයේ මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ නිලධාරීහු තුන් දෙනෙකු සහභාගී වූහ.

1.1. උතුරු පලාතේ කල්පිටියේ සිට දකුණු පලාතේ හම්බන්තොට දක්වා ඇති ප්‍රධාන මසුන් ගොඩබෑමේ ස්ථානවල තාරා/අයිපිටිපි තියැඳි වැඩසටහන 1989 වර්ෂයේ දී දිගටම කරගෙන යන ලද අතර ඒ ඒ තෝරාගත් ස්ථාන වල මසුන් ඇල්ලීම/ප්‍රයත්න හා දිගු සංඛ්‍යාත දත්ත රැස්කොට තියැඳි ද තබන ලදී. දකුණේ මුළු කාල සීමාව තුල මෙම තියැඳි කටයුතු අඩපන වූ අතර බස්නාහිර ප්‍රදේශ වල ද වරින් වර එවැනි අඩපන වීම් සිදුවිය. රැස්කරන ලද දත්ත කුඩා ටූනා මසුන් හා තෝරා මසුන් සඳහා විශ්ලේෂණය කරන ලද අතර මෙම මසුන්ගේ තත්ත්වය පිළිබඳ විද්‍යාත්මක පත්‍රිකා ද සකස්කොට සම්මන්ත්‍රණ හා වැඩ මුළු ආදිය සඳහා ඉදිරිපත් කරන ලදී. ඉදිරියේ දී පැවැත්වීමට නියමිත විශේෂඥ උපදේශකවරුන්ගේ ඉන්දියානු සාගරයේ ටූනා තොග තක්සේරු කිරීම සඳහා වූ රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා වූ රැස්වීමට ඉදිරිපත් කිරීම පිණිස අනිකුත් මසුන් වර්ග පිළිබඳ විද්‍යාත්මක පත්‍රිකා පිළියෙල වෙමින් පවතී.

2 ...

## 1.2. එෆ්.ඩබ්ලිව් 35 යාත්‍රාවේ ගවේෂණ ධීවර කටයුතු.

වයඹ ප්‍රදේශයේමසුන් අල්ලාගැනීමේ ප්‍රමාණය වැඩි දියුණු කිරීමට තොරතුරු එක්රැස් කිරීමේ අභිලාශයෙන් ඉංජිනේරු සහ තාක්ෂණික අංශයත් මුහුදු ජීව විද්‍යා අංශයත් එක්ව මසුන් ඇල්ලීමේ ගැඹුරු ස්ථාන මාරු කරමින්, බෙංගාල බොක්ක ව්‍යාපෘතියේ ගවේෂණ ධීවර කටයුතු පිළිබඳ පසු විපරම් අධ්‍යයනයක් කරන ලදී.

මෙම වර්ෂය තුළ දී දින 178 ක් මුහුදේ ගතකරමින් චාරිකා 28 ක් මෙහෙයවන ලදී. මෙයින් දින 104 ක් නිත්‍ය මසුන් ඇල්ලීමේ කටයුතු වලම නියුතු වීය. කරමල දැල් මසුන් නිෂ්පාදනය සාමාන්‍ය වශයෙන් දිනකට කි.ග්‍රෑ.288.4 ක් වූ අතර ලෝන් ලයින් මසුන් නිෂ්පාදනය දිනකට කි.ග්‍රෑ. 113.7 ක් වේ. කරමල දැල් මසුන් ඇල්ලීම සඳහා වඩාත්ම ලාභදායක ගැඹුර මීටර 2 කි. ලෝන් ලයින් සඳහා ගැඹුර මීටරයකින් .25 කි.

## 1.3 ජීව විද්‍යාත්මක අධ්‍යයනයන්:

1.3.1 කාවා කාවා සහ ෆ්‍රිගේට් ටූනා වර්ගවල මසුන්ගේ වැඩීම හා ආයුෂ අධ්‍යයනයක් 1989 අප්‍රේල් මාසයේ දී ඇරඹින.මෙම විෂයය පිළිබඳව පර්යේෂණ පත්‍රිකාවක් පිළියෙල කොට එය ඉන්දියානු සාගර ටූනා නමින් යුතු විශේෂඥ හමුවට ඉදිරිපත් කරනු ඇත.

1.3.2 ෆ්‍රිගේට් ටූනා මසුන්ගේ බිත්තර දැමමේ ජීව විද්‍යාව හා ආහාර ගැනීමේ අධ්‍යයනයක් 1989 වර්ෂයේ දී කරගෙන යන ලදී. ෆ්‍රිගේට් ටූනා මසුන්ගේ බිත්තර දැමීමේ වාර දෙකක් නිරීක්ෂණය කරන ලදී. වැඩුණු පසු මෙම මත්ස්‍යයාගේ දිග සෙ.මී.27.3 ක් යයි ඇස්තමේන්තු කර ඇත. ෆ්‍රිගේට් මසුන්ගේ ආහාරය64.2% ක් මත්ස්‍යයින් ද 21.4 % ක් දැල්ලන් ද 11.8 % ක් කුස්ටේසියන් හා 2.6 % විවිධ ජීවීන් ද වේ. වැඩුණු ෆ්‍රිගේට් ටූනා මසුන් මිනිස් මස් අධික ලෙස අනුභව කිරීමට ප්‍රිය බැව් හෙළිවීය.

## 2. කුඩා සාමුද්‍රික මසුන් අධ්‍යයනය.

2.1 මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු යොදවනු ලැබීය. විශාල සාමුද්‍රික මසුන් මෙන්ම නාරා/අයිපීපීපී තියැඳි වැඩසටහන යටතේ උතුරු දෙසින් කල්පිටියේ සිට දකුණු දෙසින් හම්බන්තොට දක්වාත් ආවරණය වන

පරිදි කරමල දැල් ධීවර කර්මාන්තය පිළිබඳ දත්ත රැස් කරන ලදී. මෙයට අමතරව හලාවත කරමල දැල් ධීවර කර්මාන්තය ද, බේරුවල මාදැල් ධීවර කර්මාන්තය ද හික්කඩුව/අම්බලන්ගොඩ හැඹිලිදැල් ධීවර කර්මාන්තය පිළිබඳව ද නාරා පර්යේෂණ පිරිස් විසින් අධ්‍යයනය කරනලදී. රැස්කරන ලද දත්ත අනුව අධ්‍යයනයට භාජනය වූ ප්‍රදේශවල කරමල්දැල් ධීවර කර්මාන්තයෙන් නිෂ්පාදනය කළ මසුන් ප්‍රමාණය නොවෙනස් මට්ටමක පවතින බැව් හෙළිවී ඇත. හික්කඩුව/අම්බලන්ගොඩ ප්‍රදේශවල හැඹිලිදැල් ධීවර කර්මාන්තයේ නිෂ්පාදනය ස්වල්ප වශයෙන් වැඩි ඇත. මෙම වර්ෂය තුළ මෙම පෙදෙසේ හැඹිලි දැල් භාවිතයෙන් අල්ලා ගත් කාවා කාවා හා ප්‍රිගේට් ටූනා මසුන් හෙවත් ටූනා මසුන් නිෂ්පාදනය වැඩි වී ඇත. බටහිර වෙරළ බඩ සාඩින් ( A.Sirm ) මසුන් වර්ගයේ තොග තත්ත්වය ද අධ්‍යයනය කරන ලදී.

## 2.2. ජීව විද්‍යාත්මක අධ්‍යයනය.

හාල් මැස්සා හා කුම්බලාවා ගේ වැඩීම හා ආයුෂ පිළිබඳව, එම මසුන් ගේ ශ්‍රෝණිආශයෙහි මුද්දුවක් යොදා දෛනිකව වැඩීම පරීක්ෂා කොට අධ්‍යයනයක් කරන ලදී. කුඩා සා මුද්‍රිය මසුන් පිළිබඳ කරන ලද පර්යේෂණ පත්‍රිකා සකස් කොට ජපානයේ ටෝකියෝ නුවර පැවැත්වෙන දෙවෙනි ආසියානු ධීවර සමුළුවට ඉදිරිපත් කරන්නට යෙදිණ.

## 3. ඉස්සන් ධීවර කර්මාන්තය අධ්‍යයනය.

මෙම ව්‍යාපෘතිය ආවරණය වන ප්‍රදේශ හලාවත, මීගමුව හා කළුතර වේ. හලාවත ට්‍රෝලිං ක්‍රමයට ටො.3 1/2 බෝට්ටු මගින් ඉස්සන් අල්ලනු ලබන අතර මීගමුවේ මේ සඳහා රුවල් යොදා යාන්ත්‍රික නොවන ඔරු භාවිතා කරනු ලබයි. කළුතර ප්‍රදේශවල ඉස්සන් ඇල්ලීම FRP බෝට්ටු යොදා හැකිලි දැල් මගින් කරනු ලබයි.

සෑම මසුන් ගොඩ බෑමේ ස්ථානයකටම මසකට දෙවරක් බැගින් ගොස් ඒ ඒ ඉස්සන් වර්ග අල්ලා ගැනීම හා ප්‍රයත්න පිළිබඳ දත්ත රැස්කරන ලදී. පිනායස් ඉන්ඩිකස් ( **Penaeus Indicus** ) නම් ජීවියාගේ හියැඩි ගෙන දිග මැන බලා ගැණු/පිරිමි බව සහ වැඩීමේ ඒ ඒ කාල පරිමාන ආදිය වාර්තා කරන ලදී. පෙබරවාරි මාසයේ දී එම වර්ගවලම රූප ප්‍රමිති අධ්‍යයනයන් කිරීම ආරම්භ කරන ලදී.

1988 සිට 1989 දක්වා කාලය තුල මීගමුවේ සම්පූර්ණ ඉස්සන් අල්ලා ගැනීමේ ප්‍රමාණය 20% කින් පහත බැස ඇත. 1988 සිට 1989 දක්වා කාලය තුල හලාවත ද ඉස්සන් ලබාගැනීමේ ප්‍රමාණය 6 % කින් පහත බැස තිබේ. කළුතර ප්‍රදේශයේ ඉස්සන් අල්ලා ගැනීමේ ප්‍රමාණය 1988 වර්ෂයේ මෙන් පැවතුන ද එය 1987 වර්ෂයට වඩා අඩුවිය.

## 4. පොකිරිස්සන් ධීවර කර්මාන්තය :

1989 මාසයේ දී ජයකොඩි මහතා ආපසු පැමිණි පසු පොකිරිස්සන් පිළිබඳ ක්ෂෙත්‍ර වැඩ කටයුතු නැවත ආරම්භ කරන ලදී. රටතුල පැවතුන අසහන කාරී තත්ත්වය හේතුකොට ගෙන ජූනි, ජූලි හා අගෝස්තු මාසවල නිත්‍ය නියැඳි කටයුතු නොකෙරිණ. මේ වර්ෂයේ අගෝස්තු මාසයේ දී දකුණේ පොකිරිස්සන් වාරය ඇරඹුණ ද ක්ෂෙත්‍ර චාරිකා කිහිපයක් පමණක් කරන ලදී.

කෙසේ වුව කල්පිටිය ප්‍රදේශයේ පොකිරිස්සන් ධීවර කටයුතු සමීක්ෂණය කරන ලද අතර ඒවායේ රූප ප්‍රමිතික අධ්‍යයනයන් සඳහා නිත්‍ය නියැඳි රැස් කරනු ලැබීය.

## 5. උපනිතල ධීවර කර්මාන්තය.

මෙම සමීක්ෂණය ආරම්භ කරනු ලැබුවේ 1989 අගෝස්තු මාසයේ දී මීගමුව හා හලාවත ප්‍රදේශවලය. ව්‍යාපෘතියේ එක් නිලධාරියෙකු සේවය කරයි. 1989 මාස පහ තුල වාණිජමය වශයෙන් වැදගත් වන මසුන් එනම් උපනිතල මසුන් හඳුනා ගන්නා ලද අතර මීගමුවේ ප්‍රධානතම ධීවර කර්මාන්තය වන අත්වැල් ධීවර කර්මාන්තය එනම් උපනිතල මසුන් අධීක්ෂණය කොට අල්ලාගනු ලැබූ මසුන් /ප්‍රයත්න දත්ත, ඒඒ Lethrinus වර්ගවල හැඳියාව සහ දිග ප්‍රමාණයන් සහිත දත්ත, තොග තක්සේරු කිරීම පිණිස රැස් කරන ලදී. අත්වැල් ධීවර කර්මාන්තයෙන් ලබා ගත් මසුන් ප්‍රමාණය දිනකට බෝට්ටුවකින් කි.ග්‍රෑ. 14.3 වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර මීගමුවේ උපනිතල මසුන් වල මාසික සාමාන්‍ය නිෂ්පාදනය මෙ.ටො. 17.2ක් වශයෙන් වාර්තා කොට ඇත.

5 ......

6 . ට්‍රෝලර් ධීවර කටයුතු සමීක්ෂණය ( පුත්තලම් කලපුව/වෙරළබඩ මුහුදු ප්‍රදේශය.

මෙම සමීක්ෂණය 1989 පෙබරවාරි මාසයේ දී ආරම්භ විය. ඒ ප්‍රධාන වශයෙන් කල්පිටිය ප්‍රදේශයේ ට්‍රෝලර් යාත්‍රා මගින් සම්පත් තෙලා ගැනීම පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහාය. දෙසතියකට වරක් ක්ෂේත්‍ර චාරිකා කොට මසුන් අල්ලා ගැනීම, ප්‍රයත්න හා දිගු සංඛ්‍යාත යන දත්ත රැස්කොට ගැනීමට කටයුතු කරන ලදි. දත්ත සමහරක් විශ්ලේෂණය කොට මෙම ප්‍රදේශයේ පවතින ට්‍රෝලර් ධීවර කර්මාන්තආරවුලක් සඳහා වාර්තා වක් සකස් කිරීමට එමගින් තොරතුරු ලබා ගන්නවා ඇත.

7. පුහුණුව/වැඩ මුළු/ සම්මන්ත්‍රණ.

7.1 තායිලන්තයේ බැංකොක් නුවර 1989 ජනවාරි මස 22 දින සිට 26 දින දක්වා පැවැති තොග තක්සේරු පුහුණු පාඨමාලාවකට ආර්.මල්දෙනිය මහත්මිය සහ ඇන්.ඇම්.මොයියදීන් මහතා ද සහභාගී වූහ.

7.2 ඕමාන් හි මස්කට් නුවර 1989 පෙබරවාරි මස 6 දින සිට 8 දින දක්වා පැවැති උතුරු අරාබියානු මුහුදේ ටූනා සහ තෝරා ම ' පිළිබඳ වැඩ මුළුවකට ආචාර්ය. පී. දයාරත්න සහ ජේ.ඒ. ද සිල්වා මහතාත් සහභාගී වූහ. ආචාර්ය දයාරත්න විසින් පර්යේෂණ පත්‍රිකා දෙකක් එහිදී ඉදිරිපත් කරන ලදී.

7.3. ජපානයේ ටෝකියෝ නුවර 1989 අප්‍රේල් 17-27 දින දක්වා පැවැති දෙවෙනි ආසියානු ධීවර සමුළුවට ආචාර්ය පී.දයාරත්න සහභාගී වූ අතර පර්යේෂණ පත්‍රිකා දෙකක් එහි දී ඉදිරිපත් කරන ලදී.

7.4 තායිලන්තයේ පුකට් නුවර 1989 සැප්තැම්බර් 11-12 දිනවල පැවැති ධීවර පර්යේෂණ කළමනාකරණය මැයෙන් වූ සම්මන්ත්‍රණයකට ආචාර්ය.පී. දයාරත්න සහභාගී විය.

7.5 ඊජිප්තුවේ කයිරෝ නුවර 1989 ඔක්.15 සිට දෙසැ.21 දින දක්වා පැවැති මුහුදු කටයුතු මැයෙන් වූ I.O.I/ IOMAC පුහුණු වැඩසටහනට සී.ජයවික්‍රම මහත්මිය සහභාගී වූවාය.

8. <u>ප්‍රකාශණ ලේඛනය.</u>

8.1 <u>ප්‍රසිද්ධ කළ පත්‍රිකා.</u>

" ශ්‍රී ලංකාවේ වයඹ වෙරළබඩ ඇති කුඩාකරමල දැල් මසුන් Amblygastar Sirm (වල්බාවුම්) තක්සේරු කිරීම.

- දයාරත්න එන්.එම්.පී.ජේ.(1989 )

ජපානයේ ටෝකියෝ නුවර පැවැති දෙවෙනි ආසියානු ධීවර සමුළුවට ඉදිරිපත් කරන ලදී.

Stolephorus heterolobus ( රපෙල් ) නමැති මසුන්ගේ ශ්‍රෝණාශ්මයේ මුදුවක් යොදා දෛනික වැඩීම හා ආයුෂ ඇස්තමේන්තු කිරීම. ජපානයේ ටෝකියෝ නුවර පැවැති දෙවෙනි ආසියානු ධීවර සමුළුවට ඉදිරිපත් කරන ලදී.

- දයාරත්න එන්.එම්.පී.ජේ(1989)

උතුරු අරාබියේ මුහුදු ප්‍රදේශයේ ටූනා මසුන් හා තෝරා මසුන් පිළිබඳව සුල්තානේට් ඔෆ් ඕමාන් නුවර පැවැති වැඩමුළුවේ වාර්තා වක්

හා

ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ Somberonorus Commerson නම් මසුන්ගේ ආයුෂ ,වැඩීම හා මැරියාම ඇස්තමේන්තු කිරීම.

- දයාරත්න, එන්.එම්.පී.ජේ.(1989)

ශ්‍රී ලංකාවේ CLUPEIDS මත්සයයාගේ ශ්‍රෝණාශ්මයේ මුදුවක් යොදා මූලික වැඩීම. ආසියානු ධීවර විද්‍යා සඟරාවේ වෙළුම 2 පිටු 255-264

- දයාරත්න ,එන්.එම්.පී.ජේ.(1989)

ශ්‍රී ලංකාව වටා ඇති ජලයෙහි තෝරා මසුන් ( Scomberonorus ) වර්ගයක් සඳහා ධීවර කර්මාන්තය.

සුල්තානේට් ඔෆ් ඕමානයේ මස්කට් නුවර පැවැති උතුරු අරාබියානු මුහුද ප්‍රදේශයේ ටූනා මසුන් හා තෝරා මසුන් පිළිබඳ වැඩ මුළුවේ වාර්තාව

- දයාරත්න, එන්.එම්.පී.ජේ (1989)

"ශ්‍රී ලංකාවේ Panylirus homorus හෙවත් (Crustacea Decapoda. Palinuridae) ගැහැණු මත්ෂයාගේ මෛථුන අවස්ථාවේදී හා බිත්තර දැ මීමේ අවස්ථාවේ දී ආක්‍රමණශීලී වන විට ගතෙහි ප්‍රමාණය" මුහුදු පරිසර විද්‍යා ප්‍රගතිය සඟරාවේ වෙලුම 57:83-87.

- ඩී.එස්.ජයකොඩි (1989)

"YellowFin tuna (කෙලවල්ලා) මසුන්ගේ ආහාර සහ ආහාර ගැනීමේ පුරුදු" ආසියානු ධීවර විද්‍යා සඟරාවට සපයන ලද ලිපියකි.

- මල්දෙනිය, ආර්.

" ශ්‍රී ලංකාවේ බටහිර හා දකුණු මුහුදේ වෙරළබඩ හා වෙරළෙන් ඔබ්බෙහි කෙරෙන කරමලදැල් හා ලෝන් ලයින් ධීවර කර්මාන්තය මගින් අල්ලාගනු ලබන මසුන් ප්‍රමාණය" නාරා සඟරාවේ පලකිරීමට ඉදිරිපත් කරන ලද ලිපියකි.

- මල්දෙනිය, ආර්.

8.2 <u>ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ දී කියවන ලද පත්‍රිකා.</u>

" ශ්‍රී ලංකාවේ මීගමු ප්‍රදේශයේ වෙරළබඩ ජලයෙහි ඇති ( Ambligastar=Sirm)කුඩා 'කරමල දැල් මසුන් තොග තෙලා ගැනී 45 වන සැසි වාරයේ දී කියවන ලදී)

- කරුණාසිංහ ,ඩබ්ලිව්.පී.එන් සහ විජයරත්න,ජේ.

" තෝරාගැනීමේ අධ්‍යයනයන්ගෙන් හා ජීව විද්‍යාත්මක කරුණු අනුව ShipJack (බලයා) හෙවත් Katsuwonus Pelomis) සහ Yellow fin tuna (කෙලවල්ලා) හෙවත් Yhunnus නම් මත්සයයින් අල්ලා ගැනීමට වඩාත් කාර්යක්ෂම වන්නාවූ දැල් වල ඇස් ප්‍රමාණය නිගමනය කිරීම" (45 වැනි සැසි වාරයේ දී කියවන ලදී)

- මල්දෙනිය,ආර්.

## 9.ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබූ වාර්තා.

9.1 <u>ධීවර ආරාවුල් පිළිබඳව:</u>

පුත්තලම කල්පුවේ ට්‍රෝලිං ක්‍රමයට මසුන් ඇල්ලීම -

- ඇස්.ඇල්.සුරවීර සහ ඇස්.ජේ.සී.ජයවික්‍රම (1989)

හලා වන ඉස්සන් සඳහා ට්‍රෝලිං කිරීම -

- ඇස්.ජේ.සී.ජයවික්‍රම (1989)

මාතර කොටමුණේ මාදැල් අරාවුලක් පිළිබඳ විභාග කිරීම -

- ඇස්.ඇල්.සුරවීර සහ ඩබ්.පි.ඇන්.කරුණාසිංහ(1989)

වැලිගම නව මසුන් ඇල්ලීමේ තාක්ෂණය පිළිබඳ පරීක්ෂණය.

- ජේ.ඒ. ද සිල්වා ,(1989 )

9.2 වෙනත් වාර්තා.

9.2.1 කප්පරතොට,කල්පිටිය හා ත්‍රිකුණාමලය යන ස්ථානවල සංචාරිධන සැලැස්ම.

- ආචාර්ය පී.දයාරත්න විසිනි.

9.2.2 බටහිර වෙරළේ මුහුදු මත්ස්‍ය සම්පත්

- ආචාර්ය පී.දයාරත්න විසිනි.

9.3 පුවත්පත් ලිපි සහ ගුවන් විදුලි වැඩ සටහන්:

9.3.1 මුහුදු සම්පත් සුරැකීම පිළිබඳව ගුවන් විදුලි කථාවක්. 1989 අප්‍රේල් මස 02 වෙනි දින -බෙන්ගාල බොක්ක ව්‍යාපෘති වැඩසටහන

- ආචාර්ය පී.දයාරත්න

9.3.2 ඩිස්කො දැල් භාවිතය හේතුවෙන් පොකිරිස්සන් අඩුවීම "විදුවර සඟරාව" සිංහල - 1989 ජුනි 19 දින.

- ඩී.එස්.ජයකොඩි.

"පෙරිල් දූපතේ පොකිරිස්සන්!" -ඉංග්‍රීසි වැඩසටහන 1989 ජූලි 02 දින.

" අපගේ පොකිරිස්සන් සම්පත ආරක්ෂා කර ගැනීමට " දිවයින පුවත්පත - සිංහල , 1989 ජූලි 16 දින.

" පොකිරිස්සන්ට හිතැති විද්‍යාඥයා "

විදුවර සඟරාව - සිංහල ' 1989ජූලි 17 දින.

අත්/කළේ:- ආචාර්ය පී.දයාරත්න,

අධ්‍යක්ෂ , මුහුදු ජීව විද්‍යා අංශය.

**මිරිදිය ජලජ සම්පත් අංශය.**

**1989 ජනවාරි - දෙසැම්බර් වාර්ෂික වාර්තාව.**

**මෙම කාර්යාංශයේ පරමාර්ථ:**

1. ගෘහස්ථ පාරිභෝජනය සඳහා වරල් මසුන් නිශ්පාදනය කිරීමට හා අපනයනය කිරීම සඳහා කිවුල් දිය ඉස්සන් වර්ගවල මසුන් නිශ්පාදනය කිරීම සඳහා ජලජ සම්පත් කාර්යක්ෂමව උපයෝගී කර ගැනීම.

2. ගොඩතර ධීවර ජනගහණය සඳහා රැකියා සහ ආදායම් බෙදාහැරීම උදෙසා උපරිම මට්ටමක සමාජ ප්‍රතිලාභ සැලසීම.

**සේවක මණ්ඩලය:**

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරීන් | 11 |
| පර්යේෂණ සහකාරවරුන් | 05 |
| රසායනාගාර සේවකයන් | 01 |
| යතුරු ලියන්නන් | 01 |
| සැලසුම් කරුවන් | 01 |

වැඩිහරියක්ම ක්‍රියාත්මක වෙමින් පවතින පහත සඳහන් ව්‍යාපෘති නාරා ආයතනයේ දී මෙහෙයවනු ලැබීය.

ප්‍රධාන කාර්යාලය, කලින් හඳුනාගත් වැඩ බිම් හා කල්පිටියේ පිහිටි ප්‍රාදේශීය කාර්යාලයය.

රටතුල පැවැති නොසන්සුන් තත්ත්වය හේතුකොටගෙන 1989 වර්ෂයේ දී සමහර ව්‍යාපෘතිවල ක්‍රියාකාරීත්වයට වරින් වර බාධා ඇති විය.

03. **හඳුනාගෙන ඇති ම් [illegible] තන දිය යුතු ප්‍රදේශ:**

3.1 ඉස්සන් වර්ග හා වරල් මසුන් වර්ග වඩාත් ඇඩි නිශ්පාදනතාවයකින් යුතුව වගා කිරීම සඳහා යෝග්‍ය ක්‍රම නිගමනය කිරීම සඳහා අධ්‍යයනය.

3.2 රැක්කවීමේ ක්‍රමවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා මත්ස්‍යාගාර සංවර්ධනයන්, මත්ස්‍ය රෝග හා පරිපෝෂිතයන්, වරල් මසුන් හා ඉස්සන් වර්ගවල, මසුන් බෝකිරීමේ ක්‍රම ආදී නිශ්පාදනයට අවශ්‍ය ජලජ වගා ක්‍රම නිරවද්‍ය කර ගැනීම පිළිබඳ අධ්‍යයනය

3.3 කලාපීය පරිසර පද්ධති කළමනාකරණය කිරීමේ අධ්‍යනයන්

3.4 වගා කළ හැකිව ඇති වරල් මසුන් හා ඉස්සන් වර්ගවල සම්භාව්‍යතාවයන් අධ්‍යයනය කිරීම.

3.5 ජල වගාවන් සඳහා සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම.

3.6 ජලාශ ධීවර කර්මාන්තය කළමනාකරණ අධ්‍යනය.

3.7 විදේශවලට යැවීමට වගාකළ හැකි මසුන් වර්ගවල තත්ත්වය හා ජලාශ මසුන් කර්මාන්ත කළමනාකරණය වැඩි දියුණු කිරීමට මසුන්ගේ ප්‍රභවතාවත් අධ්‍යයනය කිරීම.

3.8 කුඩා පරිමාණයේ ජලජ වගා කරුවන්ගේ සමාජ ප්‍රතිලාභ වැඩි දියුණු කිරීමේ අපේක්ෂාමවත් සමාජ- ආර්ථිකය අධ්‍යයනය කිරීම.

## 4. 1989 වර්ෂයේ දී කරන ලද පර්යේෂණ කටයුතු:

### 4.1 වගාකළ හැකි මසුන් වර්ගවල සම්භාව්‍යයත් අධ්‍යනය කිරීම.

4.1.1 මලවි මත්ස්‍ය පැටවි සමීක්ෂණය - ජේ.ඒ.ද සිල්වා

4.1.2 කොස්සා මත්ස්‍ය පැටවි සමීක්ෂණය - ආචාර්ය ඒ.ද අල්විස්.

4.1.3 ආටේමියා ව්‍යාපෘතිය - එච්.එම්.කුරුප්පු

4.1.4 කලපු කකුළු ධීවර කර්මාන්තය - ඇස්.සි.ජයමාන්න

### 4.2 වගා ක්‍රම අධ්‍යනය

4.2.1 මෑද්වංගියන් වගා කිරීමේ ව්‍යාපෘතිය - ටී.බී.වන්නිනායක

4.2.2 මුහුදු පැලැටි වගා ව්‍යාපෘතිය - පි.එච්.ඒ.ජයසූරිය

4.2.3 රතු තිලාපියා ව්‍යාපෘතිය - ඩී.ඊ.එස්.ජයමහ

4.2.4 ජලාශ ධීවර කර්මාන්ත ව්‍යාපෘතිය - යූ.එස්.අමරසිංහ

4.2.5 ඉස්සන්/මසුන් රෝග නිධාන විද්‍යාව - ආර්.පෙරේරා

4.2.6 කඩොලාන නිශ්පාදිතය පිළිබඳ අධ්‍යනය - එච්.ඩී.අමරසිංහ

### 4.3 ව්‍යාපෘති විස්තර:

4.3.1 එන්ඩීබී/ඊඩීබී ව්‍යාපෘතිය - ජේ.එම්.පී.කේ.ජයසිංහ (ව්‍යාපෘති නායක)

1989 වර්ෂය තුලදී පහත සඳහන් වැඩ කරනු ලැබීය.

අ. ව්‍යාපෘතියේ II වැනි අදියර වැඩ කටයුතු

පානදුර සහ හම්බන්තොට අතර ඇති ඉස්සන් වගාව සඳහා සම්භාව්‍ය ප්‍රදේශ සිතියම් කිරීම සහ පරීක්ෂා.

ආ. පානදුර සිට මාතර දක්වා ඇති කිවුල් ජල ස්ථාන වල ඉඩම් භාවිතා කිරීම් රටාවන් සහ රසායනික සහ භෞතික ලාක්ෂණයන්ගේ පරීක්ෂා කිරීම.

ඇ. මූලික සමාජ විද්‍යාත්මක පරීක්ෂණ

ඈ. පුත්තලම් සහ බෙන්තොට අතර ඇති වෙරළ වගුරුවල ඇසිඩ් සල්ෆේට් සම්භාව්‍යතාවයන් පිළිබඳ සිතියම් කිරීම හා වර්ගකිරීම.

ඉ. ඉහත සඳහන් ප්‍රදේශවල පස්වල රසායනිකත්වය පිළිබඳ විස්තරාත්මක පරීක්ෂණ.

ඊ. ඇසිඩ් සල්ෆේට් සහිත පස් ඇති ප්‍රදේශවල ජල රසායන විද්‍යාව හා මණ්ඩිවල තත්ත්වයන් ද වාණිජමය ගොවිපලවල ඇති දූඹුරු කරමල ඉස්සන්ගේ පුනර්භවය හා වැඩීමේ පැවැත්ම පිළිබඳවද පුළුල් පරීක්ෂණ.

උ. පී.මොනොඩොන් (P. MONODON ) වගා කිරීමේ දී විෂ ලෝහ එකතුවීම පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා නියැදි රැස්කරන ලදී.

ඌ. පෝෂකයන්ට හා අපවිත්‍රකාරකවලට ගෝත්‍රවන ගොවිපලවලින් පිට වෙන අප ද්‍රව්‍ය අධීක්ෂණය.

ජේ.ඇම්.පී.කේ ජයසිංහ මහතාගේ පැදි ආචාර්ය උපාධි වැඩ සටහන මෙම ව්‍යාපෘතියේ වැඩවලට ඇතුළත් කොට ඇත.

4.3.2. <u>මලට් පැටව් (MULLET FRY ) සමීක්ෂණය.</u>

බාල මත්ස්‍ය පැටව් නියැදි කිරීම.

88 මැයි මස සිට 89 සැප්. මස අතර කලපුවේ අද්දර තෝරාගත් ස්ථානවල කුඩා මසුන් නියැදි කිරීමේ කටයුතු මෙහෙයවනු ලැබීය. ක්‍රම කිහිපයක් උපයෝගීකර ගනිමින් නියැදි කටයුතු කරන ලදී. ඉන් වඩාත්ම වැදගත් ක්‍රමය නම් දැල් විසිකිරීමෙන් හා දැල් තල්ලු කිරීමෙන් යන ක්‍රමයයි. මෙම ව්‍යාපෘතියෙහි පරමාර්ථ අතුරින් එකක් නම් පොකුණුවල බහා ලීම සඳහා කුඩා මසුන් මීගමු කලපුවෙන් ලබා ගැනීම පිළිබඳ නිගමනය කිරීමය. තිබෙන කුඩා මසුන් ප්‍රමාණයන් කොතෙක් දැයි ප්‍රමාණාත්මකව දත්ත ලබාගෙන නොමැත. වාණිජමය වශයෙන් අල්ලාගත් මසුන් විශ්ලේෂණය කිරීමෙන් හෙළි වන්නේ බඩවැටි අයිනෙන් ගෙනෙන ලද මලට් මසුන්ගෙන් වැඩි හරියක් තොග බහාලීමට සුදුසු ප්‍රමාණයේ මසුන් බවය.

(වාණිජ්‍ය කටයුතු සඳහා) කූඩා මසුන් රැස්කිරීම සාර්ථක වීමට නම් ඒවා ධීවර කාර්මිකයන් විසින් එකතු කළ යුතු වේ. ඒ ඒ වර්ගවල මලට් කූඩා මසුන් සිංහල නම් වලින්ම හඳුනා ගැනීම ධීවරයන් විසින්ම කිරීම වැදගත්ය. වාණිජමය අරමුණු සඳහා, වාණිජමය වශයෙන් අල්ලා ගනු ලබන මසුන් ප්‍රමාණය මගින් මසුන්ගේ බහුලතාවය හා ඒ ඒ වර්ගවල වෙනස්වීම් පිළිබඳ සාධාරණ ඇස්තමේන්තුවක් ද ලබා ගත හැකිය.

### 4.3.3 කොස්සා ( Grouper ) කූඩා මසුන් සමීක්ෂණය.

ව්‍යාපෘතිය 1989 වර්ෂයේ දී ආරම්භ විය. ක්ෂේත්‍ර චාරිකා මාසිකව කරන ලදී. චාරිකා කළ ස්ථාන නම් මීගමුව, හලාවත, කල්පිටිය හා කරුක්කපොතය. මසුන් රැස්කරන ස්ථානවලට ගොස් කූඩා මසුන් රැස් කිරීම පිළිබඳ දත්ත ලබා ගනු ලදී. වැඩුණු මසුන් පිළිබඳ දත්ත ලබා ගැනීමට මසුන් වෙළඳ පලවලට යන ලදී.

කූඩා මසුන් අල්ලා ගැනීම අඩුවී ඇති බව රැස්කරන ලද දත්තවලින් පෙනී ගොස් ඇත. කෙසේ වුව රැස්කරන ලද වර්ග අතරින් වඩාත්ම පොදු ජීවියා *E. tauvina* යි. අල්ලා ගනු ලැබූ වැඩුණු මසුන්ගේ ද මේ වර්ගය වැඩියෙන් තිබිණ. මසුන් අල්ලා ගැනීම අඩු වීමට හේතුව වශයෙන් රටෙහි පැවැති අසහනකාරී තත්ත්වයත් කලට වේලාවට කූඩා මසුන් පැටවුන් එකතුකරන මධ්‍යස්ථානවලට යාමට ප්‍රවාහන පහසුකම් නොලැබී යාමත් යැයි සඳහන් කළ හැකිය. ගුවන් ගමන් පහසුකම් නොලැබීම ද හේතුවකි.

### 4.3.4 ආටේමියා ව්‍යාපෘතිය/ සුරතල් මසුන් කර්මාන්තය.

පලාවි ලුණු ලේවායන්ගෙන් ලබා ගත් ශ්‍රී ලංකා ආටේමියාවල උෂ්ණත්වය හා ලවණතා සහජනතා අධ්‍යයනයක් කරන ලදී. එහි ප්‍රතිඵල වලින් පෙනී යන්නේ එම ආටේමියා අඩු උෂ්ණත්වයක තබා ගත නොහැකි බවයි.

2. පලාවිහි පරීක්ෂණාත්මක පොකුණු වල දී ආටේමියා යොදා ගෙන පරීක්ෂණ දෙකක් පවත්වන ලදී. ඉතා සාර්ථක වූ අතර පොකුණු 4 ජේම ආටේමියා කෝෂ්ඨ නිශ්පාදනය වී තිබිණ. මෙම කෝෂ්ඨ ඒ වායේ පෝෂක අගයන් සඳහා වොෂින්ටන් විශ්ව විද්‍යාලයේ ධීවර පාසලේ දී විශ්ලේෂණය කරනු ලැබීය. එම ප්‍රතිඵල වල Fatta Acid සහ Amino Acid පැති කඩ විශ්ලේෂණය කෙරෙමින් පවතී.

3. විසිතුරු මසුන් පිළිබඳ පුහුණු පාඨමාලා හතරක් පවත්වන ලදී. ඉන් ලැබූ ආදායම රු. 124,000/00 කි.

4. උපදෙස් සේවා වශයෙන් විසිතුරු මසුන් ප්‍රදර්ශණයක් පවත්වන ලදී. මසුන් විකිණීමෙන් රු.30,000/= ක ආදායමක් උපයනු ලැබීය.

5. වෙන්නප්පුව ඡන්ද කොට්ඨාශයේ ඇති පාවිච්චි නොකරන ලද මැටි වලවල් සුරතල් මසුන් ඇති කිරීම සඳහා අධ්‍යනය කරන ලදී.

6. රකියාවක් හඳුනා ගැනීම සඳහා ජනසවි ලාභීන් විසින් ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වන සුරතල් මසුන් ඇති කිරීම සඳහා වූ ව්‍යාපෘතියට කට සහභාගී වන ලදී.

## 4.3.5 කලපු කකුළුවන් ධීවර කර්මාන්තය.

මීගමු කලපුවේ දැනට කෙරෙන ධීවර කර්මාන්තය, නිශ්පාදනය හා ප්‍රයත්න පිළිබඳව සමීක්ෂණයක් කරන ලදී. ව්‍යාපෘතිය 1989 දෙසැම්බර් මස අවසන් කරන ලදී. ලබාගත් ප්‍රතිඵල අඩංගු ප්‍රවාද-යක් ද දශීනපති උපාධිය සඳහා සකස් කරන ලදී.

## 4.3.6 මෘද්වංගියන් වගා ව්‍යාපෘතිය.

### කාවාටියන්

කලාඹයේ ස්ථාන තුනක කාවාටියන්( Crassostrea Madrasinsis) පිළිබඳ අධීක්ෂණය කරන ලදී. ස්ථාන තුනේම රාක්ක 3 ක් බෙලි පැටවුන් අධීක්ෂණය සඳහා සාදවන ලදී. ඇස්බෙස්ටෝස් තරප්පු ද ජනෙල් පියන් කාවැටි කටු ද, පොල් කටු ද හුණු පිරියම් කළ හා හුණු පිරියම් නොකළ උළු ද සති දෙකකට වරක් කාවාටි පැටවුන් වැටීම පිණිස පහුරුවල තැන්පත් කරන ලදී. රැස්කරණය මත වැටෙන කාවාටි පැටවුන්ගේ වැඩීම මාසිකව වාර්තා කරනු ලැබේ. තත්වය පිළිබඳ නිගමනය කිරීම් වස් වල් කාවාටි නියැදි ද රැස්කරන ලදී. වැඩිදුර අධ්‍යයනය සඳහා භෞත- රසායනික පරාමිති සුප්ලැන්ටන් සහ ෆිටෝප් ලැන්ක්ටන් නියැදි ද රැස්කරන ලදී.

පුත්තලම් කලපුවේ හා මොහොත්තුවරම් හි උණ බම්බු පහුරු දෙකක් තනා කාවාටි පැටවුන් නැවත පැල කිරීම පිණිස සවිකරන ලදී.

### වල්කාවාටි වැටි සංවර්ධනය කිරීම.

කලාඹය මෝය කටේ වල් කාවාටි(Crassostrea Madrasensis) ගහණය ඉතා සීමා සහිතය. එබැවින් පාවිච්චි නොකළ උළු පොල්කටු සහ කොන්ක්‍රීට් කොට මෙම ප්‍රදේශයේ තබා කෘතිම පරය කාවාටි පැටවි වැඩීම පිණිස සංවර්ධනය කරන ලදී. මෙම වැඩ සටහන දිගටම කෙරීගෙන යන්නකි.

මට්ටියන් සහ හැඹිලියන් පරියේෂණ

කුඩා එහෙත් පුළුල් වෙමින් පවතින මට්ටයගේ හා හැඹිලියන් ධීවර කර්මාන්ත-යක් මීගමුව කලපු ප්‍රදේශයේ පැවැත් වේ.

ප්‍රධාන මසුන් වර්ග නම්:-

1. මට්ටයින්( Marcia opima )
2. (Marcia hiantina ) මට්ටියා
3. හැඹිලියන් (Gaffrarium tumidum )

පහත සඳහන් කර්තව්‍යන් සඳහා පුත්තලම් කලපුවේ ඉහළ කොටසේ ස්ථාන දෙකක් මේ සඳහා තෝරාගෙන තිබේ.

1. පැවැත්මේ අධ්‍යයනය
2. වැඩීම අධ්‍යයනය
3. කොල්ලකාරි හැසිරීම අධ්‍යයනය
4. තත්ත්ව සූචික අධ්‍යයනය.

පුත්තලම් කලපුවේ බෙල්ලන් නැවත පැල කිරීම.

පුත්තලම් කලපුවේ මීටර් 8 x 5 ප්‍රමාණයේ පගුරු තුනක් තනා දුඹුරු බෙල්ලන් Perna Perna හා කොළපාට බෙල්ලන් (Perna viridis ) පැල කිරීම සඳහා තබා ඇත.

1989 වර්ෂයේ දී පහත සඳහන් මෙහෙයුම් සිදු කරන ලදී :-

1. පළතුරු කඩා, පොල්කටු, හා සිදුරුකළ ටවලබෙල්ලන් වැඩීම පිළිබඳ අධ්‍යයනය.
2. මෙම උප ස්ථානවල බෙල්ලන්ගේ ගහණ තත්ත්වය අධ්‍යයනය.
3. බෙල්ලන් මිය යැම අධ්‍යයනය.
4. කොල්ලකාරි හැසිරීම අධ්‍යයනය.
5. අපිරිසිදු චේන්ද්‍රකයන්
6. තත්ත්ව සූචිකය

ග්‍රැසිලේරියා ඉඩුලිස්(Gracilaria edulis ) පොකුණුවල වගා කිරීම.

අන්දයස් ඉස්සන් ගොවිපලේ පොකුණක, පොකුණු වගා අත්හදා බැලීම 1989 ජුනි මස ආරම්භ කරන ලදී. දෙසතියකට වරක් ජල පරාමිති හා වැඩීමේ පරාමිති ලබා ගන්නා ලදී. මෙම ග්‍රැසිලේරියා වගාව වැඩීමේ කාර්යයට වයත්ගත ගණනාවක් හා පෙඳ බාධා පමුණුවන බැව් හෙළිවී ඇත.

4.3.8 රතු තිලාපියා ව්‍යාපෘතිය.

අත්හදා බැලීමේ දී මෙම රතු තිලාපියා තොග බෝ කිරීමේ කටයුතුවලින් රතු සහ කළු ජනිතයන් (offsprings) බිහිවී ඇත. මින් පිවත් වූ ප්‍රමාණය 40% කි. මෙම රතු තිලාපියා ඇඟිලිති පැටවුන් මඩ පොකුණුවල බහා වගා කිරීමට අත් හදා බලන ලදී.

15 ....

දැනට තිබෙන බෝ කිරීමට යෝග්‍ය තොග ඉතා අඩුය. හේතුව අවුරුදු ගණනාවකින් බෝ කිරීමේ කටයුතු කර නොතිබීමයි. බෝ කිරීමට යහපත් තොග හා යිලන්තයෙන් හෝ මලයාසියාවෙන් ගෙන්වා බෝ කිරීම් කොට වැඩි දියුණු කිරීම අවශ්‍යයයි යෝජනා කරනු ලබයි.

## 4.3.9 ජලාශ ධීවර කර්මාන්තය කළමනාකරණ ව්‍යාපෘතිය.

ඔරෙක්‍රොමිස් මොසැම්බිකස් (Orechromis messambicus ) හා ඕ.නිලෝටිකස් ( O.niloticus ) නම් ජීවීන්ගේ ප්‍රති නිශ්පාදන ජීව විද්‍යාව අධ්‍යයනය කොට මෙම මසුන් දෙවර්ගය කවුඩුල්ල, මින්නේරිය, පිඹුරත්තෑව හා මාදුරුඔය ජලාශවල දෙමුහුන් කිරීමට කටයුතු කරනු ලැබීය.
අධ්‍යනයෙන් පසු මෙම ජලාශවල උපරිම මට්ටමක ධීවර කර්මාන්ත ක්‍රමෝපායක් නිගමනය කිරීමට ප්‍රත්‍යක්ෂ මූලික ප්‍රවේශයක් අනුගමනය කරන ලදී.

## 4.3.10 ඉස්සන් රෝග නිධාන ව්‍යාපෘතිය:

ශ්‍රී ලංකාවේ ඉස්සන් වගා කිරීමේ කර්මාන්තයේ වැඩීම හා ඒ සම්බන්ධව රැක්කවීමේ මට්ටමේ දී හා වැඩීමේ මට්ටමේ දී මෑතක දී ඇතිවූ ගැටළු මත්ස්‍ය රෝග හා මැරී යාමත් නිසා ප්‍රථමයෙන්ම මැරීයාමේ හේතුව හඳුනා ගෙන වැඩීමේ අඩුවීමත් යන දෙකටම පිළියම් යොදවනු ලබන අතරම ජීවීන්ගේ සෞඛ්‍ය තත්ත්වය ද තවදුරටත් වර්ධනය කෙරෙනු ඇත.

අ. සෞඛ්‍යතත්ත්වයෙන් සිටින හා රෝගාතුරව සිටින ජලජ සත්ත්වයින්ගේ ක්ෂුද්‍ර ජීවී සංඛ්‍යානයන් නිගමනය කිරීම.

ආ. මසුන් වර්ගසැඳුම් ලත් ආකාරය හා අනු ජීවී වර්ග හඳුනා ගැනීම.

ඇ. සාමාන්‍ය කොට් ඉස්සාගේ තුනී පොතුවලින් තුනී පොතු පුස්තකාලය සංවර්ධනය කිරීම.

ඈ. තවාන් අවස්ථාවේ දී හා වැඩෙන අවස්ථාවේ දීම බෝවෙන රෝගවල පටක රෝග නිධානය නිගමනය කිරීම.

ඉ. වගා කරන ලද රෝගී බවට පත්වූ ඉස්සන් වර්ගවලින් රුධිර ඡාර ගෙන වල් ඉස්සන්ට රෝගය බෝ කිරීමේ ක්‍රියා වලිය.

මූලාරම්භයේ සිටම පැවතෙන ඒ ඒ වර්ගවල ජීවීන් හඳුනාගෙන සාමාන්‍ය රැක්කවීමේ ජලයෙහි ක්ෂුද්‍ර ජීවී බර(ක්‍රියාව I) පිළිබඳ දත්ත රැස්කරන ලදී.

16 .....

ඒ ඒ සත්ත්වයින්ගේ පවුල් මට්ටමේ සිට හඳුනා ගනිමින් මියගිය හා වල්බිහි සතුන්ගේ රුධිරජාර ක්ෂුද්‍ර ජීවී මට්ටම සමග සසඳා බලන ලදී.

5. <u>ජලජ අංශයට සලසන ලද සේවා සංවර්ධනය.</u>

1. රැකව කලපුව තත්ත්වය පිළිබඳව වාර්තාව.
2. ආසියා නු සංවර්ධන බැංකුවේ ණය ලබාගැනීමේ වැඩ පිළිවෙළ යෝජිත ඉස්සන් ගොවිපල සඳහා ලබා දී ඇති ආරච්චිකට්ටුව, හලාවත හා නාත්තන්ඩිය උප දිසාපති කොට්ඨාශවල ඇති ස්ථානවල යෝග්‍යතාවය පිළිබඳ වාර්තාව.
3. කල්පිටියට ඉස්සන් ගොවිපලක් සඳහා ලබා දී ඇති ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව ධීවර කටයුතු පිළිපඳ පාර්ලිමේන්තු අනු කාරක සභාවට ඉදිරිපත් කිරීම.
4. ජලජ වගාවන් සඳහා මුන්දල් කලපුවේ බලාපොරොත්තු තැබිය හැකි තත්වය පිළිබඳ වාර්තාව.
5. ඉස්සන් වර්ගවල මසුන් සඳහා විශේෂ සැලකිල්ලක් සහිතව ශ්‍රී ලංකාවේ වයඹ වෙරළ බඩ තීරුවෙහි ඉස්සන් වගාවට සුදුසු ප්‍රදේශ පිළිබඳ වාර්තාව. වයඹ පළාත් සභාවේ ධීවර අමාත්‍යාංශය වෙත වාර්තාවක් සපයන ලදී.
6. ශ්‍රී ලංකාවේ වයඹ වෙරළ බඩ ප්‍රදේශවල ඉස්සන් වර්ගවල මසුන් වගාව විශේෂ කොට ගත් ඉස්සන් ගොවිපල පිළිබඳව වාර්තාව.
7. වයඹ පළාතේ අනුමත ඉස්සන් වර්ග වගා ව්‍යාපෘතිවල ප්‍රගති අගැයීම පිළිබඳ වාර්තාව.
8. නාරා ආයතනයට ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම් වස් මීගමුවේ කඩොල්කැලේ වත්තෙහි ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම.
9. කහව, මුහවෙල වෙල්ලයායේ වගුරු ප්‍රදේශවල මසුන් හා ඉස්සන් වගා කිරීමේ හැකියාව පිළිබඳ සමීක්ෂණ වාර්තාව.
10. දකුණේ හඳුනාගත් ප්‍රදේශ විශේෂ කොටගත්, වගා පොකුරු පද්ධතියක් හා හඳුනාගෙන ඇති ගැටළු හා ඉස්සන් වගා ව්‍යාපෘති ගැන වාර්තාව.
11. ශ්‍රී ලංකා ඉස්සන්ගේ ආහාර පිළිබඳ යෝජිත වැඩ වාර්තාව.
12. කල්පිටියට ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ ඒකාබද්ධ ජලජ වගා සංවර්ධන සැලැස්ම වාර්තාව.

17 ....

13. ශ්‍රී ලංකාවේ ඉස්සන් ගොවිපල පවත්වාගෙනයාම සඳහා පුහුණු වැඩ සටහනේ තාක්ෂණික වාර්තාව.

14. ශ්‍රී ලංකාවේ ආදා ගොවිපල පවත්වාගෙන යාම පිළිබඳ බලාපොරොත්තු පිළිබඳ වාර්තාව. මිරිදිය ධීවර හා ජලජ වගා උපදේශක සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

15. "ඉස්සන් වගා ව්‍යාපෘති" පිළිබඳ අධ්‍යයනය කිරීමට පත් කරන ලද කමිටුවේ වාර්තාව.

16. ශ්‍රී ලංකාවේ කලපු හයක පැතිකඩ ආකෘති වාර්තා.

විදේශවල පැවැති ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා, අධ්‍යයන හා චාරිකා.

1. " ශ්‍රී ලංකාවේ ඉස්සන් වර්ග ගො විපල කර්මාන්තය පිළිබඳ වර්තමාන ගැටළු" එක්දින වැඩ මුළුව.

2. DFCC මගින් සංවිධානය කරන ලද ඉස්සන් වගාව පිළිබඳ සම්මන්ත්‍රණය.

3. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය විසින් සංවිධානය කරන ලද ඉස්සන් වගාව පිළිබඳ සම්මන්ත්‍රණය.

4. ඉන්දියාවේ හා එක්සත් ජනපදයේ ආටේමියා ව්‍යාපෘතිය – – ඇම්.ඇම්.කුරුප්පු මහත්මිය.

5. තායිලන්තයේ මුහුදු පැලැටි ව්‍යාපෘතිය –ඒ.ජයසූරිය මිය.

6. ජපානයේ ආසියානු ධීවර සමුළුව – ටී.බී.වත්තිනායක මයා

7. ජපානය – ඇම්.අමරසිංහ මහත්මිය.

8. ජේ.ඇම්.පී.කේ.ජයසිංහ මහතා එක්සත් රාජධානියේ පැළ ආචාර්ය උපාධි කොටසක් නිමවා, ශ්‍රී ලංකාවට පැමිණියේය.

පෙර අස්වනු තාක්ෂණික ආයතනය.

ප්‍රගති වාර්තාව - 1989 ජනවාරි සිට දෙසැම්බර් දක්වා.

1989 වර්ෂය තුල පෙර අස්වනු තාක්ෂණික ආයතනය විසින් කරන ලද වැඩ කටයුතු පිළිබඳ ප්‍රගති වාර්තා වක් මෙහි පහත දැක්වේ.:-

1. ශ්‍රී ලංකාවේ ගොඩට ගෙනෙන ලද මෘද්වංගියන් ගේ තත්ත්වය පිළිබඳ අධ්‍යයනය.

මේ පිළිබඳ අධ්‍යයනයන් කල්පිටිය, හලාවත හා මීගමුව දී කරන ලදී. ඉහත සඳහන් ස්ථානවලින් නියැදි ලබාගෙන නියැදිවල ක්ෂුද්‍ර ජීවී කොටස් තක්සේරු කිරීමට මසකට දෙවරක් බැගින් රසායනාගාර අධ්‍යනයන් කරන ලදී. කරන ලද අධ්‍යයන මත වාර්තා වක් සකස් කොට " ශ්‍රී ලංකාවේ මෘද්වංගියන් " යන මැයෙන් වාර්තා වක් සකස් කො ට ප්‍රංශයේ පැවැති වැඩ මුළුවකට ඉදිරිපත් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෘද්වංගියන්ගේ තත්ත්වය අධීක්ෂණය කිරීමේ වැඩ සටහනකට ශ්‍රී ලංකාව ද ඇතුලත් කර ගන්නලදී. එම වැඩ සටහනට මුදල් යොදවන්නේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයයි. මේ අංශයේ වැඩ කටයුතු කවදුරටත් කෙරිගෙනයන අතර ඉදිරියේ ප්‍රතිඵල අධ්‍යනයන් ද කිරීමට බලාපොරොත්තු වේ. මීට විවිධ සමාජ ආර්ථික කරුණු ද ඇතුලත් වේ.

2. මුහුදු පැ ලැටි කර්මාන්තය සමීක්ෂණය.

බෙංගාල බොක්ක ව්‍යාපෘතියේ සහයෝගය ද ඇතිව ශ්‍රී ලංකාවේ මුහුදු පැ ලැටි කර්මාන්තය පිළිබඳ සවිස්තරාත්මක අලෙවි අධ්‍යනයක් කරන ලදී. අදාල වාර්තාව කර්මාන්තයේ ඉතිහාසය, මුහුදු පැ ලැටි ගණයට අයත් නිශ්පාදන ආනයනය, අපනයන ප්‍රදේශයේ ශක්‍යතාව, ඒගාර් සහ හොඳ ඇසිඩ් පෙරා ගැනීම සඳහා වානිජ්‍ය/ අර්ධ වානිජ්‍ය මෙහෙයුම් වල ආර්ථික ශබ්‍යතාව ආදිය ආවරණය කෙරෙන ආකාරයට කරුණු සොයා බැලීම් වලින් යුක්තය. වාර්තාව සංවිධායකයින් වෙත ඉදිරිපත් කරන ලදී. මුහුදු පැලැටි අලෙවිය පිළිබඳ වාර්තාවක් සකසා සැප්තැම්බරයේ දී තායිලන්තයේ පැවැති වැඩ මුළුවකට ඉදිරිපත් කරනු ලැබීය. මුහුදු පැලැටි පෙරීමේ මහා නියාමක මෙහෙයුමක් 1990 වසරේදී දියත් කිරීමට අදහස් කෙරේ. ඒගාර් පෙරා ගැනීමට ගම් මට්ටමේ ව්‍යායාමයක් සඳහා තාක්ෂණික ශබ්‍යතාවයක් බෙන්ගාල බොක්ක ව්‍යාපෘතිය යටතේ 1990 වර්ෂයේ දී කිරීමට බලාපොරොත්තු වේ.

3. කුඩිස්සන්ගෙන් ඉවත ලන ද්‍රව්‍ය වැඩිදියුණුකොට ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ අධ්‍යයනය. ...

මෙම අධ්‍යනයෙන් කුඩිස්සන්ගෙන් ඉවත ලන ද්‍රව්‍ය වැඩි දියුණුකොට ප්‍රයෝජනයට ගැනීමට හැකියාව සොයා බැලේ. වාර්ෂිකව මෙ.ටොන් 1,000 -1500 වත් අතර ඉස්සන්ගෙන් ඉවත ලන ද්‍රව්‍ය අපතේ හරිනු ලැබේ.

ක්ෂේත්‍ර සමීක්ෂණයේ කොටසක් දැනටමත් අවසන් කොට තිබේ. කළිස්සන්ගේ ඉවත ලන ද්‍රව්‍ය වලින් සෑදූ මත්ස්‍යාහාර ආනයනය පිළිබඳ තොරතුරු රැස් කළ යුතුව ඇත. ව්‍යාපෘතියේ කිරීමට බලාපොරොත්තු වූ රසායනාගාර අධ්‍යනවල මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කෙරිණි. ඊට හේතුව සමහර උපකරණවලට ප්‍රධාන කොටස් ලබා ගැනීමට නොහැකි වීමයි. බෙන්ගාල බොක්ක ව්‍යාපෘතිය මගින් මුදල් යොදවන ලද මෙම ව්‍යාපෘතිය 1990 වසරේ දී අවසන් කිරීමට නියමිතය.

4. ජලජ වගා ඉස්සන්ගේ තත්ත්වය.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ජලජවගා ඉස්සන්ගේ නියම ක්ෂුද්‍රජීවී තත්ත්වය , මුහුදු ඉස්සන්ගේ තත්ත්වය හා සසඳා බලා සැකසුම් අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට හා ජලජ වගා ඉස්සන්ගේ නියම තත්ත්ව අවශ්‍යතාවන් හඳුනා ගැනීමත්ය. මෙහි වැඩ 1989 අගෝස්තු මස දී අවසාන කෙරුණ අතර වාර්තාවක් ද ඉදිරිපත් කරන ලදී.

5. මාළු ආතම් අධ්‍යනය කිරීම.

ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විවිධ කුඩා සාමුද්‍රීය මසුන් යොදා ගනිමින් මාළු ආතම් විශේෂයක් සාදා ගැනීම සඳහා අධ්‍යනයක් කරන ලදී. අත්හදා බැලීමට සාඩින් මසුන් යොදාගත් අතර එම මසුන් විවිධ ලවණතා සාන්ද්‍රණයන්ට භාජනය කරන ලදී.
ලවණ සාන්ද්‍රණය 20% පෙන්නුම් කළ අතර එහි ප්‍රතිඵලය අනුව වානිජමය නිශ්පාදනයක් සඳහා සුබ දායක ශක්‍යතාවයක ලකුණු හෙළි විය.

6. කළිස්සන්තුල අඩංගු බහුල ලෝහමය අගයන්.

හලාවත සිට කැළණිය මෝය කට දක්වා ප්‍රදේශවල කළිස්සන් ගේ බහුලව ඇති ලෝහමය අගයන් තක්සේරු කිරීමට අධ්‍යනයක් කරන ලදී. කැළණි මෝය කට අසලින් ලබා ගත් නියැඳිවල කර්මාන්ත ශාලාවලින් නිකුත් කරනු ලබන දැඩි ලෝහමය අපද්‍රව්‍යයන් ඇති බව පෙණින. රසදිය සඳහා නියැඳි විශ්ලේෂණය කරන ලදී. රසදිය ලෝහවල ඇති සාන්ද්‍රණය මසුන් ආනයනය කරන රටවල් බොහෝ ගණනක ටූනා ( කෙළවල්ලා ) හා කෝෂ කටු සහිත මසුන් ගේ තත්ත්ව පරීක්ෂා කිරීමට බෙහෙවින් ඉවහල් වන ද්‍රව්‍යයකි. ශ්‍රී ලංකාව විසින් අපනයනය කරනු ලබන නිශ්පාදනවල මෙම රසදිය අඩංගු ප්‍රමාණය උපරිම අනුමත මට්ටම් වලින් අඩු බව සොයාගෙන ඇත. එබැවින් මෙම අධ්‍යනයන් තවදුරටත් ව්‍යාප්ත කළහොත් ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන නිශ්පාදන එවැනි තද තත්ත්ව පරීක්ෂා කටයුතු වලින් තොරව යැවීමේ වරම අත්පත් කර ගැනීම පිණිස එම අධ්‍යයන මගින් තව තවත් දත්ත සහ තොරතුරු රැස්කරගනු හැකිවාට සැකයක් නැත.

.. 20 ...

7. **කර්මාන්තය සඳහා අත්හදා බැලීමේ සේවා සහ වෙනත් සේවා.**

අ. වර්ෂය තුලදී මුහුදු ආහාර නියැඳි 70 වකට කිට්ටු ප්‍රමාණයක් රසායනික හා ක්ෂුද්‍ර ජීවී විද්‍යාත්මක පරාමිති සඳහා විශ්ලේෂණය කරන ලදී. ඉස්සන් පොකිරිස්සන්, මත්ස්‍යාහාර, කෙලවල්ලා (ටූනා) සහ ටින්කළ මාළු ආදිය මීට ඇතුලත්ය.

ආ. ලංකා ධීවර සංස්ථාවට හා පෞද්ගලික අංශය සඳහා උපදෙස් සේවා මෙම වර්ෂය තුළ දී සපයන ලදී.

ඇ. නාරා ආයතනයේ නිලධාරීහු ඉස්සන් කම්හල්වල පරීක්ෂණ මෙහෙයුම් වලද නිරත වූහ.

ඈ. ජාතික කෘෂිකාර්මික ආහාර නිශ්පාදන ප්‍රමිති කමිටුවේ ද නාරා නිලධාරීන් සේවය කරන ලදී.

ඉ. ජංගම අමාත්‍යාංශ සේවාවල හා විවිධ අමාත්‍යාංශ වැඩ සටහන් වලට ද නිලධාරීහු සහභාගී වූහ.

ඊ. බෙදා හැරීම සඳහා තොරතුරු රැගත් පත්‍රිකා හා කුඩා පොත් පිංච් සකස් කරන ලදී.

8. **ප්‍රකාශණ හා වාර්තා.**

1. " ශ්‍රී ලංකාවේ මුහුදු පැලෑටි කරමාන්තය" බෙන්ගාල බොක්ක ව්‍යාපෘතියට ඉදිරිපත් කරන ලද්දකි.
2. " ශ්‍රී ලංකාවේ මුහුදු පැලෑටි අලෙවිය" තායිලන්තයේ පැවැති වැඩ මුළුවකට ඉදිරිපත් කරන ලද්දකි.
3. " ශ්‍රී ලංකාවේ මෑද්වංගියන් අලෙවිය" ප්‍රංශයේ පැවැති වැඩ මුළුවකට ඉදිරිපත් කරන ලද්දකි.
4. " සාධිත් මසුනුගෙන් සාදන ලද ආනමක ජෛව රසායනික ලක්ෂණයන්" පත්‍රිකා වක් සකසා පළ කිරීම සඳහා IFS වෙත ඉදිරිපත් කරන ලදී.

**පුහුණු හා අධ්‍යයන චාරිකා.**

ටී. එස්. ජී. ෆොන්සේකා මහතා පශ්චාත් උපාධි අධ්‍යනයකට එක්සත් රාජධානියට ගියේය.

එන්. වීතිවාසගම් මෙනෙවිය ප්‍රංශයේ පැවැති මෑද්වංගියන් පිළිබඳ පහසුකම් යන මැයෙන් වූ වැඩ මුළුවකට සහභාගී වූවාය.

ඉන්දියාවේ පැවැති "මසුන් වල තත්ත්වය " නම් වැඩමුළුවට සහභාගීවීමට මෑලා පෙරේරා මෙනෙවිය පිටත්ව ගියාය.

තායිලන්තයේ පැවැති මුහුදු පැලෑටි පිළිබඳ වැඩමුළුවට සහභාගීවීමට ආචාර්ය සුබසිංහ පිටත්කර හරින ලදී.

තායිලන්තයේ පුකට් හි පැවැති ධීවර කළමනාකරණය නම් වැඩ මුළුවට ආචාර්ය සුබසිංහ සහභාගී වීය.

සේවක මණ්ඩලය:

| | | |
|---|---|---|
| ආචාර්ය එස්. සුබසිංහ | - | අධ්‍යක්ෂ |
| එන්.විතිවාසගම් මෙනෙවිය | - | ගුවන් විදුලි නිලධාරිනී ? |
| මාලා පෙරේරා මෙනෙවිය | - | එම |
| ආචාර්ය වයි.කාමරත්න | - | එම |
| රසායනාගාර සහකාරවරුන් | 04 යි. | |
| රසායනාගාර සේවකයින් | 02 යි. | |
| කම්කරුවන් | 08 යි | |

- - -

ජාතික ජලමාන කාර්යාලයේ වාර්ෂික වාර්තාව
1989.

1. අරමුණු.

ශ්‍රී ලංකාවේ ජල ශාස්ත්‍රීය මිනුම් කටයුතු සහ සටහන් සැකැසීමත් ජාතික ජලමාන කාර්යාලය සතු මූලික වගකීමයි. ශ්‍රී ලංකාවේ සියළුම ජලශාස්ත්‍රීය දත්ත රැස්කිරීමේ යොමු ලක්ෂ්‍යය ද එයයි. මෙම කාර්යාලය නාරා අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකාවේ නාවුක හමුදාවත් මිනින්දෝරු දෙපාර්තමේන්තු වත් සමග ඒකාබද්ධව 1984 මාර්තු මස 13 වෙනි දින ආරම්භ කරන ලදි.මෙහි පාලන තන්ත්‍රය එම ආයතන වල පිරිස් වලින් සැදුම් ලත් එකකි.

ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයෙන්පිටත සීමාව දක්වා වූ ජාතික සමුද්‍ර තීරුවේ වෙරළෙන් ඔබ්බෙහි,අසල වෙරළෙහි,ඇතුලත වෙරළෙහි සහගොඩතර ජලාස්ථානවල විස්තරාත්මක ජල ශාස්ත්‍රීය සමීක්ෂණ,ජලතරණය සඳහා අවශ්‍ය සටහන් පත්‍ර සැකසීම හා සමීක්ෂණවලට අදාල වෙනත් ලියවිලි සම්පාදනය කිරීම ජාතික ජලමාන කාර්යාලයේ ප්‍රධාන අරමුණු වේ.

ජාතික ජලමාන කාර්යාලයේ ප්‍රධාන කාර්ය භාරයන් නම් පහත සඳහන් දෑ නිශ්පාදනය කිරීමයි.

අ. ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයෙන් පිටත සීමාව දක්වා වූ ජාතික ජල සීමාවන්ගේ ජල තරණ සටහන් පත්.
ආ. ජාතික ජලය පිළිබඳ උදම් චක්‍ර.
ඇ. ජාතික ජලයෙහි සම -උදම් සටහන්.
ඈ. ආලෝක ලේඛණය සැකසීම හා නිකුත් කිරීම.
ඉ. මුහුදු යන්නන්ට දැන්වීම් සැකසීම හා නිකුත් කිරීම.
ඊ. ඉහත සඳහන් ලියවිලි නොකඩවාම යාවත්කාලීන කිරීම.

2. <u>සේවක මණ්ඩලය.</u>

ජාතික ජලමාන කාර්යාලයේ 1989 වර්ෂයේ දී සේවයෙහි නියැලි සිටි පිරිස් විස්තර මෙසේය:-

| | |
|---|---|
| අ. ජා.ජ.කා. වැඩබලන ප්‍රධානියා | - ආචාර්ය ඩබ්ලිව්.එස්.වික්‍රමරත්න |
| ආ. ප්‍රධාන මිනින්දෝරු මංඩලය | - ඇස්.ඩබ්.ඇස්.වීරසිංහ මහතා<br>ඇස්.විතාන මහතා<br>ඇම්.ඒ.ආරියවංශ මහතා. |
| ඇ. ජල ශාස්ත්‍රීය මිනින්දෝරුවන් | - බී.එච්.බී.නිහාල් සිල්වා මහතා. |
| ඈ. ගොඩබිම මිනින්දෝරුවන් | - ඇල්.ජේ.ගුණසේකර මයා.<br>කේ.ඒ.පෙරේරා මහතා<br>ඇම්.වී.ආර්.සී.පී.<br>ආරියරත්න මහතා. |
| ඉ. මිනින්දෝරු වාර්තාකරුවන් | - ඩී.එස්.ඈර්.ඩබ්ලිව්.මැන්දිස් මයා.<br>ඒ.පී.තිලකරත්න මයා. |
| ඊ. සැලසුම්කරුවන් | - පී.බී.රත්නපාල මහතා.<br>ඩබ්.ඒ.විල්ප්‍රඩ් මයා. |
| උ. ලඝු ලේඛක/යතුරු ලියන්නා | - ජයන්ති රුද්‍රිගු මහත්මිය. |
| ඌ. සිතියම් ඇඳීමේ උපදේශක | - වෝල්ටර් ගුණරත්න මහතා. |
| එ. ජල ශාස්ත්‍රීය උපදේශක | - මයිකල් [illegible] මයා. |
| ඒ. ජල ශාස්ත්‍රීය විශේෂඥ | - යූ.බීල්කේ මෙනෙවිය. |

3. <u>සේවා ස්ථිර කිරීම්, උසස්වීම් ඇතුළුව සේවක පිරිස් වෙනස්වීම්, සහ සහ අධ්‍යනය කරන ලද පුහුණු පාඨමාලා.</u>

අ. ජා.ජ. කාර්යාලය ශක්තිමත් කිරීමෙහි ලා මෙම ව්‍යාපෘතියේ විශේෂඥ ජල ශාස්ත්‍රීය සේවාවක් සඳහා 8 මසක කාල සීමාවකට යූ.බීල්කේ මෙනෙවිය 1989 සැප්තැම්බර් මස 30 දින පැමිණියාය.

ආ. එස්.ඩබ්.වීරසිංහ, එම්.ඒ.ආරියවංශ, බී.එච්.බී.නිහාල් සිල්වා සහ ඩී.ටී.මෙන්දිස් යන මහත්වරු හැම්බර්ග් නුවර ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ ව්‍යවහාරික විද්‍යා ආයතනයේ පාඨමාලාවක් හැදෑරූහ.

ඇ. එස්.විතාන, එස්.ඩබ්.එස්.වීරසිංහ සහ එම්.ඒ.ආරියවංශ යන මහත්වරු දියතලාව මිනුම් සහ සිතියම් කිරීමේ ආයතනයේ උසස් මිනින්දෝරු තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාවක් හැදෑරූහ. (පුහුණු කාලය 1989 පෙබරවාරි.01 දින සිට 1989 මාර්තු 25 දක්වාය)

23 ....

1989 වර්ෂය තුළ කරන ලද වැඩ පිළිබඳ වාර්තාව.

4. ගොඩබිම ජල ශාස්ත්‍රීය මිනින්දෝරු කටයුතු.

අ. කොරල් සමීක්ෂණය හා ක්ෂීරපායි වැඩ සටහන සඳහා කොරල් ප්‍රදේශයේ ප්‍රමාණය නිගමනය කිරීමට උණවටුන සහ අවට පෙදෙස්වල කොරල්පර සමීක්ෂණය (89.01.12 සිට 89.01.27 දක්වා)

ආ. ම.කො.ආ.කො.වෙත ඉදිරිපත් කිරීමට සැලැස්මක් සැකසීමට සහ නාරා ආයතනයට පවරා ගැනීම සඳහා කඩොල්කැලේ ඉඩමක් මැනීමේ කටයුතු (89.01.08 සිට 89.01.13 දක්වා)

ඇ. සභාපතිතුමාගේ නියෝගයක් මත පුත්තලම්හි ඔබ්බෙහි ඉස්සන් වගාව පිළිබඳව මුන්දල් වැව සහ අවට පෙදෙස්වල ජල ශාස්ත්‍රීය සමීක්ෂණ.

ඈ. පුත්තලම් කලපුවේ සිට දැදුරු ඔය දක්වා හැමිල්ටන් ඇලේ ජල ශාස්ත්‍රීය සමීක්ෂණ ( 89.01.31 සිට 89.02.08 දක්වා)

ඉ. ධීවර අමාත්‍යාංශයේ ඉල්ලීමක් අනුව අවශ්‍ය ඉවත් කිරීමේ කටයුතු සඳහා ගල්පර පුපුරුවා හැරීමේ ජල ශාස්ත්‍රීය සමීක්ෂණ
( 89.03.01 සිට 89.06.08 දක්වා)

ඊ. සමුද්‍ර විද්‍යා අංශයේ කටයුතු සඳහා මීගමු කලපුවේ ජල ශාස්ත්‍රීය සමීක්ෂණ කටයුතු ( 89.03.17 සිට 89.06.08 දක්වා)

උ. ධීවර අමාත්‍යාංශය සඳහා වැඩ බිමක් ලබා ගැනීමට අදාළව වැලිගම ගොඩ බිම් සමීක්ෂණයක් ( 89.06.05)

ඌ. හැමිල්ටන් කැනලයේ ජල ප්‍රවාහ මිනුම් හා ගැඹුර පිරික්සුම් ජල ශාස්ත්‍රීය සමීක්ෂණය ( 89.08.07 සිට 89.08.10 දක්වා)

එ. සභාපති තුමාගේ නියෝගය මත කඩොල්කැලේ කොටසක ඉංජිනේරු සමීක්ෂණයක්
( 89.08.02 සිට 89.08.16 දක්වා)

ඒ. ශ්‍රී ලංකාවේ නාවුක හමුදාව සඳහා තංගල්ල ජල ශාස්ත්‍රීය සමීක්ෂණයක්
(89.10.25 සිට 89.10.27 දින දක්වා)

ඔ. මීගමු කලපුවේ යෝජිත සංවර්ධන වැඩ පිළිබඳ සැලසුම් සැකැසුම
(89.12.04 සිට 89.12.05 දින දක්වා)

5. ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය. වර්ෂය තුළ දී පහත සඳහන් ප්‍රගතිය ලබා ඇත.

අ. සැලසුම් සකස් කිරීම, උපකරණ හා වැහන ලබා ගැනීම සඳහා වූ මූලික වැඩ.
ආ. පරිගණක පරිහරණය හා පිළිවෙල නියම කිරීම පිළිබඳව ජල ශාස්ත්‍රීය මිනින්දෝරු වරුන් සඳහා වූ මූලික පුහුණුවක්.

24 ......

ඈ. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ද සහාය ඇතිව මීගමුව සිට කළුතර දක්වා ත්‍රිත්ව – ස්පොන්ඩර් ස්ථාන පිහිටුවීමට මූලික පරීක්ෂණ. පසුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ භූමිතික අංශය විසින් එම ස්ථාන පිහිටුවීම පිළිබඳව ක්ෂේත්‍ර වැඩ මෙහෙයවන ලදී.

ඈ. ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ හා නාරා සමුද්‍ර විද්‍යා අංශයේ නිලධාරීන් 5 දෙනෙකුට හැම්බර්ග් ව්‍යවහාරික විද්‍යා ආයතනයේ මූලික ජල ශාස්ත්‍රීය විද්‍යාව පිළිබඳ පුහුණුවක් ලබා දෙන ලදී.

ඉ. ජර්මානු ෆෙඩරල් සමූහාණ්ඩුවේ සිට ජල ශාස්ත්‍රීය සමීක්ෂණ උපකරණ හා පරි ගණක යන්ත්‍ර ලැබීම.

ඊ. කොළඹ වරාය අබියස ජල ශාස්ත්‍රීය සමීක්ෂණයක් 89 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී.

6. විවිධ වැඩකටයුතු.

අ. <u>සමුද්‍ර විද්‍යාත්මක ඒකකය සඳහා ජලතරණීය සහයෝගය.</u>

" සමුද්‍ර නාරා" යාත්‍රාවේ මුහුදු චාරිකා අංක.24,25,26,27,28 හා 29 සඳහා ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ මිනින්දෝරුවන් විසින් සමුද්‍ර විද්‍යා අංශයට ජල තරණීය සහයෝගය ලබා දෙන ලදී.

ආ. ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා කල්පිටිය සිට කුදාමලෙයි දක්වා ජල තරණ වැතලයේ 1:1,000 පරිමාණයට සිතියම් සකස් කිරීම.

ඇ. සමුද්‍ර විද්‍යා අංශය සඳහා ශ්‍රී ලංකා වෙරළෙහි මුහුදු බිම්වල රූප ප්‍රතිතික සිතියම් සැකසීම.

ඈ. මුදවා ගැනීමේ මෙහෙයුම් වලදී භාවිතා කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය සඳහා ලෝහ රාමු සටහන් පත් නිෂ්පාදනය කිරීම.

ඉ. වර්ෂය තුළදී කරන ලද ඉහත සඳහන් කාර්යයන්ට අමතරව නාරා ආයතනයේ ඒ ඒ ඒකකවිසින් කරනු ලැබූ ඉල්ලීම් අනුව, සිතියම් සෑදීම, කටු සටහන් කිරීමද ඇතුළුව මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා වෙනත් සංස්ථා විසින් සමීක්ෂණ පිළිබඳව වරින් වර කරන ලද විමසීම් වලට ද මෙම කාර්යාලයේ සහයෝගය ලබා දෙන ලදී.

## පාරිසරික අධ්‍යයන අංශය.

### 1989 වාර්ෂික ප්‍රගති වාර්තාව.

1. **දේශීය නියෝජිතායතන හා සහයෝගිතාවකයන් කිරීමට භාර ගන්නා ලද ව්‍යාපෘති.**

1.1 **ම.කො.ආ.කො. පාරිසරික අධීක්ෂණ වැඩසටහන.**

1.1.1 **කාර්මික අපද්‍රව්‍ය අධීක්ෂණය.**

අ. **කටුනායක අපනයන නිෂ්පාදන කලාපය.**

කටුනායක අපනයන නිෂ්පාදන කලාපයට පරීක්ෂණ චාරිකා ගණනක් මෙහෙයවා නියැදි දෙසිය දෙකක් රැස්කොට විවිධ භෞත-රසායන පරාමිති සඳහා පරීක්ෂණ පවත්වන ලදී. මින් සමහර නියැදි ප්‍රසිද්ධ කසල නාශක ස්ථාන වෙත ගලා එනු ලබන කර්මාන්ත ශාලා අපද්‍රව්‍ය පිළිබඳව ම.කො.ආ.කො විසින් නියම කර තිබෙ... පිළිවෙලවලට අනුකූල නො වන බැව් පෙනී ගොස් ඇත. පාරිසරිකය අපවිත්‍රවීම වලක්වාලීම පිණිස ගතයුතු පියවර ආදිය පිළිබඳව ම.කො. ආ.කො. වෙත දන්වා යවා ඇත.

ආ. **බියගම අපනයන නිෂ්පාදන කලාපය.**

සමීක්ෂණ චාරිකා තිස් හයක් බියගම අපනයන නිෂ්පාදන කලාපයට ගොස් ඇති අතර නියැදි අසූ තුනක් රැස්කොට අවශ්‍ය විශ්ලේෂණ යන්ට භාජනය කරන ලදී. අවශ්‍ය නිර්දේශ සහිත වාර්තා ම.කො. ආ.කො. වෙත ඉදිරිපත් කොට ඇත.

ඇ. **අපනයන නිෂ්පාදන කලාපවලට පිටතින් එනම් ඒකල, ජාඇල, මීගමුව හා කඳාන යන ස්ථානවල පිහිටි කාර්මික ආයතනවලින් පිට කරනු ලබන අපද්‍රව්‍ය අධීක්ෂණය.**

කර්මාන්ත ශාලා හතරක් වෙත ගොස් ඒවායේ අපද්‍රව්‍ය නිකුත්කිරීම් සොයා බලන ලදී. එම ස්ථානවල අපද්‍රව්‍ය වලින් පරිසර දූෂණයට හානි වීම වැළැක්වීමට අවශ්‍ය පියවර හා උපදෙස් සහිත වාර්තා නිකුත් කරන ලදී.

1.1.2. **කටුනායක හා බියගම අපනයන නිෂ්පාදන කලාපවල පොදු කසල නාශක ප්‍රතිකර්ම යන්ත්‍ර සූත්‍ර අධීක්ෂණය කිරීම.**

කටුනායක හා බියගම අපනයන නිෂ්පාදන කලාපවල පිහිටුවා ඇති අපද්‍රව්‍ය නාශක යන්ත්‍රාගාර දෙකක අපද්‍රව්‍ය ඇතුළු හා පිටවන ස්ථාන සතිපතා පරීක්ෂාකොට නියැදි ද රැස්කරන ලදී. වර්ෂය තුලදී කටුනායක අපද්‍රව්‍ය ප්‍රතිකර්ම යන්ත්‍රාගාරයෙන් නියැදි 122 ක් ද බියගම අපද්‍රව්‍ය ප්‍රතිකර්ම යන්ත්‍රාගාරයෙන් නියැදි අනූ නවයක් ද විශ්ලේෂණය ලදී. ප්‍රතිඵල අනුව ගතයුතු පියවර, අදහස් හා නිර්දේශ අඩංගු වාර්තා ම.කො.ආ.කො. වෙත ඉදිරිපත් කරන ලදී.

**1.1.3 අපනයන නිෂ්පාදන කලාපවල අප ද්‍රව්‍ය පිටවන අවට ඇතිගොඩනර මතුපිට ජලය අධීක්ෂණය කිරීම.**

අ. **කැලණි ගඟ.**

තෝරාගත් ස්ථාන කිහිපයකින් නියැඳි රැස්කොට විශ්ලේෂණය කරන ලදී. මෙහි ප්‍රතිඵල වලින් හෙළිවී ඇති ආකාරයට ගඟේ ජලයෙහි රසායනික ගුණයන්, බීමට ගන්නා ජලය පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශිත උපදෙස්වලට එකඟවිය හැකි තත්ත්ව-යක පවතී. ගෘහස්ථ පාවිච්චියට ගැනීමට පෙර ජලය ප්‍රතිකර්මයකට භාජනය කොට ගැනීම මැනැවැයි එහි අඩංගු කොලිපෝම් බැක්ටීරියා ප්‍රමාණය අනුව කිවයුතුය.

ආ. **දඬුගම්ඔය.**

කටුනායක අපනයන නිෂ්පාදන කලාපයේ අපද්‍රව්‍ය ගලායනස්ථානවලට හා යාබදව ඉහලින් ගලායන ඇලි අසල ද දඬුගම් ඔයේ තෝරාගත් ස්ථාන කිහිපයක සමීක්ෂණ කටයුතු කරන ලදී. එහි පවතින ජලය පාලනය කළයුතු තත්ත්වයක තිබේදැයි නිගමනය කරනු වස් සමීක්ෂණය කරන ලදී.

**1.1.4 කටුනායක හා බියගම අපනයන නිෂ්පාදන වෙළඳකලාපවල බීමට ගන්නා ජලයෙහි තත්ත්වය හා ආරක්ෂාව පිළිබඳ අධීක්ෂණය කිරීම.**

ම.කො.ආ.කො මගින් අපනයන නිෂ්පාදන කලාපවලට සපයනුලබන බීමට ගන්නා ජලයෙහි රසායනික හා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂ-ණය කරන ලදී. ජලය බෙදාහැරීමේ පද්ධතියෙහි අවශිෂ්ඨ ක්ලෝරීන් මට්ටම් ද එම ස්ථානයන්හි දීම සොයා බලන ලදී. ඊට අමතරව ජලය පිරිසිදු කරන ස්ථානයෙන් ද නියැඳි ලබාගෙන, පිරිසිදු කිරීමේ පද්ධතියෙහි කාර්යක්ෂම භාවය නිගමනය කරනු වස්, විශ්ලේෂණයන්ට භාජනය කරන ලදී.

**නුවරඑළිය වැවේ පාරිසරික අධ්‍යයනය (තරේසා ආධාරයෙනි)**

මෙම අධ්‍යයනය ද මෙම වර්ෂයේ දී සිදුකෙරිණ. වැවට ඇතුළුවන ජලයෙහි අපවිත්‍ර කරණයන් නිගමනය කරමින් වැවට ගලායන දිය ඇල්ලේ ද වැවේ ජලය ද නියැඳි සමීක්ෂණ වලට භාජනය කරන ලදී. රැස්කළ ජල නියැඳිවල රසායනාගාර විශ්ලේෂණය කරන ලදී. එහි රසායනික වස්තූන් දහතුනක් ද බැක්ටීරියෝලොජිකල් පරාමිති දෙකක් ද ඇති බව නිගමනය විය. පොහොර භාවිතය හේතුවෙන් ජලය අපවිත්‍ර වීමට මුල්වී තිබෙන පොස්පේට්ස්, නයිට්‍රේට්ස්, නයිට්‍රයිට්ස්, ඇමෝනිකල් නයිට්‍රජන් වැනි දේ ජලයෙහි අඩංගුවීම නිසා බව නිගමනය කෙරිණ. ඓන්ද්‍රීක අපවිත්‍ර වීමේ මට්ටම් ද තක්සේරු කරනු ලැබීය.

2. **බෙලිහුල්ඔය සහ අවට පරිසරය අධ්‍යයනය.**

බෙලිහුල්ඔයට ඉහළ කැච්මන්ට් ප්‍රදේශවලින් මූලික දත්ත රැස්කිරීමක්-කරන ලදී.

.. 27 ...

මෙම ස්වාභාවික ජලාශයෙහි මිනිසා ඇති වී තිබෙන ජලවාහක නිගමනය කරන ලදී. මෙම ජලයෙහි ඇති රසායනික හා බැක්ටීරියෝලොජිකල් තත්ත්වය නිසා ට්‍රවුට් වැනි සංවේදී මසුන්ගේ වර්ධනයන්ටත්, වැඩීමටත් එම ජලය යෝග්‍ය බැව් සනාථවී ඇත.

3. <u>උපදෙස් සේවා.</u>

3.1 <u>ගම්පදම් කිරීමේ කර්මාන්තශාලාවේ අපද්‍රව්‍ය අධීක්ෂණය.</u>

අ. <u>සී.ස.ටැන් ලංකා.</u>

මෙම කම්හලතුළින් පිටවන අපද්‍රව්‍ය නිතිපතාම අධීක්ෂණය කරන ලදී. ප්‍රතිඵලහා අදහස් ද නිර්දේශ ද අඩංගු වාර්තාවක් සමාගම වෙත සහ ම.කො.ආ.කෝ. වෙත ද ඉදිරිපත් කරන ලදී.

4. <u>හදිසි අධ්‍යනයන්.</u>

4.1 <u>දැරණියගල රබර් කම්හලකින් පිටවෙන රබර් ආශ්‍රිත අපද්‍රව්‍ය හේතුවෙන් මතුවන පාරිසරික ගැටළු අධ්‍යයනය.</u>

ජලජවගා අංශයේද සහයෝගයෙන් මෙම අධ්‍යයනය කරන ලදී. ජලයෙහි පාරිසරික පරාමිති හා මියගිය මසුන් පිළිබඳ රෝග නිධානාත්මක කරුණුද අධ්‍යයනය කරන ලදී. මේ ස්ථානයේ හදිසියේ ම මසුන් මියයාමට හේතුව මෙම වර්ෂයේ මුල් කාර්තුව තුළ දිවයිනේ වෙනත් ස්ථාන වල මෙන්ම මෙහිද එඩිසොන්ට්‍රික් නෙක්‍රොටික් සින්ඩ්‍රෝම් (Edizontic Necrotic Syndrome) නමැති රෝගය පැවතීමයි.

4.2 <u>මහවැලි ප්‍රදේශයෙහි ජලයෙහි තත්ත්වය හා මත්ස්‍ය රෝග අධ්‍යයනය.</u>

<u>කොත්මලේ, වික්ටෝරියා හා පොල්ගොල්ල:</u>

මෙම ස්ථාන පරීක්ෂාකොට පරීක්ෂණ වලට භාජනය කරන ලද අතර මූලික අධ්‍යයනද කරන ලදී. විශ්ලේෂිත දත්තවලින් හෙළිවන්නේ මසුන්ගේ රෝග සඳහා මේවායෙහි ජලය අපවිත්‍ර පරාමිතිවලින් යුක්ත නිසා ප්‍රවේසම් විය යුතු බවට සාධකයන්ය.

4.3 <u>සිංහරාජ අඩවිය අවට හා ජෛව විෂයයෙහි මසුන් මැරියාම.</u>

ජලජ වගා අංශය හා සහයෝගිතාවයෙන් මෙම අධ්‍යයනය මෙහෙයවන ලදී. මෙම ප්‍රදේශය වර්ෂා ජලයෙන් පෙහෙසත් අතර ජලමාර්ග වලින් ලබාගත් ජල නියැඳි අනුව ගොඩතර මසුන් බෝකිරීමටත්, වැඩීමටත් අනුමත සීමාවන්ට සරිලන පරිදි ජලසම්පතක් මෙහි ඇති බවත් හෙළිදරව් විය.

4.4. <u>බේරුවල සිල්ලියා වැව.</u>

ධීවර හා ජලජ සම්පත් පිළිබඳ ගරු ඇමතිතුමාගේ සහ බස්නාහිර පළාත් සභාවේ ගරු ධීවර ඇමතිතුමාගේ ද ඉල්ලීමක් අනුව බේරුවල ස්ල්ලියා වැව පිළිබඳ තත්ත්වය සොයා බැලීමට බහු-ශික්ෂණීය අධ්‍යයනයක් කරන ලදී. වැවේ නිශ්පාදන තත්ත්වයන් පුනරුත්ථාපනය කිරීමට අදාල ප්‍රතිකාරක නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

28.....

5. **ඉස්සන් ගොවිපලවල ජල තත්ත්වය පිළිබඳ අධ්‍යයනය.**

මාදම්පේ සිට බත්තලුඔය දක්වා වූ වෙරළ තීරයෙහි පිහිටුවා ඇති ප්‍රධාන ඉස්සන් ගොවිපලවල ජල තත්ත්වයන් අධ්‍යයනය කරා ලදී. මෙම අධ්‍යයන- යෙන් බලාපොරොත්තු වන්නේ මේ වායෙහි ජල තත්ත්වයන් ඉස්සන්ට වැළඳෙන රෝග අතරත් ඇති සම්බන්ධතාවයත් වටහා ගැනීමය.

6. **මීගමු කලපුව හා සම්බන්ධ ජල මාර්ග**

කලපුවේ හා එට සම්බන්ධ ජල මාර්ගවල ඇති අපද්‍රව්‍ය මට්ටම හා අප- ද්‍රව්‍යයන්ගේ මූලාශ්‍රයන් පිළිබඳව අධ්‍යයනයක් කරන ලදී.

7. **පාරිසරික විෂයප්‍රමාණකරණ කමිටුවලට අදාල කටයුතු.**

7.1 **ඒකල හම්පදම් කිරීමේ කර්මාන්ත ශාලා වක් පිහිටුවීමේ ව්‍යාපෘති යෝජනාව.**

ජලයෙහි තත්ත්වය විශේෂ කොටගත් පාරිසරික විභාගයක් මෙහෙයවන ලදී. අත්තනගල්ල ඔයට අපද්‍රව්‍ය ගලායාමට ඉඩ හැරීම සුදුසු වේ දැයි සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණකි.

ජලයෙහි අඩංගු රසායනික හා ජීව විද්‍යාත්මක තත්ත්වයන් වේගයෙන් පිරිහී යමින් පවතින බැව් ම.කො.ආ.කො වෙත හා ධීවර හා ජලජ සම්පත් ගරු ඇමතිතුමා වෙත දැනුම් දෙන ලදී.

7.2. පහත සඳහන් පාරිසරික විෂය ප්‍රමාණකරණ කමිටු වලට නාරා ආයතනය නියෝජනය කරනු ලැබුවේ ආචාර්ය පද්මිනි ද අල්විස්ය. ව්‍යාපෘති අනුමත කිරීමට පෙරාතුව පාරිසරික හානිය වැළැක්වීමට අවශ්‍ය ප්‍රතිකර්ම යෝජනා වලට ද ඇය දායක වූවාය.

7.2.1 බගවන්තලාව සංවර්ධන ව්‍යාපෘතිය.

7.2.2 අපනයන කිරීම සඳහා අවපාත රබර අත්වැස්ම නිෂ්පාදන කිරීමට කම්හලක්.

7.2.3 ජාඇල හැරිසන්ස් සහ ක්‍රොස්පිල්ඩ් සමාගම විසින් කෘෂි රසායනික සැකසීම් හා නැවත අසුරුම් කිරීමේ කම්හලක්.

7.2.4 කඳානේ සී.ස.පිත්ලේ කෙමිකල්ස් මගින් කෘෂි රසායනික ද්‍රව්‍ය නැවත ඇසුරුම් කිරීමේ කම්හලක්.

7.2.5 කටුනායක දිය කෙළි සංකීර්ණයක්

7.2.6 නිරීක්ෂණයන් සහ අදහස් සංවර්ධිතයා වෙත යවන ලදී. පෑලියගොඩ, වෙදමුල්ල සහ මුදුන් ඇල ඒකාබද්ධව කසල අගල් හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය පිළිබඳ නිරීක්ෂණයන් හා අදහස් ම.කො.ආ.කො.වෙත ඉදිරිපත් කරන ලදී.

8. **බේරේවැව පුනරුත්ථාපනය කිරීමේ තාක්ෂණික කමිටුව.**

මෙම කමිටුවට නාරා ආයතනය නියෝජනය කරන්නේ ආචාර්ය පද්මිනි ද අල්විස්ය. 1985 වර්ෂයේ දී නාරා ආයතනය විසින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද යෝජනා වලින් බොහොමයක්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පිය- වර ගනු ලබන්නේ මෙම කමිටුව විසිනි.

බේරේවැ වට පොස්පේට් ඇතුල්වීම අඩුකිරීමට යෝග්‍ය ආකාරයේ තාක්ෂණික ක්‍රමයක් සංවර්ධනය කිරීම පිළිබඳව නියාමක ව්‍යාපෘතියක් සඳහා සැලැස්මක කෙටුම්පතක් මෙම කමිටුව වෙත ඉදිරිපත් කොට තිබිණ.

9. සම්මන්ත්‍රණ හා වැඩ මුළු.

9.1 දේශීය.

ප්‍රධාන පර්යේෂණ උපකරණ පිළිබඳව ජාතික කම්හලක්.

නාරා ආයතනයේ දැනට නොමැති සමහර උපකරණ පිළිබඳව හුරුවක් ඇතිකර ගැනීම සඳහා 1989 මැයි මස සිට 1989 ජූනි දක්වා මූලික අධ්‍යයන ආයතනය මගින් සංවිධානය කරන ලද වැඩ මුළු දෙකකට සහභාගීවීය.

9.2 විදේශීය.

9.2.1 08 වැනි ජාත්‍යන්තර සාගර ව්‍යවහරණ හමුව.

1989 ඔක්තෝබර් මස දී අන්තර් ජාතික මුහුදු සංවිධානය මගින් (අයි.එම්.ඕ) විසින් සංවිධානය කරනු ලැබූ යුගෝස්ලාවියාවේ පැවැති ඉහත සඳහන් හමුවට ආචාර්ය පද්මිනි ද අල්විස් සහභාගී වෙමින් සාමුද්‍රීය ව්‍යවහරණ ක්‍රියාවන් තක්සේරුකිරීමට හා ඉදිරි කාලයේ දී අධ්‍යයනය කිරීමට අදාල ස්වදේශ පත්‍රිකාවක් ද අනෙකුත් උපදේශාත්මක ආයකවීම් ද කරනු ලැබුවාය.

9.2.2 මෙසෝකොස්ම් (Mesocosm ) පිළිබඳ උසස් පුහුණු පාඨමාලාව.

1989 දෙසැම්බර් මස චීනයේ පැවැති ඉහත සඳහන් පුහුණු පාඨමාලාව හැදෑරීමේ වාසනාව එන්.එච්. දසනායක මහතාට හිමිවීය. මෙම පාඨමාලා කාලයේ දී මුහුදු අපවිත්‍රවීම යන මැයෙන් ස්වදේශ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

10. උපකරණ ටෙන්ඩරය අගැයීම.

ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක ක්ෂෙත්‍ර පරීක්ෂණ උපකරණ මිලයට ගැනීමට සංවර්ධිතලේකම් වරුන්ගෙන් අනුමැතිය ලබාගැනීම සඳහා අදාල ටෙන්ඩර් පත්‍රිකා අගැයීමත් උපලේඛණ ගත කිරීමත් සිදු කරන ලදී.

11. අනෙකුත් අංශ වෙත සැපයුණු සේවාවන්.

සමුද්‍ර විද්‍යා ඒකකයෙන් ලබාගත් මීගමුව කලපුවේ ජල නියැදි 648 ක් විශ්ලේෂණය කරන ලදී. මෙම සියලු නියැදි, සිලිකා, නයිට්‍රේට්, නයිට්‍රයිට් හා පොස්පේට්ස් සාන්ද්‍රයයන් සඳහා අධ්‍යයනය කරන ලදී. ආචාර්ය ශාන්ති වික්‍රමරත්නට එම ප්‍රතිඵල යවන ලදී.

12. <u>තාක්ෂණික පත්‍රිකා.</u>

" ශ්‍රී ලංකාවේ (බෙලිහුල්ඔය) මිනිස් බාධකයන් හේතුවෙන් ජලයේ තත්ත්වය වෙනස් වීම" යන මැයෙන් වූ පත්‍රිකාව "ජලය නරක් වීම හා ඉන් එහා" යන තේමාව යටතේ පැවැත්වුණ අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දී ඉදිරිපත් කිරීමට තෝරාගනු ලැබීය. එහෙත් මූල්‍ය ආධාර අපහසුකම් නිසා මෙම පත්‍රිකාව එම සම්මන්ත්‍රණයට ඉදිරිපත් කිරීමට කිසිවෙකුත් සහභාගි නොවීය.

13. <u>ව්‍යාප්ති වැඩ කටයුතු.</u>

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ මිරිදිය ධීවර අංශයෙන් ලැබුණු ජල නියැදි ඉල්ලුම්කරන ලද රසායනික පරාමිති බොහොමයක් සොයාබැලීමට අධ්‍යයනයකරන ලදී. මෙහි ප්‍රතිඵල මිරිදිය ධීවර අංශයේ සහකාර අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන ලදී.

14. <u>මූල්‍ය යෙදවීම්.</u>

14.1 <u>ම.කො.ආ.කො මිසමේ මුදල්.</u>

ම.කො.ආ.කොමිසම වෙනුවෙන් පාරිසරික අධීක්ෂණ කටයුතු වැඩසටහන සඳහා 1989 වසරේදී එම ආයතනයෙන් ලැබිය යුතු මුදල රු.619,000/- වශයෙන් ඇස්තමේන්තුකර ඇත. මෙයින් රු.350,000/- ක්ලැබී ඇති අතර ඉතිරිය ම.කො.ආ.කො. වෙතින් [illegible] ලැබීමට නියමිතය.

14.2 <u>තරේසා මුදල්.</u>

නුවර එළිය වැවේ පාරිසරික අධ්‍යයනය සඳහා, ස්වාභාවික සම්පත්බලය හා විද්‍යා අධිකාරිය විසින් එවනු ලැබූ මුදල රු.17092/= කි.

15. <u>සේවක මණ්ඩලය.</u>

පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකුගෙන් ද/සහකාර පර්යේෂණ වරුන් සිව් දෙනෙකුගෙන් ද කම්කරුවෙකු ගෙන් ද මෙම අංශයේ 1989 වසරේ කාර්ය මණ්ඩලය සමන්විත විය.

16. <u>බාධකයන්.</u>

<u>පාරිසරික අධ්‍යයන ඒකකයේ ක්‍රියා කටයුතු වෙත අහියම් ලෙස බල පෑ කරුණු මෙසේය.</u>

16.1. <u>උපකරණ හිඟකම.</u>

16.1.1 කෘමිනාශක අවශේෂයන් විශ්ලේෂණයට අවශ්‍ය ජී.ඇල්.සී.

16.1.2 බර ලෝහ ආදිය විශ්ලේෂණය සඳහා ඒ.ඒ.ඇස්.

16.1.3 ජලයෙහි මයික්‍රොබයලොජිකල් තත්ත්වය වහාම නිගමනය කර ගැනීමට අවශ්‍ය ක්ෂේත්‍ර මයික්‍රොබයලොජිකල් පරීක්ෂණ කට්ටලය

16.2 සේවක පිරිස් හිඟය.

1988 දී නාරා ආයතනයෙන් ඉවත්වී ගිය පර්යේෂණ නිලධාරීන් දෙදෙනා වෙනුවට අනුප්‍රාප්තිකයන් කිසිවකු බඳවාගෙන නොමැත. අංශවල කටයුතු නිසි පරිදි කරගෙන යාම සඳහා රසායනාගාර ඇටෙන්ඩන්ට් වරයෙක් ද සේවය සඳහා අත්‍යාවශ්‍යව ඇත.

අ.කළේ- ආචාර්ය පද්මිනී අල්විස්.

- 0 -

වාර්ෂික ප්‍රගති වාර්තාව.
1989 ජනවාරි - දෙසැම්බර්.

අංශය. - ගොඩතර ජලජ සම්පත්

ව්‍යාපෘතිය - ( ශ්‍රී ලංකාවේ) මෘද්වංගියන් වගාකිරීමේ ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය සඳහා සේවක මණ්ඩලය :

| | |
|---|---|
| ටී.බී.වන්නිනායක මහතා | - ව්‍යාපෘති ... |
| පාලිත කිත්සිරි මහතා | - පුහුණුවන පර්.නිලධාරී |
| උදය ප්‍රනාන්දු මහතා | - පර්යේෂණ සහකාර |
| ඩබ්ලිව්.ජී.ජයරත්න මහතා | - රසායනාගාර උප සේවක ) |
| පී.ඒ.එච්.කීර්තිරත්න | - රසායනාගාර උප සේවක ) |

පර්යේෂණ ප්‍රගතිය.

පුත්තලම් කලපුව.
එහි ඇති මසුන් වර්ග:

| | |
|---|---|
| කාවාටියා | - ( Crassotrea Madrasensis) |
| මට්ටියා | - (Marcia Opima) ( M.hiantina) |
| හැඹිලියා | - ( Gaffarium tumidum) |
| බෙල්ලෝ | - (Perma Perma) (නැවත වගාකළ) P.Viridis |

කාවාටියා.

කාවාටියන් පිළිබඳව කලා ඔයේ ස්ථාන තුනක අධීක්ෂණ කටයුතු මෙහෙයවන ලදී. පැටවුන් අධීක්ෂණය කිරීම සඳහා ස්ථාන තුනේම රාක්ක තනා තිබේ. සති දෙකකට වරක් බැගින් පහුරුවල කාවාටි පැටවුන් වැටීම සඳහා ඇස්බෙස්ටොස් පටි, ජනෙල් පියන්වල කාවාටි කටු,කාවාටිකටු,පොල්කටු,හිණු පිරියම් කළ/නොකළ උළු කැට යනාදිය තබා ඇත.

32 .....

ඒ ඒ රැස්කරණයන්හි කාවාටි පැටවුන්ගේ වැඩීම මසකට වරක් වාර්තාකොට තබනු ලබන අතර වල් කාවාටි තියැඳි තත්ත්ව සාධක නිගමන සඳහා රැස්කරන ලදී. වැඩිදුර අධ්‍යයනයන් සඳහා භෞතික රසායනික පරාමිති, සූප්ලැන්ක්ටන් හා ෆයිටෝප්ලැන්ක්ටන් තියැඳි රැස්කරන ලදී.
පුත්තලම් කලපුවේ සහ මොහොත්තුවරම් පී බම්බුවලින් සැදූ පඹුරු දෙකක් කාවාටි පැටවුන් නැවත පැල කිරීම සඳහා තනා ඇත.
මට්ටියන් සහ හැඞිලියන් යන දෙවර්ගයටම පුත්තලම් කලපු ප්‍රදේශය කුඩා කර්මාන්තයක් වුවත් පුළුල් වෙමින් පවතින ධීවර කර්මාන්තයකට හිමිකම් කියයි.

මෙහි ඇති මෘද්වංගියන් වර්ග:

1. මාර්සියා ඔපිමා ⎫
2. මාර්සියා හියන්ටිනා ⎭ මට්ටියන්
3. ගෆ්රේරියම් ටුම්ඩුම් — හැඞිලියන්

පහත සඳහන් අධ්‍යයනයන් සඳහා පුත්තලම් කලපුවේ උතුරු කොටසේ ස්ථාන දෙකක් තෝරා ගෙන ඇත.

1. ගහණතාවය අධ්‍යයනය සඳහා.
2. වැඩීම අධ්‍යයනය සඳහා.
3. කොල්ලකාරී හැසිරීම පිළිබඳ අධ්‍යයනය සඳහා
4. තත්ත්ව සූචිකයක් සඳහා අධ්‍යයනය.

පුත්තලම් හා කල්පිටිය ප්‍රදේශයේ මෙම මෘද්වංගියන් පිළිබඳ සමාජ ආර්ථික කරුණු සොයා බලන ලදී.

සංචාරකයින්ගේ ඉල්ලුම අගැයීම පිණිස බටහිර වෙරළාසන්නයේ ඇති සංචාරක හෝටල්වල මෙම මෘද්වංගියන් සම්පත පිළිබඳ අලෙවි සමීක්ෂණ වැඩසටහනක් ආරම්භ කරන ඇත.

<u>පුත්තලම් කලපුවේ නැවැත පැල කරන ලද බෙල්ලන්.</u>

පුත්තලම් කලපුවේ කොළපාට බෙල්ලන් සහ දුඹුරුපාට බෙල්ලන් නැවැත වගා කිරීමට මීටර් 8×5 ප්‍රමාණයේ පඹුරු තුනක් ඉදිරිකර ඇත.

1989 වසර තුළදී පහත සඳහන් කටයුතු නිම කරන ලදී:

1. බෙල්ලන්ගේ වැඩීම සඳහා පළතුරු කඩා, පොල්කටු හා ඇල්ගැස්බට තැබීම.
2. මේවායෙහි යට පැත්තේ බෙල්ලන් තැන්පත්වී සිටින ඝනත්වය අධ්‍යයනය.
3. මැරියාම අධ්‍යයනය.
4. කොල්ලකාරී හැසිරීම.
5. අපිරිසිදු චෛත්‍රිකයන්
6. තත්ත්ව සූචිකයක්

සුළු ප්‍රමාණයක කොළපාට බෙල්ලන් පැටවුන් ත්‍රිකුණාමලයෙන් ද දුඹුරු පාට බෙල්ලන් පැටව් මීගමුවෙන් ද ප්‍රවාහනය කරන ලදී. අදාල භෞතික රසායනික පරාමිති, සූප්ලැන්ක්ටන් හා ෆයිටෝප්ලැන්ක්ටන් ද අධ්‍යයන කාල සීමාව තුළ රැස්කරනු ලැබීය.

<u>ව්‍යාප්ති වැඩ:</u>

දුඹුරු බෙල්ලන් වගාව ව්‍යාපාරමය මට්ටමකින් පටන් ගැනීම පිණිස වයඹ පළාත් සභාව විසින් රු.104,000/- ක මුදලක් වෙන්කර ඇත. එබැවින් කල්පිටිය ප්‍රදේශයෙන් පවුල් පහක් මේ සඳහා තෝරාගෙන තාක්ෂණිය අත් උදව් හා වගා කිරීමේ ප්‍රදර්ශන උපදෙස් ප්‍රකාශණ ලබා දීමට සැලසුම් කර ඇත. මෙහි වගා කිරීමේ ක්‍රම පද්ධති මාද්වංගි වගා කිරීමේ ප්‍රදර්ශක ගොවිපලක් ලෙස ප්‍රයෝජනයට ගනු ඇත.

-o-

යාන්ත්‍රික ඉංජිනේරු විසින්
අධ්‍යක්ෂ ජනරාල් වෙත,

විෂයය - ප්‍රගති වාර්තාව 1989
දිනය - 1990.01.26

1. පොදු කාර්යය කටයුතු :

(අ) නඩත්තුව :

- ඉඩම් හා ගොඩනැගිලි
- යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ
- වාහන
- පර්යේෂණ යාත්‍රා
- කාර්යාල භාණ්ඩ හා සුවිකිරීම්
- දුරකථන හා ටෙලෙක්ස්
- ජලය, විදුලිය සැපයුම් හා බෙදාහැරීම්

(ආ) මිලයට ගැනීම් හා සැපයුම්

- කාර්යාල උපකරණ හා සවිකිරීම්
- අමතර කොටස්
- ගොඩනැගිලි ද්‍රව්‍ය
- වෙනත් යන්ත්‍ර සහ උපකරණ

(ඇ) ගොඩනැගිලි තැනීම් වැඩ

- පොකුණු සහ ටැංකි
- පවතින ගොඩනැගිලි ප්‍රවර්ධනය හා වෙනස් කිරීම්
- රසායනාගාර හා කාර්යාල කාමර

(ඈ) පැබ්‍රිකේෂන් වැඩ

- ක්ෂේත්‍ර ආධාරක
- කාර්යාල උපකරණ හා සවිකිරීම්
- පර්යේෂණ උපකරණ හා මෙවලම්.

(ඉ) පර්යේෂණ යාත්‍රා කළමනාකරණය

ඉ.1 ආර්.වී. " සමුද්‍ර මාරු"

මෙම යාත්‍රාවේ සියලු මෙහෙයුම් කටයුතු ගැන සොයාබලනු ලබන්නේ සේවා හා මෙහෙයුම් අංශය විසිනි.

මෙම අංශය විසින් ඉන්ධන, ස්නේහක තෙල්, නඩත්තු පිළිසකර හා නඩත්තු කිරීම් යනාදී එදිනෙදා අවශ්‍ය සේවාවන් සපයනු ලබයි. මෙම යාත්‍රාවේ වාර්ෂිත තටාකාංගන ගතකිරීම 1989 ජූනි/ජූලි මාස වලට යෙදී තිබිණ. ඒ පිළිබඳ ටෙන්ඩර් පත්‍ර අනුමත කරන ලද්දේ වුවත් මුදල් අග හිඟ කම් නිසා ටෙන්ඩරය භාර දීමට නොහැකි විය.
එසේ වුවත් ජීවිතාරක්ෂක යාත්‍රා වල සේවාවන් කටයුතු නිම කරන ලද අතර දුබල යාත්‍රා දෙකක් ඉවත්කොට අලුත් යාත්‍රා දෙකක් ඒ වෙනුවට යෙදවීමට අවශ්‍යව ඇත.
කප්පරතොට පිහිටි නාරා ආයතනයේ නව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය ශ්‍රීමත් ජනාධිපති තුමන් විසින් උත්සවාකාරයෙන් විවෘත කළ අවස්ථාවේ දී මෙම යාත්‍රාව ඊට සහභාගී වුවාය.

ඉ.2 <u>ආර්.වී " බලයා " II යාත්‍රාව.</u>

යාත්‍රාව මෙහෙයුම් තත්ත්වයට ගෙනෙන ලදී. කිසිම ව්‍යාපෘතියකට භාවිතයකට නොගත් නිසා මෙම යාත්‍රාව අලසව තිබේ. දැන් එය තටාකාංගනයේ වාර්ෂික අලුත්වැඩියා සඳහා සූදානමින් තබා ඇත. එම අලුත්වැඩියා කටයුතු මුදල් අහේණිය නිසා ප්‍රමාද කිරීමට සිදුවිය. කෙසේ හෝ එම යාත්‍රාවේ අලුත් වැඩියා කටයුතු 1990 වර්ෂයේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ.
කිසියම් ව්‍යාපෘතියකට මෙම "බලයා" II යාත්‍රාව යොදා ගැනීමට අදහස් කරන්නේ නම් එහි සේවයට අවශ්‍ය සේවක පිරිස් බඳවා ගත යුතුව ඇත.

ඉ.3 <u>වෙනත් යාත්‍රා.</u>

දැනට ත්‍රිකුණාමලයේ තිබෙන අතිකුත් යාත්‍රා මෙහෙයුම් තත්ත්වයක නොපවතී.

2. <u>ප්‍රධාන ව්‍යාපෘති.</u>

2.1 නාරා ආයතනයට අවශ්‍ය වැඩ කම්හල් පහසුකම් පිහිටුවීම් දැන් නිමවෙමින් පවතී. මෙම කටයුතු දැනට කරනු ලබන්නේ නාරා හි සේවක පිරිසි ඔවුන්ගේ අතිකුත් වැඩට අමතරව, ඔවුන්ම විසිනි. 1990 දී මෙම වැඩ කටයුතු වල නිමාවක් දකිනු ඇත.

2.2 නාරා ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ බිම් මහල වැඩි දියුණු කර ඇත. කෞතුකාගාරය පිළියෙල කිරීම, ටොන් 3 1/2 බෝට්ටුවක් එහිතුල තැන්පත් කිරීම ,ටෙරාසෝ බිම ඇතිරීම, කිරි ගරුඬ කවුන්ටරයේ වැඩ අවසන් කිරීම ආදිය මෙම වැඩි දියුණු කටයුතුවලට ඇතුලත්ය.

.. 36 ....

2.3 ශ්‍රී මත් ජනාධිපතිතුමා විසින් විවෘත කරන ලද පේපරතොට නාරා ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ අලුත්වැඩියා කටයුතු ඉතා කෙටි කලක දී නිම කිරීමට නාරා හි සේවා හා මෙහෙයුම් සේවක පිරිස සමත්වූහ. මෙහි වැඩ කටයුතු කෙරිගෙන යමින් තිබිය දී ඒවා අධීක්ෂණයට පැමිණි ධීවර හා ජලජ සම්පත් රාජ්‍ය ඇමතිතුමා මෙම කර්තව්‍ය බෙහෙවින් ප්‍රශංසාවට ලක් කෙළේය.

අ.ක - එස්.එල් සුරවීර
යාන්ත්‍රික ඉංජිනේරු.

- 0 -

## සමුද්‍ර විද්‍යා අංශය.
## 1989 වාර්ෂික වාර්තාව.

1. සේවක මණ්ඩලය.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල දී මෙම අංශයේ සේවක මණ්ඩලය පහත සඳහන් ආකාරයට සමන්විතව තිබිණ.

| | | |
|---|---|---|
| පර්යේෂණ නිලධාරීන් | 09 | (එක් නිලධාරියකු අචාර්ය උපාධිය හදාරමින් එක්සත් රාජධානියේසිටි. එස්/ජිබ්.වැඩබලන 1, තරේසා ව්‍යාපෘතියේ 1 පුහුණුවන අය 2 යි) |
| පර්යේෂණ සහකාර වරුන් | 03 | ( අනියම් 01) |
| රසායනාගාර සහකාර | 01 | |
| තියැඩි නිලධාරීන් | 01 | |
| කම්කරු | 01 | |
| යතුරු ලියන්නා | 01 | (අනියම්) |
| කිම්ද්‍රුම්කරු/චිත්‍ර ශිල්පී | 01 | (අනියම්) |

2. පර්යේෂණ කටයුතු.

වර්ෂය තු ලදී පහත සඳහන් වැඩ කටයුතු භාරගෙන තිබිණ:

2.1 ශ්‍රී ලංකාවේ මහාද්වීපික තීරුවේ සමීක්ෂණය. මෙය දීර්ඝ කාලීන වැඩ සටහනකි. කලින් නියමකර තිබුණු ආකාරයට ආර්.වී.සමුද්‍රමාරු යාත්‍රාව මුහුදු චාරිකා හතක් මුහුදු ගතවී දින 41 ක් මුහුදේ සමීක්ෂණ කරතලදී.

අ. එස්.එම්.24 දරණ මුහුදු චාරිකාව කොළඹ සිට වැලිගම දක්වා මණ්ඩි නියැඳි රැස්කරන ලදී. ඒ ශ්‍රී ලංකාවේ මහාද්වීපික තීරුවේ විශේෂ හා රසායනික අධ්‍යයනයක් සඳහාය. ජනවාරි 10 දින සිට 16 දින දක්වා මහාද්වීපික තීරුවේ නියැඳි 45 ක් රැස් කරන ලදී. මෙම සමීක්ෂණයේ දී මුහුදු ක්ෂීරපායී ඒකකයේ සමීක්ෂණ කණ්ඩායමක් ද මීට එක් වූහ. ඔවුන් විසින් සිටාසීන්ස් නම් මුහුදු සතුන් නිරීක්ෂණය කරන ලදී.

ආ. ශ්‍රී ලංකාවේ මහාද්වීපික තීරුවේ විශේෂ හා රසායනික අධ්‍යයනයක් සඳහා කොළඹ සිට මන්නාරම දක්වා ප්‍රදේශවල මණ්ඩි නියැඳි රැස්කිරීමේ මුහුදු චාරිකාවකි එස්.එම්.24. මෙම චාරිකාව ජනවාරි 25 වැනි දින සිට 28 දින දක්වා මහාද්වීපික තීරුවේ භාරාගත් නියැඳි 40 ක් රැස් කරන ලදී. මුහුදු ක්ෂීරපායී ඒකකයේ සමීක්ෂණ කණ්ඩායමක් ද මෙම චාරිකාවට සහභාගී වෙමින් ප්‍රදේශතුල සිටාසීන් සත්ත්වයින් පිළිබඳ අධ්‍යයනයක් කරන ලදී.

ඇ. එස්.එම්.26 දරණ මුහුදු චාරිකාව ශ්‍රී ලංකාවේ මහාද්වීපික තීරුවේ විශේෂ හා රසායනික අධ්‍යයනයක් සඳහා මණ්ඩි නියැඳි රැස්කිරීමෙහි යෙදෙනු ලැබුවේ කොළඹ සිට මඩකලපුව දක්වා වූ ප්‍රදේශයේය. මෙම චාරිකාව පෙබරවාරි 02 සිට පෙබරවාරි 8 වැනි දින දක්වා මුහුදේ ගතකොට මහාද්වීපික තීරුවෙහි භාරාගත් නියැඳි 30 ක් රැස්කරන ලදී. මෙම සමීක්ෂණ චාරිකාවේ දී මුහුදු ක්ෂීරපායී ඒකකයේ පර්යේෂණ කණ්ඩායමක් ද ඊට එක්වී මෙහි සිටාසීන්ස් ජීවීන් පිළිබඳ නිරීක්ෂණයක යෙදෙන ලදී.

ඈ. එස්.එම්.27 දරණ මුහුදු චාරිකාව කල්පිටිය සිට මන්නාරම දක්වා වූ ශ්‍රී ලංකාවේ මහාද්වීපික තීරුවෙහි තිරොර වැඩ සටහනක් යටතේ ක්‍රමවත් අධ්‍යයනයක යෙදින. මෙම චාරිකාව මගින් පෙබවාරි මස 21 දින සිට 25 දින දක්වා කාලය තුළ දිග කිලෝ මීටර් 650 ක ගැඹුරු මැනීම් කිරීම සහ භාරාගත් සහ අල්ලා ගත් නියැඳි 16 ක් රැස්කරන ලදී. මෙම චාරිකාවේ දී ඉරාන ජාතික භූවිද්‍යාඥයෙකුට ද වෙරළෙන් ඔබ්බෙහි හා භෞතික හා නියැඳිකරම පිළිබඳ පුහුණු පාඨමාලාවක් හැදෑරීමට ඉඩ සලසන ලදී.

ඉ. එස්.එම්.28 මුහුදු චාරිකාවේ දී හම්බන්තොට සිට ලිට්ල් බාසස් යන ප්‍රදේශයේ ශ්‍රී ලංකාවේ මහාද්වීපික තීරුවෙහි තිතොර වැඩසටහනක් යටතේ ක්‍රමවත් අධ්‍යයනයක යෙදෙමින් මාර්තු 30 සිට අප්‍රේල් 5 දින දක්වා දිග කිලෝ මීටර් 950 ක ගැඹුරු මැනීමේ කටයුතු කරන ලද අතර භාරාගත් නියැඳි 36 ක් ද රැස්කරන ලදී. මුහුදු ක්ෂීරපායී ඒකකයේ පර්යේෂණ කණ්ඩායමක් ද ඊට එක්වී සිටාසීන්ස් පිළිබඳ නිරීක්ෂණ යක යෙදෙන ලදී.

ඊ. එස්.එම්.29 මුහුදු චාරිකාව මඩකලපුව සිට මුලතිව් දක්වා ඇති මහාද්වීපික තීරුවේ විශේෂ භූ විද්‍යාත්මක අධ්‍යයනයක යෙදුනේය. මෙම චාරිකාව අප්‍රේල් මස 05 දින සිට 12 දින දක්වා හාරාගත් නියැදි 51 ක් රැස්කරන ලදී.මෙම චාරිකාවේ දී ද මුහුදු ක්ෂීර පායි ඒකකයේ නිරීක්ෂකයින් කණ්ඩායමක් ඊට එක්වී සිටාසිත්ස් නිරීක්ෂණයක යෙදෙන ලදී.

උ. එස්.එම්.30 මුහුදු චාරිකාව පානදුර සිට මහඔය දක්වා වූ මහාද්වීපික තීරුවෙහි සාගර සංසරණයට ඇතුළුව උෂ්ණත්වය/ලවණ හා බෑවුමක සහ මණ්ඩි ගති විද්‍යා පිළිබඳ ව අධ්‍යයනයක යෙදෙන ලදී. අගෝස්තු මස 01 දින සිට 04 වෙනි දින දක්වා පැවැති මෙම චාරිකාව ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුවේ ඔස්බර්ග් විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධය සමුද්‍ර විද්‍යාත්මක අධ්‍යයනයක් කරන ලදී. මේ සඳහා විශේෂයෙන් සාදන ලද ලවණතාවය, උෂ්ණත්වය, දියර ඔක්සිජන ආදිය සංවේදය කළහැකි ප්‍රවාහ මනුවක් උපයෝගී කොටගෙන සමුද්‍ර විද්‍යා මධ්‍යස්ථාන 18 ක දී පරාමිති මැන බැලීම් කරන ලදී. තව අතින් ගෙන යා හැකි විශේෂ එකෝ සවුන්ඩරයක ආධාරයෙන් උද්ගමන ප්‍රදේශ නිගමනය කරන ලදී.

2.2. මුනුදල් වැවේ හා එහි සිට පුත්තලම් කලපුව සම්බන්ධකෙරෙන ජල මාර්ගයේ ද මූලික පරීක්ෂණ ජනවාරි 30 දින සිට පෙබරවාරි 08 වෙනි දින දක්වා කරන ලදී. මෙම සමීක්ෂයේ දී මුන්දල් වැවේ භූ විද්‍යාව ජලමාන විද්‍යාව සහ බේති මෙට්‍රික අධ්‍යයනයක් ද කරන ලදී. තවද වඩදිය රිටි ස්ථාපනය කිරීමෙන් හා ස්ථානීය උස් ලබා ගැනීමෙන් කලපු දෙක සම්බන්ධ කෙරෙන ජල මාර්ගයේ ජලමාන විද්‍යාවද පරීක්ෂා කරන ලදී. නාරා ආයතනයේ ගොඩතර ජලජ සම්පත් අංශය හා එක්ව මේ පිළිබඳ වාර්තාවක් ද සම්පාදනය කරන ලදී.
මීගමු කලපුවේ සවිස්තරාත්මක බහු ශික්ෂණීය සමුද්‍ර විද්‍යාත්මක අධ්‍යයනයක් ද මෙහෙයවන ලදී. මෙම සමීක්ෂණය මාර්තුමාසයේ දී ආරම්භ කරන ලද අතර වර්ෂයකින් අවසන් කිරීමට නියමිතය. සමුද්‍ර විද්‍යාත්මක පරාමිතිවල වාරකාල හා දෛනික දෝලණය සහ අවකාශීය වෙනස් වීම් ද නිගමනය කරන ලදී. කලපුව හරහා ස්ථාන 20 ක කෝණාක්ෂ ලණු වල නියැඳි ස්ථාන පිහිටුවන ලදී. කලපුවේ සමජාතීය ආවරණය කෙරෙන පරිදි ස්ථාන 20 ක් තෝරා ගන්නා ලදී. සෑම සමීක්ෂණයක දීම කලපු කටෙහි වඩදිය රිටක් පිහිටුවා වඩදිය අඩු වැඩිවීම් නිතිපතා අධීක්ෂණය කරන ලදී. සතියකට දෙවරක් එනම් සෑම අඟහරුවාත් සිකුරාදාත් යන දිනවල හතරදෙනෙකුගෙන් සැදුම්ලත් කණ්ඩායමක් එම නියැඳි මධ්‍යස්ථානවලට චාරිකා කරන ලදී. 1989 වසර තුල ක්ෂේත්‍ර චාරිකා 79 ක් මෙහෙයවන ලදී.
ඒ ඒ නියැඳි ස්ථාන වල පහත සඳහන් පරාමිති සඳහා මිනුම් කරන ලදී:-
උෂ්ණත්වය, ආලෝක ප්‍රවේශය, පාරාන්ධතාවය, ප්‍රවාහය, ආකුලතාවය, ලවණතාවය හයිඩ්‍රජන් අයන් සාන්ද්‍රණය, අවලම්බිත ද්‍රව්‍ය, පෝෂකයන්, නීතලවාසී ප්ලෑන්ක්ටන් හා අවසාදිත ප්‍රමාණයන්.

මේ දක්වා පරාමිති 22160 ක් ඒ තැන්හිදීම මැන බලා තිබේ. අවල මිශ්‍ර ද්‍රව්‍ය තියැදි 800, පෝෂක තියැදි 800, පතුලේ ජීවීන් හා ප්ලැන්කටන් තියැදි 400 , මඩ්ඩි පිරික්සුම් තියැදි 200, හා පතුලේ අවසාදන තියැදි 40 ක් රැස්කරනු ලැබීය. පාරිසරික අධ්‍යයන ඒකකයේ දී ආචාර්ය පද්මිනි ද අල්විස් ගේ කාරුණික අනුග්‍රහයෙන් පෝෂකයින් විශ්ලේෂණය කරන ලදී. ජලජ සම්පත් ඒකකයේ ජනක ද සිල්වා මහතා විසින් නිතලවාසි විශ්ලේෂණය කරනු ලබයි. ප්ලැන්ක්ටන් තියැදි විශ්ලේෂණය කරනු ලබන්නේ ආචාර්ය පෝලීන් දයාරත්න විසිනි.
මීට අමතරව ජල තියැදිවල ඇති **Fe, Cu. Zn, Ni, Co, Mn**

**Hg** සහ **Pb** යන බරලෝහ වර්ග සහ පිරික්සුම් මඩ්ඩි ද අපගේ පර්යේෂණ නිලධාරීන් විසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දී විශ්ලේෂණය කරන ලදී.
මීගමු කලපුවේ ජල ශාස්ත්‍රිය සමීක්ෂණය ජාතික ජල ශාස්ත්‍රිය කාර්යාලය විසින් කරන ලදී. ප්‍රතිඵලවලින් අලුත් දත්ත රාශියක් ලැබී ඇති අතර අපවිත්‍රවීම, මඩ්ඩි බැසීමේ වේගය, බාදිය හා වඩදිය ගැලීම හා ජලයේ වේගය ආදිය පිළිබඳව කලින් දැන නොසිටි කරුණු දැන ගැනීමට හැකිවී ඇත.

2.4 හලාවත සිට මුන්දල් වැව දක්වා හැමිල්ටන් කැනලයේ මූලික පරීක්ෂණයන් ජුලි 17 දින සිට 22 දින දක්වා කාලය තුල අවසන් කරන ලදී. ඇල හුරහා තිබෙන කෝණක්ෂ ලණු 35 ක අතේ ගෙනයා හැකි එකෝ සවුන්ඩර් උපකරණ භාවිතාකොට ගැඹුර මැනීමේ කටයුතු කිරීමෙන් ඇල සමීක්ෂණය කරන ලදී. තවත් ස්ථානීය උස 250 ක් ද රැස්කොට ගැඹුර මැනීමේ ලණු කැනලයේ අක්ෂය දිගේ බඳිනු ලැබ ඇත. ස්ථාන 35 ක් දී ප්‍රවාහ මිනුම් ලබාගෙන ඇත. වඩදිය රිටි කැනලයේ කොන්වල සිටුවා ජලයෙහි අඩු වැඩි වීමේ තොරතුරු මැන බලන ලදී.

සිතියම් ආධාර කොට ගෙන ඇලට ජලය ඇතුළුවන ජලමාර්ග අවට ජලාධාර ප්‍රදේශවල ඉඩම් භාවිතය ගණන් බලා අධ්‍යයනයක්කරන ලදී. අසල ප්‍රදේශවල ඇති ඉස්සන් ගොවිපලවලින් පිටවෙන හා ගොවිපලවලට ඇතුළුවන ජලය පිළිබඳ අමතර දත්ත ද රැස්කරනු ලැබීය. ඇලෙහිජලය ගෙනයාමේ ධාරිතාව ගණන් බැලීමට පරිගණක වැඩසටහනක් ද සංවර්ධනය කරන ලදී. මෙහි ප්‍රතිඵල අනුව ඇලෙහි ජලය ගෙනයාමේ ධාරිතාව ජලය ගලායාම යන ක්‍රියා දෙකෙහිම සමාන තත්වයක් ඇති නිසා වැඩි වෙනසක් පෙන්නුම් නොකරයි. ඇලෙහි රොන්මඩ එකතුවී තිබීම ඊට හේතුවයි.

2.5 ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ එතමි වැලිගම සිට හලාවත දක්වා ඇති වෙරළ ගල්පර පිළිබඳ සමීක්ෂණයක් අප්‍රේල් 22 දින සිට 23 දින දක්වා කරනු ලැබීය. මෙම සමීක්ෂණය කල්පිටිය දක්වා දීර්ඝ කරන ලදී. ශ්‍රී ලංකාවේ වෙරළ ගල්පරවල මූලාරම්භය, පාෂාණ සංයුති විද්‍යාව හා වාතිජ විද්‍යාව පිළිබඳව ද පරීක්ෂණ කරන ලදී.

2.6 මුන්දල් වැව් ඉවුරෙන් ලබා ගත් බර ඛනිජ තිධි වල ආරම්භය පිළිබඳ සමීක්ෂණය මැයි 13 දින සිට 14 දින දක්වා පැවැත්විණ. ප්‍රතිඵලවලින් පෙනී යන්නේ මෙම බර ඛනිජ තිධිය සෘජු ඇත්තේ ප්‍රාථමික වශයෙන් ඛනිජ චුම්බකවලින් බවය. ප්‍රතිඵල පිළිබඳ පූර්ණ පත්‍රිකාවක් පිළියෙළ වෙමින් පවතී.

2.7 බේරුවල පිහිටි කුඩා ජලාශයක් වන සිල්ලියා වැවේ සමීක්ෂණයක් පාරිසරික අධ්‍යයන ඒකකයත් ජලවගා අංශයත් සමග ඒකාබද්ධව නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. වැවේ ජලය අපවිත්‍රවීම හා ගැඹුර මැනීමත් අධ්‍යයනය කරන ලදී. මේ පිළිබඳව වාර්තාවක් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

2.8 හම්බන්තොට දිස්ත්‍රික්කයේ වෙරළේ ඇතැයි කියන ලද ඛනිජ ද්‍රව්‍ය පිළිබඳ සමීක්ෂණයක් දෙසැම්බර් මස දී නිම කරන ලදී. එම නිධියෙහි පාෂාණ සංයුති විද්‍යාව සහ ප්‍රමාණය නිගමනය කරන ලදී. උස්සන්ගොඩ සමුව් ඇති සර්පන්ටනයිට් ස්ඛන්දය බැලීමට ගිය අතර එහිදී රැස්කරගත් නියැදි පරීක්ෂණවලට භාජනය කරන ලදී. මෙම ස්ඛන්දයෙහි මුදුනේ ඇති ආවරණය අනුව මෙහි යකඩ ඉල්ලමක් තිබේ යැයි අදහස් කෙරේ.

3. <u>වෙනත් ක්ෂේත්‍ර චාරිකා.</u>

වැලිගම කුඩා ධීවර කර්මාන්තයක් සඳහා හඳුන්වා දෙන ලද නව ධීවර ක්‍රමයක් හේතුකොටගෙන එහි ඇති වී තිබෙන අරගලයක් සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කිරීමට මෙම අංශයේ නිලධාරීහු නිරත වූහ. එම වාර්තාව පාර්ලිමේන්තු උපදේශක කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා වූවකි.

4. <u>වෙනත් කටයුතු</u>

4.1 වෙරළෙන් ඔබ්බෙහි ඛනිජ තිධි ගවේශනයක දී ඉරාන ජාතික භූ විද්‍යාඥයකු පුහුණුවක් ලබා දීමට මෙම අංශයේ නිලධාරීහු නිරත වූහ. මෙම භූ විද්‍යාඥයාට ප්‍රායෝගික මෙන්ම සෛද්ධාන්තිකව ද පුහුණුවීම් ලබා දෙන ලදී. මීගමු ක්ෂේත්‍ර චාරිකා දෙකකට ද සහභාගිවීමට ඔහුට ඉඩදුන් අතර එම්.වී. සමුද්‍රමාරු යාත්‍රාවේ මුහුදු චාරිකාවකට ද ඔහුට සහභාගිවීමට කටයුතු සලසන ලදී.

4.2 1990 වසරේ ශ්‍රී ලංකාවේ පවත්වන්නට යෝජිත ඉන්ධන රහිත ඛනිජ සම්පත් යන තේමාව යටතේ වූ පාඨමාලාවක් පිළිබඳ වැඩ පිළිවෙළ සකස් කිරීමෙහිලා මෙහි පැමිණි අයි.සී.ඕ.ඩී. නියෝජිතයෙකු සමග ද මෙම අංශයේ නිලධාරීහු සාකච්ඡා පැවැත් වූහ. මෙම සාකච්ඡාවන් අතර පාඨමාලාව පැවැත්වීම පිළියෙල කිරීම, පාඨමාලා ලියවිලි, දේශන හා ක්ෂේත්‍ර චාරිකා යන විෂයයන් මූලික කරුණු විය.

4.3 නෙදර්ලන්ත රජය මගින් ආධාර මුදල් ලබාදීමට යෝජිත ව්‍යාපෘති තුනක දියුණු තියුණු කිරීමේ කටයුතු ආචාර්ය වික්‍රමරත්නට පැවරී තිබිණ.

4.4. කරච්චිතුවර ජූලි මස 02 වෙනි දින සිට 08 වැනි දින දක්වා පැවැති මුහුදු අවකාශ තොරතුරු පද්ධතිය යන මැයෙන් වූ වැඩමුළුවකට ආචාර්ය රණතුංග සහභාගීවීය.

41....

4.5. ජූලි මස 17 දින සිට 21 දින දක්වා පැවැති අයි.ඕ.එම්.ඒ.සී. (අයොමැක්) 4 වැනි නිත්‍ය කමිටුවේ රැස්වීමට මෙම ඒකකයේ නිලධාරීහු සහභාගී වූහ.

5. <u>රසායනාගාර වැඩ.</u>

5.1 එස්එම් - 17, 18 සහ 19 දරණ මුහුදු චාරිකාවල පතුල අවසාදිත සිතියම් නිම කරන ලදී. කල්පිටිය සිට හම්බන්තොට ප්‍රදේශය ආවරණය වන සිතියම් පත්‍ර තුනක වැඩ නිම වෙමින් පවතී.

5.2 කැළණි ගඟෙන් රැස්කරන ලද බර ඛනිජ කොටස් වෙන් කිරීමේ නියැදි 55 ක වැඩ අවසන්ය. සෑම නියැදියක්ම කුඩා කොටස් හයකට බෙදා පසුව එම කොටස් නැවත ඛනිජමය කොටස් හයකට ආසන්න ප්‍රමාණයකට වෙන් කරන ලදී. අයිසෝ ඩයිනමික් සෙපරේටරයක් මගින් වෙන්කළ නොහැකිවූ කොටස් නැවත බයිනොකියුලර් මයික්‍රොස් කෝප් උපකරණයක් මගින් වෙන් කරන ලදී.

5.3 මුහුදු චාරිකා එම්.එම්.20, 21, 22, හා 23 පිළිබඳ රැස්කරන ලද නියැදි 176 ක් කුඩා කොටස් 6 කට බැගින් වෙන් කරන ලදී. පසුව ඒවා ඓන්ද්‍රිය ද්‍රව්‍ය සහ කාබොනේට් අඩංගුතාවය සඳහා විශ්ලේෂණය කරන ලදී.

5.4 මණ්ඩි නියැදි 675 ක් පිළියෙලකොට විශේෂ හා රසායනික අධ්‍යයනයන් සඳහා ඇසුරුම් කරන ලදී.

5.5 සමුද්‍රමාරු චාරිකාවේ දී සටහන් කළ සියළුම නියැදි ස්ථානයන්ම සිතියමේ 1: 500000 ට සටහන් කරන ලදී.

5.6 එස්.එම්. 19, 21, 22, 23, හා 28 දරණ මුහුදු චාරිකාවල ගැඹුරු මැනීම් එකෝ සවුන්ඩර් පටියේ සිට පොතකට වාර්තා කර තබන ලදී.

5.7 රොන්මඩ හා මැටි ස්වභාවයක් ඇති නිශ්පාදන විශ්ලේෂණය කිරීම සඳහා විධිශාස්ත්‍ර සංවර්ධනය කරනු ලැබීය.

5.8 මණ්ඩි නියැදි 176 ක් ඇට ප්‍රමාණයේ විශ්ලේෂණයන් සම්භාවිතා කඩදාසිවල සටහන් කරන ලද අතර සංඛ්‍යාලේඛ පරාමිති ද ගණනය කරන ලදී.

5.9 කැළණි ගඟේ නිම්නයේ හා විද්‍යාව, සංඛ්‍යාලේඛණ පරාමිති ද ඇතුලත්ව අඟලකට සැතපුමක් ප්‍රමාණයට සටහන් කරන ලදී.

- 0 -

## 1989 වාර්ෂික ප්‍රගති වාර්තාව.
## ඉංජිනේරු හා තාක්ෂණික අංශයේ ප්‍රධානියාගෙන්,
## අධ්‍යක්ෂ ජනරාල් වෙත.

1989 වර්ෂයේ විද්‍යාත්මක හා පර්යේෂණ වැඩසටහන අනුව අපගේ පර්යේෂණ වැඩකටයුතු ප්‍රධාන වශයෙන් සීමාවී තිබුණේ ටූනා (කෙලවල්ලා) සම්පත් සමීක්ෂණ ව්‍යාපෘතිය පිළිබඳ ව්‍යාප්ති කටයුතු හා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ සේවාවන් ඉටුකිරීමය.

1. දැනට සිටින සේවක මණ්ඩලය.

දැනට මෙම අංශයේ සේවක සංඛ්‍යාව 15 කි. (11 දෙනෙකු ස්ථිර අයවෙති)

- පර්යේෂණ නිලධාරීන්:
  - කේ.ටී.වීරසූරිය මහතා ( ශිෂ්‍යත්වයක් මත දැනට මහා බ්‍රිතාන්‍යයේය)
  - එස්.එල්.සුරවීර මහතා.

- පර්යේෂණ සහකාරවරුන්:
  - එස්.එස්.සී.පීරිස් මහතා
  - පී.එස්.ප්‍රනාන්දු මහතා
  - ඩබ්ලිව්.පී.සිරිසේන මහතා
  - එස්.ප්‍රනාන්දු මහතා

2. 1989 වර්ෂයේ ක්‍රියා කටයුතු.

1989 වර්ෂය තුල අංක.ටී.සීපී/එස්ආර්එල්/6653 දරණ "නෞකාවන්වා ස්වයං මුදල් යෙදවීමේ ව්‍යාපෘතිය" 1989 වර්ෂය තුල දී නොකඩවාම කරගෙන යනු ලැබීය. මෙම කාලය තුලදී මුහුදු පිරික්සුම් චාරිකා 28 ක් මෙහෙයවනු ලැබීය. මෙම මෙහෙයුමෙන් ලැබූ ආදායම රු.531,784/95 කි. වියදම රු.705,089/44 කි. ධීවර මෙහෙයුමේ අලාභයට හේතුව තෙමසක් පමණ කාලයක් යාත්‍රාව ක්‍රියාවිරහිතව තිබී මෙහෙයුම් කටයුතුවලට යොදා නොගත් බැවිනි. අලාභයට තවත් හේතුවක් නම් වාණිජ ධීවර මෙහෙයුමට අමතරව පරීක්ෂණ කටයුතුවලට යාත්‍රාව යෙදවීමට සිදුවීමය. වර්ෂය තුලදී මෙම යාත්‍රාව විකරණය කළයුතුබවට යෝජනාවක් ධීවරයින්ගේද සහභාගිත්වය ඇතිව, ධීවර හා ජලජ සම්පත් ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 1990 වර්ෂයේ දී නියමිත කටයුතුවලට යෙදවීම සඳහා මෙය විකරණය කිරීමට තීරණය කොට තිබේ.

3. සලසන ලද සේවාවන් හා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලද වාර්තා:

3.1 ධීවරආරවුල් පිළිබඳ වාර්තාව.

(අ) මාතර තොටමුනේ කුඩා පරිමාණයේ ධීවර කාර්මිකයන්ගේ යාත්‍රා සහ මාදැල් ධීවරයින් අතර ආරාවුල

ආ. වැලිගම කුඩා පරිමාණ ධීවර කාර්මිකයන්ගේ සහ ට්‍රෝලිං ලයින් ධීවරයින්ට එරෙහිව මා දැල් ධීවර කාර්මිකයින්ගේ ආරවුල

ඇ. කල්පිටියේ කුඩා පරිමාණ ධීවර කාර්මිකයින්ට එරෙහිව ට්‍රෝලිං ධීවර කාර්මිකයින් අතර අරගලය.

3.2. ව්‍යාපෘති යෝජනා.

අ. කුඹිස්සන් වර්ගයේ මසුන් සඳහා උපතිතල මත්ස්‍යබිම් හා ශ්‍රී ලංකාවේ පෘතුගාල් වරාය ප්‍රදේශයේ මසුන් කර්මාන්තය හඳුනා ගැනීම.

ආ. ශ්‍රී ලංකාවේ බටහිර හා දකුණු ප්‍රදේශවල අඩු වියදම් ධීවර ඒකරාශී ක්‍රමයක් ව්‍යාප්ත කිරීම.

ඇ. ශ්‍රී ලංකාවේ ඇති ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න ලුත්වෙත්තරි ගත කිරීම.

3.3 වාර්තා.

අ. වයඹ වෙරළ ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ යාත්‍රා වැඩි දියුණු කිරීම.

ආ. ජලාශ ධීවර කර්මාන්තයේ ආම්පන්න තාක්ෂණය පිළිබඳ වාර්තාව.

ඇ. වෙරළින් ඔබ්බෙහි බහුදින ධීවර බෝට්ටු.

4. අංශයවිසින් මුහුණ පාන ලද බාධක.

දැනට තාරා ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරු වශයෙන් පූර්ණකාල තනතුරක් දරණ සුරවීර මහතා අංශ ප්‍රධානියා වශයෙන් පර්යේෂණ වැඩකටයුතුවලට ද නියුතු වෙයි. එබැවින් මෙම අංශයට පර්යේෂණ නිලධාරියෙකු බඳවා ගැනීම කළයුතුවේ යැයි අවධාරණයෙන් නිර්දේශ කෙරේ.

ධීවර ආම්පන්න පිළිබඳ ඵලදායක පර්යේෂණ වැඩකටයුතු කරගෙන යාමට මුදල් යෙදවීමත් ප්‍රමාණවත් නොවේ. තවද අධ්‍යයන කටයුතු වලට ප්‍රමාණවත් මුදලක් ද පර්යේෂණ-යාත්‍රාවක් ද අවශ්‍ය බැව් සඳහන් කරමි.

අ/කළේ.

එස්.එල්.සුරවීර.

44 ...

## 1989 වාර්ෂික වාර්තාව - ව්‍යාප්ති අංශය

සමාලෝචනයට භාජනය වන වසර තුළ මෙම ව්‍යාප්ති අංශය විසින් "සංස්කරණ මැදිරියක්" සකස් කරන ලදි. මේ සඳහා වෘත්තීය, ශව්‍ය මිශ්‍රකය, විශේෂ බහුකරණ ජෙනරේටරය, අධීක්ෂකය, අතේ ගෙන යා හැකි යූ-මැටික් රෙකෝඩරය, විදේශ ණය ආධාර යටතේ ලැබුණු උසස් වර්ගයේ කැමරාව, වීඑච්එස් කැමරා රෙකෝඩරය, කුලියට ගත් වීඩියෝ කැසට් රෙකෝඩරය, "ඩෙස්ටිනේෂන්" කටයුතු සඳහා පාවිච්චි කිරීමට පරණ වීඑච්එස් ඩෙක් යන්ත්‍රය යන උපකරණ සහිතව විශේෂයෙන් නිවෙස්තුළ වාර්තා කළ හැකි අන්දමේ වාර්තා වැඩසටහන් වාර්තා කිරීම ආරම්භ කරන ලදි. අනෙකුත් උපකරණවලට සරිලනසේ වෘත්තීය සංස්කරණ යන්ත්‍ර ලබාගන්නා තෙක් ඉහත කී උපකරණ දැනට වීඑච්එස් රූපික තත්වයක පවත්වාගෙන යනු ලැබේ. වීඩියෝ චිත්‍රපටි කරණයට රූප සටහන් අවශ්‍යත් සපුරාලීමටත්, අත් පත්‍රිකා නිශ්පාදනය කිරීමටත්, මුද්‍රිත ප්‍රකාශණ හා පෝස්ටර් ද පොදු මහජනතාව දැනුවත් කිරීමේ වැඩ ආදිය සඳහා සුචිත්‍ර හා චිත්‍රකර්ම නිශ්පාදන ද ආරම්භ කරන ලදි. මෙම කාර්යයන් සඳහා සමුද්‍ර විද්‍යා අංශයෙන් චිත්‍ර ශිල්පී/කිමිදුම් කරුවෙකු ණය පදනමක් මත සපයා දෙනු ලැබීය. රටතුල පැවැති අසහනකාරී තත්ත්වය හා ජනමාධ්‍ය ආයතනවල පැවැති විශාල වෙනස් වීම් නිසා රජයේ ඒජන්සි ආයතනවල ක්‍රියා කටයුතු පිළිබඳව වාර්තා කිරීම්වල සීමාවන් තිබිය දීත් නාරා ආයතනයේ සමහර වැඩ කටයුතුවලට ජාතික රූප වාහිනිය මගින් ප්‍රචාරයක් ලබා දීමට ව්‍යාප්ති අංශය සමත්වීය. ජාතික රූපවාහිනී සේවය ඔස්සේ පහත සඳහන් විකාශනය කරනු ලැබීය:-

- " ද ස්කයිස් ද ලිමිට් " ( ඉන්දියානු සාගරය භාවිතයට උසස් දුරස්ථ සංවේදය" යන මැයෙන් විනාඩි 15 ක ටෙලි වෘතාන්තයක්
- දිනපොතෙන්/ ඩේට්ලයින් - සිංහල හා ඉංග්‍රිසි මාධ්‍යයෙන් මසුන් පිටරට යැවීම පිළිබඳව " සුරතල් මසුන් අපනයනය කිරීම" යන හිසින් විනාඩි 20 ක රූපවාහිනී ටෙලි වෘතාන්තයක්
- ප්‍රවෘත්ති පිළිබඳව. - කරච්චිනුවර පැවැති අයිඕඑම්ඒසී ( IOMAC ) අවකාශීය සම්මන්ත්‍රණයට නාරා ආයතනය සහභාගී වීය.
  - සුරතලයට ඇතිකරන මසුන් බෝකිරීම මසුන් සකස් කිරීම පිළිබඳව වෙරළබඩ ධීවර කාන්තාවන්ට ස්වයං රැකියා අවබෝධයක් ලබාදීම්වස් ආධාර කිරීම.
  - ජාතික මුහුදු ක්ෂීරපායී වැඩසටහන පුද්ගලයින් හඳුනා ගැනීම
  
    ප්‍රදර්ශකස්ථාන වල තැබීමට ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට සපයාගනු ලැබූ තල්මසෙකුගේ පූර්ණ ජීව බීජයක ආදර්ශකයක්.

"ඉන්ටර් නැෂනල් ටෙලිවිෂන් නෙට්වර්ක්" ඔස්සේ පහත සඳහන් ටෙලිවෘතාන්ත විකාශනය කරනු ලැබීය.:-

විස්තිවුස් අයිතමය " සුරතල් මසුන් අල්ලා ගැනීම සහ කොරල්පරවලට හානි පැමිණවීම"

කොළඹ පැවැති තුන්වෙනි අයිඕඑම්ඒසී (IOMAC) ස්ථාවර කමිටුවේ නියෝජිතයින්ගේ සමුළුවෙහි දුරස්ථ සංවේදීය සාකච්ඡා අතරතුර " ද ස්කයිස් ද ලිමිට් " යන ටෙලි චිත්‍රපටය විකාශය කරනු ලැබීය.

ව්‍යාප්ති ඒකකය විසින් වීඑච්එස් ප්‍රමාණයේ වීඩියෝ ගත කරන ලද "ටූනා / පිෂිං ඉන් ට්‍රබල්ඩ් වෝටර්ස්" නම් විනාඩි 15 ක විශේෂ ටෙලි වෘතාන්තයක් වැලිගම වෙරළබඩ ප්‍රදේශයක ඇතිවූ ධීවරයින්ගේ ආරාවුලක් සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීම් වස් එළි දක්වන ලදී. මෙම ටෙලි චිත්‍රපටය පාර්ලිමේන්තු මන්දිරයේ දී, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ සාමාජිකයින්ට පෙන්වන ලදී. ඒ නාරා ආයතනය විසින් කළමනාකරණ ව්‍යාපාර හඳුන්වා දීම පිණිස ඉදිරිපත්කරනු ලැබූ ආරාවුලේ කරුණු වටහා ගැනීම සඳහාය. තවද "ලොබ්ස්ටර්ස් ඉන් පෙරිල්" හා සී වීඩ්ස් ස්ටෝරි" යන ටෙලි වෘතාන්ත දෙක ද නිපදවා නාරා ආයතනයට පැමිණි පාර්ලිමේන්තු නියෝජිත පිරිසට පෙන්වන ලදී.

තවද නාරා ආයතනයේ සංවිධානය කර තිබුණු මත්ස්‍යාගාර හිමියන් හා මසුන් ඇලුම් කරන්නන් සඳහා වූ පුහුණු පාඨමාලාවක් සඳහා සුරතල් මසුන් පිළිබඳ දෘෂ්‍ය පට පෙන්වන ලදී.

නාරා ආයතනය පිළිබඳ එක් පැයක සංහල වෘතාන්ත චිත්‍රපටයක වැඩ අරඹන ලද අතර ළඟදීම එය අවසන් කිරීමට නියමිතය. තවත් තෙත් ඉඩම් සම්බන්ධව සකස් කරන ලද දෘෂ්‍ය පටයක් නාරා ආයතනයට පැමිණි නෙදර්ලන්ත තානාපතිවරයෙකුට පෙන්වන ලදී.

මෙම වකවානුව තුළ පැවැති වාතාවරණය අනුව ගමන් බිමන් සඳහා තිබුණු අසීරුකම් අතර ඉදිරිකාලයේ දී ප්‍රයෝජනයට ගැනීම සඳහා වීඩියෝ චිත්‍ර ගත කිරීම් ගණනාවක් ද ඡායාරූප සෑහෙන ප්‍රමාණයක් ද නිශ්පාදනය කරන ලදී. මේ අතර:-

1. දඬුගම් ඔයේ සංචාරකයින් සඳහා බෝට්ටු යොදාගැනීමේ සම්භාව්‍යතාවය.
2. පුත්තලමේ තුවාල සහිත ඩොල්ෆින් මත්ස්‍යයකු බේරාගැනීමේ ප්‍රයත්නය
3. පලාවිහි තෙත් කලාපයේ කුරුළු ජීවිතය.
4. ඒ තලාහි නාරා ආයතනයේ මුහුදු පැළෑටි වගාව ව්‍යාපෘතිය.
5. පලාවිහි නාරා ආයතනය විසින් කරදිය කූනිස්සන් නිශ්පාදනය කිරීම.
6. මෝදර පොකිරිස්සන් අල්ලා ගැනීම.
7. උතුරු කොළඹ ජල ගැලීම.
8. මීගමුවට ගසා ගෙන ආ තල්මසා - තල්මස් ගලවා ගැනීම.
9. කප්පරතොට ප්‍රාදේශිය පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම
10.
11. තොඩුවාවෙන් තල්මසෙකුගේ ඇටසැකිල්ලක් සහ නිදර්ශකයන් සොයා ගැනීම.
12. කොළඹ වරාය ආසන්නයේ විවෘත ජලයෙහි විනෝදයට මසුන් ඇල්ලීම.
13. අකුරල කොරල්පර කැඩීම හා මැරීම;
14. ගාල්ලේ මුහුදු ජීවතුන් හා මුතු බෙල්ලන් වගාව.
15. වැල්ලවත්ත ගල්පර තුලින් සුරතල් මසුන් අල්ලා ගැනීම.

<u>නිවෙස්තුල වාර්තා කිරීම්.</u>

16. සුරතල් මසුන් ඒකකය හා මාලු ටැංකි.

17. මත්ස්‍යාගාර සහ ඇතිකිරීමේ ක්‍රම යත මැ. යන් කුරුප්පු මහත්මියගේ සහ ශ්‍රේරෝ මහතාගේ දේශන හා ප්‍රදර්ශකයන්.

18. මසුන්ගේ රෝග විස්තර කිරීම ( ඒමේෂ්)

19. විජයානන්ද මහතාගේ ගැඹුරු මුහුදේ අගල් පිළිබඳ පශ්චාත් මුහුදු චාරිකා ප්‍රදානය හා ටෙක්ටොනික්ස්

20. කළුතර කාන්තා කණ්ඩායමේ පැමිණීම.

21. මාළු ගැලවීම පිළිබඳ ප්‍රදර්ශකය.

22. අව්වේ මසුන් වේලාගැනීම පිළිබඳ ප්‍රදර්ශකය.

23. ඉන්දියන් සාගරය භාවිතා කිරීම පිළිබඳ අවකාශීය යොදාගැනීම් – ජසෙන්තුලියා මහතා සමග සම්මුඛ සාකච්ඡාවකි.

24. මහවැලි පෙදි පිළිබඳ චන්ද්‍රිකා ඡායාරූප.

25. ශ්‍රී ලංකාව ආශ්‍රිත මුහුදු නීතිය පිළිබඳව කුමාරිච්චිට්ටි මහතා සමග සම්මුඛ සාකච්ඡාව.

26. මුහුදු හදිසි සැලසුම් කිරීම් පිළිබඳව සීබෙල්( Seabell ) විශේෂඥයින් සමග සම්මුඛ සාකච්ඡාව.

27. ධීවර ඇමති ගරු ජෝෂප් මයිකල් පෙරේරා මැතිතුමා නාරා ආයතනයට පැමිණීම.

28. ධීවර රාජ්‍ය ඇමති ගරු. පී.එස්.එල්. ගලප්පත්ති මැතිතුමා නාරා ආයතනයට පැමිණීම.

29. ඉස්සන් වගා කරන්නන් විසින් මුහුණපාන ගැටළු පිළිබඳ බාහිර විශේෂඥයෙකු වූ ආචාර්ය. එස්.ඕල්සන් සමග සම්මුඛ සාකච්ඡාවක්.

30. සුරතල් මසුන් අපනයන ව්‍යාපාරයේ තත්ත්වය හා කොරල්පර සංරක්ෂණය පිළිබඳව අර්ජන් රාජසූරිය සමග සම්මුඛ සාකච්ඡාවක්.

වර්ෂයතුල දී මුහුදු ආශ්‍රිත විෂයයන් පිළිබඳ ගුවන් විදුලි ප්‍රචාර ගණනාවක් සංවිධානය කරන ලදී. ඒවා පහත සඳහන් වේ.:–

| වැඩසටහන. | | විෂයය. |
|---|---|---|
| "හෙඩ් ලයින්ස්" | – | ඉන්දියන් සාගරය භාවිතය කිරීම සඳහා දුරස්ථ සංවේදය පිළිබඳව එක්සත්ජාතීන්ගේ සංවිධානයේ අභ්‍යවකාශ අංශයේ අධ්‍යක්ෂ ඈන්.ජසෙන්තුලියන මහතා සමග සම්මුඛ සාකච්ඡාවක්. |
| "ඔප්ෂන්ස්" | – | "මුහුදු උරුමයන් භාරයේ" ආරම්භය පිළිබඳව කපිතාන් දේවේන්ද්‍ර හා විහාන් ජයතිලක යන මහත්වරුන් සමග සම්මුඛ සාකච්ඡාවක්. |
| "ෆැසට්ස් ඔෆ් ලංකා" | – | වැල්ලවත්ත ටබ්බෙත් කිමිදුම් හැඳින්වීම. |
| – එම – | – | කල්පිටිය ධීවර ග්‍රා/ජලසම්පත් |

"කෝඩ්ස් ඇන්ඩ් කොන්වසේෂන්ස්" - ඔවුන්ගේ මුහුදු වාසස්ථානය තුළ මසුන් පාට කිරීම.

- එම - - තාරාහි සූරතල් මසුන් බෝකිරීම.

අනාගතයේ දී සන්නිවේදන ප්‍රයෝජනයන් සඳහා පහත සඳහන් වෙනත් ශ්‍රව්‍ය පටිගත කිරීම් :

- ගැඹුරු සාගරයේ මණ්ඩි - විජයා නන්ද මහතාගේ පැළි ආචාර්ය අධ්‍යයනය සඳහා
- මුහුදු පැලෑටි වගාව ආරම්භ කිරීම පිළිබඳව ඇනස්ටී ජයසූරිය මහත්මියගේ වැඩ.
- මුහුදු අපවිත්‍රවීම පිළිබඳව කපිතාන් රවි ජයරත්න හා සී.පී. ජයසිංහ
- කැනේඩියානු සමුද්‍ර විද්‍යාව පිළිබඳව ආචාර්ය බැරී.

මුද්‍රණ සන්නිවේදන වැඩකටයුතු අතර ව්‍යාප්ති අංශය තුළින් පහත සඳහන් ප්‍රකාශණ නිකුත් විණි:-

- තාරා ආයතනයේ වැලිගම කප්පරතොට මධ්‍යස්ථානය පිළිබඳ තිළිණ පොත් පිංචකි.
- අයිලන්ඩ් පුවත්පත මගින් පොකිරිස්සන් පර්යේෂණ ගැන ලිපියක්
- ඉන්දියන් සාගරයේ සොයා නොබැලූ ධීවර කර්මාන්තය වූනා (කෙලවල්ලා) තොගවලට හානි පැමිණිය හැකිය. - සිලෝන් ඩේලි නිවුස් පුවත් පතෙහි ලිපියකි.
- විදුසර විද්‍යා සඟරාවේ - සුරතල් මසුන් නම් ලිපිය.
- කෝටිං ක්‍රමය හේතුවෙන් ඉස්සන් වගාවට හානි " ඩේලි නිවුස් පුවත් පතට නිකුත් කළ ලිපියකි.
- එම විෂයම අප්ඩිට් නමැති වැඩසටහන - (සංහලට) නිකුත් කළ පුවතකි.
- කරච්චිතුවර පැවැති IOMAC - UN ආකාශීය යොදාගැනීම් වැඩමුළුවට නිකුත්කළ පුවතකි.
- ජයකොඩි මහතා සමග සම්මුඛ සාකච්ඡාවක් - "අවදානමටපත් පොකිරිස්සන්" - විදුසර විද්‍යා සඟරාව.
- ඇනෙස්ටි ජයසූරිය මහත්මිය සමග සම්මුඛ සාකච්ඡාවක් - - මුහුදු පැලෑටි වගාව - විදුසර විද්‍යා සඟරාව.
- ජයසිංහ මහතා සමග සම්මුඛ සාකච්ඡාවකි - ජලජ වගාවන් - - විදුසර විද්‍යා සඟරාව.
- වත්තිනායක මහතා සමග සම්මුඛ සාකච්ඡාවකි - මෘද්වංගියන් වගාව - විදුසර විද්‍යා සඟරාව.
- සුරතල් මසුන් බෝ කිරීම - පුහුණු පාඨමාලාව පිළිබඳ ප්‍රවෘත්තිසාකච්ඡාව.

-ඒතලාහි මුහුදු පැලෑටි ව්‍යාපාරය - ප්‍රවෘත්ති සාකච්ඡාවකි.

-විජයානන්ද මහතාගේ පැළි ආචාර්ය උපාධි අධ්‍යයනය - ප්‍රවෘත්ති සාකච්ඡාව.

පහත සඳහන් විෂයයන්ට අදාලව ව්‍යාප්ති ඒකකය විසින් ඡායාරූප සේවාවන්, මුද්‍රණ වැඩ හා සර්පත ද සපයන ලදී.

- තාරා අත්පොත
- කප්පරතොට ගැන පොත් පිංච
- "මිහිකත" පාරිසරික සඟරාවට පිට කවරය ( තෙත් කලාපය)
- "විදුසර විද්‍යා සඟරාවට පිටකවරය ( තල්මසා)
- පොකිරිස්සන් ගැන සන්ඩේ අයිලන්ඩ් පුවත්පතට වර්ණ ඡායාරූපයක්
- ඉස්සන් වගාව වාර්තාව - පිටකවරය
- මුහුදු පැලෑටි වගා වාර්තාව - පිටකවරය.
- ත්‍රිකුණාමලය ගැන වාර්තාව - පිටකවරය
- කිඹුලන් ඝාතනය ගැන වාර්තාව - පිටකවරය
- ඩේලි නිවුස් පුවත්පතට වූනා (කෙලවල්ලා) පිළිබඳ ලිපියට රූපසටහන්.
- ජයකොඩි මහතා විදුසර සඟරාව සමග කළ සම්මුඛ සාකච්ඡාවට රූප සටහන්.

ව්‍යාප්ති ඒකකය විසින් චිත්‍ර කර්ම හා සුචිත්‍රිත සැපයීම් විස්තර මෙසේය:-

- කප්පරතොට නාම පුවරුව සැලැස්ම.
- කප්පරතොට පොත් පිංචට පිටකවරය චිත්‍රවැඩ
- කප්පරතොට පෝස්ටරයට චිත්‍රවැඩ - අමාත්‍යාංශය
- මුහුදු සම්පත් මධ්‍යස්ථානය - ආදර්ශ ධීවර ප්‍රදර්ශනයට විවෘත ජලජ මසුන් පිළිබඳව හඳුනා ගැනීමේ උපකාරකය සැකසීම.
- පොකිරිස්සන් සංරක්ෂණය සහ කළමනාකරණ ප්‍රයත්නයන් ගැන පාසල්වල හා වෙරළබඩ ගම්මුන්ගේ ප්‍රයෝජනය සඳහා ෆෝල්ඩරය/පෝස්ටරය සඳහා චිත්‍රවැඩ හා කරුණු.
- පාසල්වල භාවිතය සඳහා පාරිසරික දැනුවත් කිරීමේ වැඩසටහනට "මුහුදු වාසස්ථානයට හැඳින්වීමක්" පිළිබඳව වූ පෝස්ටරයට සැලැස්ම හා කරුණු.
- වූනා පෝස්ටරයට වූනා චිත්‍ර වැඩ 3 ක්.
- මුහුදු පැලෑටි වගාව පිළිබඳ ජයසූරිය මෙනෙවියගේ වාර්තාවට මුහුදු පැලෑටි පිළිබඳ රූප සටහන්
- පාරිසරික අධ්‍යයන ඒකකයට අපවිත්‍රවීම පිළිබඳ සුචිත්‍රිත
- ආචාර්ය වික්‍රමරත්නයන්ගේ පාරිසරික ප්‍රකාශනයට රූප සටහන්.
- බැංකොක්හි මුහුදු පැලෑටි යන මැයෙන් වූ ජයසූරිය මෙනෙවියගේ දේශනයට රූපසටහන් සහිත පාර දෘශ්‍ය කට්ටලයක්.
- සමුද්‍ර විද්‍යා අංශයට ලසුවක්
- ධීවර පුහුණු ආයතනයට ලසුවක්
- වීඩියෝ නිශ්පාදනවලට මිශ්‍ර චිත්‍රවැඩ, නාම සහ බැන නාමයන්.

තාරා ආයතනයේ සැරසිලි වැඩ සඳහා ජීවමාන ප්‍රමාණයේ ප්‍රදර්ශකයන් හා ආදර්ශ ව්‍යාප්ති ඒකකය විසින් සපයන ලදී.

<u>ෆයිබර්ග්ලාස් ආදර්ශ.</u>

- මුහුදු සම්පත් මධ්‍යස්ථානය - මුහුදයට වාසස්ථාන ප්‍රදර්ශනය
- ඩුගොන්( Dugong ) ප්‍රතිමා (6යි) කට්ටල 2 යි.
- ඩොල්ෆින් ප්‍රතිමා කට්ටල 2 යි ( 6 යි)
- රුවල් මසුන්, බ්ලැක් මාලින්, ස්වෝඩ් ෆිෂ්, බ්ලූ මාර්ලින්, ස්ට්‍රිප්ඩ් මාර්ලින්, යෙලෝෆින් ටූනා, ශාර්ක්, කබර ෂාරව්, ස්කිප්ජැක් ටූනා ( 7 යි)
- තෝරා මසුන් (2 යි) ගෲපර්, ලේටිස් (3 යි)

<u>ප්ලා ස්ටර් ඔෆ් පැරිස්/ රිපිෆෝම් ආදර්ශ.</u>

- කප්පරතොට බිම් සැලැස්ම - ප්‍රමාණ ආදර්ශ.
- කප්පර තොට මුහුදු බිම - ප්‍රමාණ ආදර්ශ
- කඩොල්කැලේ බිම් සැලැස්ම - ප්‍රමාණ ආදර්ශ.
- ශ්‍රවනාගාරය සඳහා ලසුව
- පිළිගැනීමේ ප්‍රදේශය නාරා ලසුව

මෙයට අමතරව ඒකක පිරිස් විසින් නාරා ආයතනයෙහි ප්‍රදර්ශන සඳහා පෝස්ටර් ද ඡායාරූප ද රාමුකිරීමේ කටයුතු වල නියැලෙන ලදී.

පහත සඳහන් මහජන සම්බන්ධතා කටයුතු සංවිධානය කිරීමෙහි ද ව්‍යාප්ති අංශය නියැලී සිටින ලදී. :-

- එතෙර ළමුන්ගේ පාසලේ සිසුන් සඳහා නාරා ආයතනය විසින් කැඳවා ගෙන යන ලද චාරිකාවක් සම්බන්ධීකරණය කිරීම පිළිබඳ වීඩියෝ චිත්‍රපට හා චිත්‍රපට ඉදිරිපත් කිරීමකට
- සුරතල් මසුන් බෝකිරීම හා මසුන් සැකසීම පිළිබඳ ස්වයං රැකියා තාක්ෂණිකයන් අධ්‍යයනය කිරීමට කළුතර සිට පැමිණි කාන්තා කණ්ඩායමකට සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- නාරාහි පාරිසරික අධ්‍යයන ඒකකයේ සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා වෙරළ මුහුදු කෑම පිළිබඳ විශේෂ චිත්‍රපට පෙන්වීම.
- නාරා ඡායාරූප සමාජය සංවිධානය කිරීම, සාමාජිකයින්ට කැමරා නිකුත් කිරීම හා හොඳම ඡායාරූප ප්‍රදර්ශනය කිරීම.
- වර්ෂය තුළදී නාරා ආයතනයට පැමිණි සම්භාවනීය අමුත්තන් ඉදිරිපිට දී තමන්ට යෙදී ඇති වැඩ කටයුතු පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලෙස ව්‍යාප්ති අංශයේ සේවක පිරිසගෙන් ඉල්ලීමක් කරන ලදී.

  - USAID හා NILOS නියෝජිතවරු
  - ධීවර රාජ්‍ය ඇමති ගරු පී.එස්.එල්.ගලප්පත්ති මහතා සහ විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරු.
  - USAID ආයතනයේ මුදල් ආධාර කණ්ඩායම.

සමාලෝචනයට භාජනය වන වර්ෂයේ දී ව්‍යාප්ති ඒකකයේ එක් සාමාජිකයකු බැංකොක් නුවර SEAFDEC පුහුණු මධ්‍යස්ථානයේ පැවැති ජනසන්නිවේදන මාධ්‍යයේ ධීවර ව්‍යාප්ති සේවකයන් සඳහා වූ දහවැනි ප්‍රාදේශීය පුහුණු පාඨමාලාවට සහභාගිවීම පිණිස අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා විදේශගත කරනු ලැබීය.

තායිලන්තය, සුවිකිත, ඡායාරූප විද්‍යාව, මුද්‍රණ මාධ්‍යය ඕඑච්පී. ශබ්ද සහ සර්පත, වීඩියෝ නිෂ්පාදනය ද ඇතුළත් පාඨමාලාවට සහභාගිවූ අතරම ලිවීමත් සංස්කරණයත් කරමින් වීඩියෝ නිෂ්පාදන පංතියද අධීක්ෂණය කළාය. පංතියේ පුහුණු කටයුතු පිළිබඳ විනාඩි 15 ක වෘතාන්තයකි මේ.

.............

## පුස්තකාලය සහ ප්‍රවෘත්ති අංශය - වාර්ෂික වාර්තාව

## 1 9 8 9.

### සේවක මණ්ඩලය:

පුස්තකාලය හා ප්‍රවෘත්ති සේවා අංශය අයත්වන්නේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවටයි. පහත සඳහන් සේවක පිරිස් ඔහුට සහාය වෙති.

- ප්‍රවෘත්ති නිලධාරීන් දෙදෙනෙකු
- ප්‍රකාශන නිලධාරී.
- පුස්තකාලයාධිපතිවරුන් දෙදෙනෙකු
- දත්ත සටහන් කරු
- යතුරු ලියන්නා
- කාර්යාල කාර්ය සහායක

1989 ඔක්තෝබර් සිට අධ්‍යක්ෂ ප්‍රවෘත්ති තනතුර හිස්ව පවතී. ප්‍රවෘත්ති නිලධාරී පී.ඒ. පද්මපෙරුම මෙනෙවිය හා ප්‍රකාශන නිලධාරී ජනක කුමාර මහතාත් 1989 ජුනි 30 වැනි දින නාරා ආයතනයෙන් ඉල්ලා අස්වූහ. ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ඉල්ලා අස්වීමෙන් පසු වී.එන්. පෙරේරා මෙනෙවියට එම තනතුරේ වැඩ කටයුතු භාරදෙන ලදී.

### අලුත් එකතුවීම්.

නොමිලේ පදනමක් මත පොත්, ප්‍රකාශණ, නැවත මුද්‍රණය කිරීම්, ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ප්‍රකාශණ සහ වෙනත් ප්‍රකාශණ වෙනදා මෙන්ම මෙම වසරේ-දීත් ලැබිණ.

අදාල කාල සීමාව තුල පහත සඳහන් ප්‍රකාශන පුස්තකාලයට ලැබී ඇත.

| | |
|---|---|
| පොත් | 56 |
| වාර ප්‍රකාශණ | 168 |
| ආ.කා.ස.ප්‍රකාශණ | 69 |
| IOC වාර්තා | 23 |
| නාරා නිලධාරීන්ගේ වාර්තා | 12 |
| වාර්ෂික වාර්තා | 03 |
| නැවත මුද්‍රණය කිරීම් | 03 |

මීට අමතරව පහත සඳහන් වාර ප්‍රකාශණ පුස්තකාලයට ලබා දී ඇත. එහෙත් වාර ප්‍රකාශණ නාම 20 ක් සඳහා අධ්‍යක්ෂ ජනරාල් අනුමත කොට ඇතත් ගණකාධිකාරී විසින් ඒවාට ගෙවීම් කොට නොමැත.

පහත සඳහන් වාර ප්‍රකාශණ සඳහා දායක වී ඇත

ඉකොනොමික් රිවව්
රීඩර්ස් ඩයිජස්ට්
මිහිකත
ලෝරිස්
ජේ.මාර්ගා
කල්පනා
මැරායන් පොලියුෂන් බුලටින්
වර්ල්ඩ් ෆිෂිං
ෆිෂිං නිවුස් ඉන්ටර්නැෂනල්

<u>ප්‍රකාශණ.</u>

එකතුවීම් ලේඛණය – පුස්තකාලයට එකතුවූ සියලුම පොත්වල ලේඛණයක් ත්‍රෛමාසිකව නාරා ආයතනයේ සේවක මණ්ඩලය වෙත සපයන ලදී.

"නිවුස් ෆ්‍රොම් නාරා – නාරා ආයතනයට සම්බන්ධ පුවත්පත් වලින් ලබාගත් ප්‍රවෘත්ති සංස්කරණයකොට පුවත් සඟරාවක් වශයෙන් "නිවුස් ලෙටර් අංක.3" 1989 වසරේදී සකස් කරන ලදී.
මෙම පුවත්පත් සඟරාව මීගමුවේ පැවැති අමාත්‍යාංශ ජංගම සේවාවේ දී බෙදා හරින ලදී.

නාරා ආයතනයේ ක්‍රියාකාරී කටයුතු පිළිබඳ තත්වාවබෝධයක් ආයතනයට එන අමුත්තන්ට ලබා දීම ප්‍රයෝජනවත් වී ඇති අතර පොදු මාධ්‍ය වැඩ වලට ද උපකාරී වේ.

මෙම වකවානුව තුල පුස්තකාලයේ උපකරණ උපයෝගී කොටගෙන ආටේමියා පිළිබඳ සංග්‍රහයක් ද සකස් කරනු ලැබීය.

සේවාවන්.

- යොමු කිරීමේ පොත් ලබා දීම් - පුස්තකාලයේ ඇති සි...මපොත්පත් තාරා ආයතනයේ හා අමාත්‍යාංශයේ සේවකයින්ට පමණක් කියවීමට දෙනු ලැබේ. වාර ප්‍රකාශණ, ආ.කෘ.සං.ප්‍රකාශණ හා වෙනත් ප්‍රකාශණ යොමුකිරීම සඳහා පමණක් තබා ඇත. ගතවූ කාලයතුල විශ්ව විද්‍යාල සිසුන් හා ඒ ඒ අංශවල පුහුණුවන්නන් ද සුරතල් මසුන් අංශයේ අයද මෙම පුස්තකාලීය පොත් භාවිතා කරන ලදී.

- ලියවිලි සපයා ගැනීම - පුස්තකාලයේ ඡායා පිටපත් යන්ත්‍රයක් සවිකොට ඇත. ලියවිලිවල පිටපත් තාරා සේවක/නිලධාරීන්ට නොමිලේ සපයන ලද අතර ඉන් පිටස්තර හා විදේශිකයින්ට සාධාරණ මිලකට පිටපත් සපයන ලදී. සියලුම ආදායම් සරප් භාරයේ තබා ඒ සඳහා නිල කුවිතාන්සියක් ද නිකුත් කෙරේ.

අයකරනු ලබන ගාස්තු :-

| | | |
|---|---|---|
| ඒ.4 ප්‍රමාණයේ පත්‍රයකට | - | රු.2/50 |
| ඒ.4 ප්‍රමාණයේ පත්‍රයක් දෙපිටම | - | රු.3/00 |
| ඒ.3 ප්‍රමාණයේ පත්‍රයක් | - | රු.4/00 |
| ඒ.3 ප්‍රමාණයේ පත්‍රයක් දෙපිටම | - | රු.5/00 |
| යු.3 ප්‍රමාණයේ පත්‍රයක් | - | රු.2/00 |
| යු.3 ප්‍රමාණයේ පත්‍රයක් දෙපිටම | - | රු.2/50 |
| එෆ්.4 ප්‍රමාණයේ පත්‍රයක් | - | රු.3/00 |
| එෆ්.4 ප්‍රමාණයේ පත්‍රයක් දෙපිටම | - | රු.4/00 |

සේවක මණ්ඩල පුහුණුවීම්.

තායිලන්තයේ බැංකොක් නුවර ආසියානු තාක්ෂණික ආයතනයේ 3 මසක පරිගණක පුහුණු පාඨමාලාවකට ප්‍රවෘත්ති නිලධාරි එල්.විජේසූරිය මහතා 1989 සැප්තැම්බර් මාසයේ දී සහභාගී වීය

පුරප්පාඩු.

මෙම අංශයේ සේවා පුරප්පාඩු තවමත් පහත සඳහන් පරිදි ඇත.

අධ්‍යක්ෂ ප්‍රවෘත්ති
ප්‍රකාශණ නිලධාරි.
ප්‍රවෘත්ති නිලධාරි.
ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු
කම්කරු.

## ජාතික මුහුදු ක්ෂීරපායී වැඩසටහන

### 1989 වාර්ෂික වාර්තාව.

**සේවා පිරිස්.**

1989 වසරේ මෙම ව්‍යාපෘතිය සේවා සාමාජිකයින් සතර දෙනෙකුගෙන් යුක්ත විය. එනම්, සම්බන්ධීකරණ නිලධාරී, පර්යේෂණ නිලධාරී, සහ පර්යේෂණ සහකාර වරුන් දෙදෙනෙකු ද වශයෙනි. සියලු අය නාරා ආයතනයේ ස්ථිර කාර්යමණ්ඩලයට අයත් වූවන්ය.

**කාර්ය වැඩසටහන.**

වර්ෂය තුල දී මුහුදු ක්ෂීරපායි ජීවීන් සෙවීමේ සමීක්ෂණ සහ පාවී ගොඩ ගැසෙන්නන් පරීක්ෂාකිරීමේ කටයුතු මෙහෙයවන ලදී. අවුරුද්දේ පළමු හා දෙවෙනි කාර්තුවල දී ආර්.වී.සමුද්‍රමාරු යාත්‍රාවේ මුහුදු චාරිකා පහකට සහභාගී වූ සාමාජිය යන් විසින් සොයාගැනීමේ දත්ත රැස්කරන ලදහ. මෙම චාරිකාවන් ශ්‍රී ලංකාවේ වයඹ, බටහිර, නිරිතදිග, දකුණ, ගිණිකොණ සහ නැගෙනහිර වෙරළ තීරු ආවරණය කෙරෙන සේ මෙහෙයුම් කරගෙන යන ලදී. වාර්තා වී ඇති ලොකුම තල්මසුන් වර්ග නම් නිල් තල්මසා, බ්‍රයිඩ්ස් තල්මසා හා ස්පර්ම් තල්මසාය. මෙයට අමතරව පහත සඳහන් කුඩා සිටාසීන් වර්ග හතක් ද නිරීක්ෂණය කොට ඇත.

| | |
|---|---|
| ස්පිනර් ඩොල්ෆින් | ( STENELLA LONGIROSTRIS) |
| ස්ට්‍රිප්ඩ් ඩොල්ෆින් | ( Stenella Coiruleoalba) |
| බොට්ල් නෝස් ඩොල්ෆින් | ( Tursiops Fruncafus ) |
| රිස්සෝස් ඩොල්ෆින් | ( Grampus Griseus ) |
| රෆ් ටූත්ඩ් ඩොල්ෆින් | ( Steno Bredanensis ) |
| ස්පොටඩ් ඩොල්ෆින් | ( Stenella Affenfunafa) |
| ෆෝල්ස් කිලර් වේල් | ( Pseudorca Crassidens) |

අවුරුද්දේ තුන්වන කාර්තුවේ දී රටතුල පැවැති කලබලකාරී තත්ත්වය නිසා ක්ෂෙත්‍ර කටයුතු සීමා කිරීමට සිදුවිණ.

1989 අගෝස්තු හා දෙසැම්බර් මාස තුල බටහිර හා වයඹ වෙරළේ තල්මසුන් සතර දෙනෙකු ගසාගෙන ඇවිත් තිබෙනු දක්නා ලදී. මුහුදු ක්ෂීරපායී පර්යේෂණ කණ්ඩායම මගින් එම සතුන් සිව් දෙනා පිළිබඳ පරීක්ෂණ මෙහෙයවන ලදී. පළමුවෙන් ගොඩගැසූ තල්මසා මීගමුවට උතුරින් එනම් කරුක්කපොන අසල දී අගෝස්තුමසදී දකින ලදී. මෙම තල්මසා ස්පර්ම් වේල් හෙවත් ( Physeter Macrocephalus ) යයි හඳුනා ගන්නා ලදී. මෙසේ හඳුනාගන්නා ලද්දේ හමුවූ මැක්සිලාවක් හොඳින් අධ්‍යයනය කිරීමෙන් පසුවය. ඉන්පසු සැප්තැම්බර් මාසයේ දී කල්පිටිය ප්‍රදේශයෙන් හමුවූ තල්මසෙකු පිළිබඳ පරීක්ෂණ මෙහෙයවනු ලැබුවේ වුවත් තල්මසාගේ මෘත ශරීරය අනුව හරි නිශ්චිතයකට බැසීමට නොහැකිවිය. ඔක්තෝබර් මාසයේ දී මීගමුවේ මසුන් ගොඩ බාන ස්ථානයකට ගොඩගසා ගෙන එන ලද තරුණ ස්පර්ම් තල්මසෙකු හෙවත් Physestar Macrocephalus) නමින් හඳුනාගෙන මැන බලා ඡායාරූප ගන්නාලදී. මෙම සතා හඳුනාගැනීමෙන් පසු ගොඩට ගෙන එන ලද පුද්ගලයින්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන ලදී.

54 ....

හතරවෙනි ගොඩ ගැසීම සිදුවූයේ නොවැම්බර් 10 වෙනි දාය. මෙම තල් මසා ද ඉහත කී ස්පර්ම් වර්ගයටම අයත් යැයි හඳුනාගෙන ඇත. මෙම මත්ස්‍යයා මැන බලා ඡායාරූපද ගෙන පසුව නාරා ...ිතනයේ ප්‍රදර්ශනය කිරීම පිණිස උගේ ඇටසැකිල්ල සුරක්ෂිත කොට තබා ඇත.

<u>සේවා පුහුණු.</u>

මෙම වැඩ සටහනේ ඒ.ඩී.ඉලංකෝන් මෙනෙවිය 1989 ජූලි මාර්තුවේ දී 1989 ඔක්තෝබර් 15 සිට දෙසැම්බර් 21 දින දක්වා පැවැති IOMAC මගින් සංවිධානය කරන ලද මුහුදු කටයුතු පිළිබඳ 10 මාසයක පුහුණු වැඩ සටහනකට සහභාගී වූවාය.

මෙරට/විදේශීය සම්මන්ත්‍රණ, බහුසාද,වැඩමුළු ආදියට මෙම වසරේ දී සේවක සහභාගිත්වයක් නොවීය.

<u>ප්‍රකාශණ,කියවන ලද පත්‍රිකා ,වාර්තා හා සේවාවන්:</u>

" ස්පර්ම් වේල් ඔෆ් ශ්‍රී ලංකා " නම් ලිපිය- ලෝරිස් සඟරාවට ලියුමකි
— ඩබ්ලිව්.පී.මහේන්ද්‍ර -

ශ්‍රී ලංකාවේ මුහුදු ක්ෂීරපායි සතුන් පිළිබඳ පොතක් සහ අධ්‍යාපනික පොත් පිංචක් සඳහා සැලැස්ම සැකසීම .
— ඒ.ඩී.ඉලංගකෝන් —

<u>උපකරණ :-</u>

නොමැත.

<u>මුහුණ පාන්නට සිදුවූ බාධක:-</u>

අවශ්‍ය පරිදි පාවිච්චි කිරීමට සුදුසු යාත්‍රාවක් නොමැතිකම නිසා ක්‍රමානුකූලව මුහුදු ක්ෂීර පායි පර්යේෂණ වැඩපිළිවෙලක් කිරීම අපහසුය.එබැවින් සෑහෙන වේගයකින් පැදවිය හැකි එමෙන්ම මනාව හැසිරවිය හැකි යාත්‍රාවක් මෙම ව්‍යාපෘතිය සඳහා තිබීම අත්‍යවශ්‍යය.

55 ....

## කොරල්පර පර්යේෂණ වැඩ සටහන.

### 1989 ඔක්තෝබර් සිට දෙසැම්බර් මස දක්වා ප්‍රගති වාර්තාව

**ව්‍යාපෘතිය: කොරල්පර පර්යේෂණ**

ඔක්තෝබර් මාසය - ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ ද සහාය ඇතිව කප්පරතොට අසල වෙරළේ කොරල්පර සිතියම් කරනලදී. සමීක්ෂණයේ දී රැස්කරන ලද දත්ත ඇසුරින් කොරල්පර සමුච්චයන් විස්තර සිතියම් කිරීම සකස් වෙමින් පවතී.

නොවැම්බර්මාසය - දැනට තිබෙන කොරල්පරවල තත්ත්වය හා කොරල්පරවල අනුක්‍රමනය ද ජලජ සත්ත්ව හා කොරල්පර මල් ගොමු විසිරී ඇති ස්වභාවය ද අනුව කොරල්පර ඉන්වෙන්ට්‍රිගත කිරීමට මීරිස්ස ගොඩබීම අසල මුහුදු කර ප්‍රදේශවල මූලික පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. මෙහි වෙරළබඩ ගල්පර සහිත හා වැලි අධික වෑල්ලක් ඇති හෙයින් ඉහත කී ස්ථාන දෙකම ඉතාමත් ප්‍රසන්නකරය. තියනවැල්ල හා පරගල්ල යන ස්ථානවල ගැටිපර සහිත ගල්පර සුළු ප්‍රමාණයක් ඇත. පරගල්ල නම් ස්ථානයේ සුළු වශයෙන් කොරල්පර කඩා ගනු ලැබේ. මෙම වෙරළ ප්‍රදේශයේ තාර බෝල බෙහෙවින් දැකිය හැක.

කොරල්පර වැඩ සටහනේ වැඩකටයුතු පිළිබඳව සර්පතද සහිත රූප සටහන් වලින් යුත් අර්පනයක් 1989 නොවැම්බර් මස 10 වෙනි දා නාරා ආයතනයට පැමිටි USAID නියෝජිත කණ්ඩායමකට දීම සඳහා සකස් කරන ලදී.
ජීවමාන කොරල්පර අපනයනය කිරීම පිළිබඳ තත්ත්ව වාර්තාවක් සකස්කොට වන සත්ත්ව දෙපාර්තමේන්තුවේ ඇස්. කොටගම මහතාට යවා ඇත.
1989 නොවැම්බර් 29 දින නාරා ආයතනයේ පැවැති ප්‍රවෘත්ති වැඩ සටහනට ව්‍යාප්ති ඒකකයේ එම්. බෙරෙන්ජර් මෙනෙවිය විසින් ඒ. රාජසූරිය මහතා සමග සම්මුඛ සාකච්ඡාවක් පවත්වනු ලැබුවාය. එහි තේමාව වූයේ "ශ්‍රී ලංකාවෙන් පිටරට යවනු ලබන මසුන් හා ජීවමාන කොරල්පර හා කොරල් පර පරිසර පද්ධතියෙහි ඝාතිකර කරුණු" යන්නය. සරෙක් ආධාර යටතේ වූ කොරල්පර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙරාතුව අනුක්‍රමනය වූ ස්ථාන හා සසඳා බැලීම සඳහා අනුක්‍රමනය නොවූ ස්ථාන තෝරා ගැනීමට සරෙක් කණ්ඩායමේ ද සහාය ඇතිව මූලික පරීක්ෂණයක් මෙහෙයවන ලදී. කලින් සමීක්ෂණවලින් ලබාගත් තොරතුරු අනුව කල්පිටිය අඩි දූපතට ඔබ්බෙන් පිහිටි බාර් රීෆ් නම් ප්‍රදේශය අනුක්‍රමණය නොවූ ස්ථානය ලෙස තෝරා ගැනීන. කොරල්පර පර්යේෂණ කණ්ඩායමද සමග බාර් රීෆ් ස්ථානයේ පරීක්ෂණ වැඩකටයුතු මෙහෙයවනු ලැබීය. එය 1989 නොවැම්බර් 26 දින සිට දෙසැම්බර් 09 වැනි දින අතර තුර සිදුවිය.

සමුහනය ස්ථානවල මෙන් බෙල්ලන් සඳහා උණ බම්බු පහුරු භාවිතාකරන ගල්පර ආශ්‍රිත චෛත්‍රිකයන් ඉන්වෙන්ටරි ගත කිරීමට ගාල්ලේ කතෝකෝ ලංකා මුතු බෙල්ලන් ගොවි පලෙහි දියයට පරික්ෂණ මෙහෙයවනු ලැබීය. මීට අමතරව, රුමස්සල වෙරළේ කොරල්පර අසල ඒ ඒ වර්ග ගණන් ගැනීමක් ද කරන ලදී.

ක්ෂෙත්‍ර සමීක්ෂණවලට අමතරව තාරා ආයතනයේ ද කොරල් වර්ගී කරණ කටයුතු කරන ලදී. රැස්කරන ලද සියලුම කොරල් වර්ග පිරිසිදු කොට ආශු කටයුතු සඳහා තබා ඇත.

අ.ක.

අර්ජන් රාජසූරිය.

මගේ අංකය: එල්පී/එෆ්/නාරා/89

විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

1990 දෙසැම්බර් 20 දින.

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන
නියෝජිතායතනය.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ
1989 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්
පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී)
වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

යථොක්ත වාර්තාවේ කෙටුම්පතක් මේ සමඟ ඇත.

02. මෙම වාර්තාවේ ඔබට එකඟවිය නොහැකි හෝ සාවද්‍ය කරුණු කිසිවක් ඇත්දැයි මෙම ලිපියේ දින සිට දින 14 ක් ඇතුලත් දන්වන්නේ නම් මැනවි. එම කාලය තුලදී ඔබෙන් පිළිතුරක් නොලද හොත් කෙටුම්පත් වාර්තාවේ එකඟවිය නොහැකි හෝ සාවද්‍ය කරුණු කිසිවක් නොමැති සේ සලකා අවසන් වාර්තාව නිකුත් කරනු ලැබේ.

(එස්. සී. මායාදුන්නේ)
නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

මගේ අංකය: එල්පී/එෆ්/නාරා/1989

විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය, කොළඹ-7.
1990 දෙසැම්බර් 20 දින.

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 1989 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 1989 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් 1981 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියැවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංග්‍රහයේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාරව නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යයි මා අදහස් කරන මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර සවිස්තර වාර්තාවක් 1990 සැප්තැම්බර් 17 දින සභාපති වරයා වෙත යවන ලදී.

1:2 විගණන විෂය පථය

මෙම වාර්තාවේ අඩංගු විගණනන් මතය, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනු පිළිබඳ ප්‍රමාණවත් නියැදි පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය හා වෙනත් සම්පත් සහ කාලවේලාව යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළගැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

/2....

## 2. ගිණුම්

### 2:1 විගණන මතය

මෙම වාර්තාවේ දැක්වෙන අදහස් දැක්වීම් හේතුකොට ගෙන ඉදිරිපත් කර ඇති ගිණුම් පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය. ඒ පිළිබඳ ප්‍රධාන නිරීක්ෂණයන් පහත සඳහන් කෙරේ.

| ඌණතාවයන් | මෙම වාර්තාවේ ඇතුලත් ඡේදයන්ට යොමුව |
|---|---|
| (01) ගිණුම් ප්‍රතිපත්ති | 2:5:1 |
| (02) ගිණුම් වලින් අත්හැරීම් | 2:5:2 |
| (03) වර්ග කිරීමේ දෝෂ | 2:5:3 |
| (04) අනුචිත හෙළි කිරීම් | 2:5:4 |
| (05) විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම | 2:5:5 |
| (06) නීතිරීති, රෙගුලාසි සහ කළමනාකාරණ තීරණයන්ට අනුකූල නොවීම් | 2:5:6 |
| (07) හඳුනාගත් පාඩු | 2:5:7 |
| (08) මුදල් හිමිකම් | 2:5:8 |
| (09) වත්කම් අඩුවෙන් ගණනය කිරීම | 2:5:10 |
| (10) මූල්‍ය ප්‍රකාශන වල සැලකිය යුතු අනියත භාවයන් | 3:1 |
| (11) පද්ධති හා පාලන දුර්වලතා | 4. |

## 2:2 මූල්‍ය ප්‍රතිඵල

මේ අනුව, 1989 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නියෝජිතායතනයේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු.61,29,198 ක ආදායම ඉක්ම වූ වියදම් අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය රු.63,35,457 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත සඳහන් ප්‍රකාශයෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 1989 | | 1988 | |
| | රු. | රු. | රු. | රු. |
| **ආදායම** | | | | |
| රජයේ ආයකය | 1,21,66,600 | | 1,11,80,000 | |
| විවිධ ආදායම් | 1,88,157 | 1,23,54,757 | 1,42,435 | 1,13,22,435 |
| **අඩුකලා** | | | | |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| පරිපාලන වියදම් | 1,48,38,798 | | 1,37,49,972 | |
| ආයතන වියදම් | 8,25,822 | | 13,48,420 | |
| ක්ෂය වෙන් කිරීම් | 28,19,335 | 1,84,83,955 | 25,59,500 | 1,76,57,892 |
| ආදායම් ඉක්මවූ වියදම් | | (61,29,198) | | (63,35,457) |
| පෙර වර්ෂයේ ගැලපීම් | | (10,58,134) | | (37,962) |
| | | (71,87,332) | | (63,73,419) |
| ඉදිරියට ගෙනා ආදායම් සහ වියදම් ගිණුම් ශේෂය | | (2,05,48,220) | | (1,41,74,801) |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | | (2,77,35,552) | | (2,05,48,220) |

## 2:3 මූල්‍ය ව්‍යුහය

1989 දෙසැම්බර් 31 දිනට තියෝජිතායතනයේ මූල්‍ය ව්‍යුහය 1988 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය සමඟ සසඳා පහත දැක්වේ.

| | | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|
| | | 1989 | 1988 |
| | | රු. | රු. |
| | **සම්පත්:** | | |
| | රජයේ දායකය - ප්‍රාග්ධන | 3,95,53,380 | 3,07,70,080 |
| | විදේශාධාර | 3,98,11,261 | 1,10,86,698 |
| | වෙනත් දායක මුදල් | 3,50,000 | 3,50,000 |
| | | 7,97,14,641 | 4,22,06,778 |
| අ | ආදායම් සහ වියදම් ගිණුමේ ශේෂය | (2,77,35,552) | (2,05,48,220) |
| | | 5,19,79,089 | 2,16,58,558 |
| | **උපයෝජනය** | | |
| | ලියා අඩුකල වටිනාකමට ස්ථාවර වත්කම් | 4,19,43,412 | 2,18,70,394 |
| | ශුද්ධ ජංගම වත්කම් | 1,00,35,677 | ( 2,11,836) |
| | | 5,19,79,089 | 2,16,58,558 |

## 2:4 අරමුදල් ප්‍රභවය සහ යෙදවීම

සමාලෝචිත වර්ෂය තුලදී නියෝජිතායතනයේ අරමුදල් ප්‍රභවය සහ යෙදවීම පහත සඳහන් ප්‍රකාශයෙන් දැක්වේ.

| | | | |
|---|---|---|---|
| **අරමුදල් ප්‍රභවය** | රු | රු | රු. |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ දායකය | | 87,83,300 | |
| විදේශාධාර | | 2,87,24,563 | 4,75,07,863 |
| **අරමුදල් යෙදවීම** | | | |
| ඌණතාවය | 61,29,198 | | |
| **අඩුකලා: අරමුදල් චලනය නොවන විෂයයන්** | | | |
| වර්ෂය සඳහා ක්ෂය | 28,19,335 | | |
| | 33,09,863 | | |
| එකතුකලා: පෙර වර්ෂයේ ගැලපීම් | 10,58,134 | 43,67,997 | |
| ස්ථාවර වත්කම් වලට එකතු කිරීම් | | 2,28,92,353 | 2,72,60,350 |
| පහත විග්‍රහ කර ඇති පරිදි කාරක ප්‍රාග්ධනයේ වැඩිවීම | | | 1,02,47,513 |

### කාරක ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම

| | වැඩිවීම | අඩුවීම | |
|---|---|---|---|
| | රු. | රු. | |
| තොග | - | 1,12,900 | |
| ණයගැතියෝ | 2,50,969 | - | |
| ලැබිය යුතු තැන්පත් | 71,250 | - | |
| අත්තිකාරම් | 3,29,307 | - | |
| සේවකයින්ගෙන් ලැබිය යුතු ණය | 3,49,466 | - | |
| මුදල් සහ බැංකු ශේෂ | 1,10,02,175 | - | |
| ණය හිමියන් සහ උපචිත වියදම් | 1,95,286 | - | |
| ගෙවිය යුතු තැන්පතු | - | 6,65,622 | |
| පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම් | - | 11,72,418 | |
| | 1,21,98,453 | 19,50,940 | 1,02,47,513 |

## 2:5 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්

### 2:5:1 ගිණුම් ප්‍රතිපත්ති

නියෝජිතායතනය විසින් එහි ගිණුම් ප්‍රතිපත්ති වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

### 2:5:2 ගිණුම් වලින් අත්හැරීම්

(අ) 1985 වර්ෂයේ දී ධීවර අමාත්‍යාංශය විසින් නියෝජිතායතනයට භාර දෙන ලද පර්යේෂණ කටයුතු සඳහා යොදා ගන්නා ලද "සමුද්‍රමාරු" නෞකාවේ වටිනාකම ගිණුම්ගත කර නොමැත.

(ආ) කලින් ධීවර අමාත්‍යාංශය සතුව තිබූ දැනට නියෝජිතායතනය භාරයේ ඇති චංචල හා නිශ්චල දේපල 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනතේ 35 වගන්තිය ප්‍රකාරව නියෝජිතායතනය වෙත පවරා ගෙන අගය කොට ගිණුම් වල දක්වා නොතිබුණි.

(ඇ) 1989 දෙසැම්බර් 31 දිනට නියෝජිතායතනය සතුව ඇති මසුන් තොගය ගණනය කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල රු.67,614 ක වියදම් ගිණුම් වලින් අත්හැර තිබුණි.

### 2:5:3 වර්ග කිරීමේ දෝෂ

(අ) 1988 සහ 1990 වර්ෂ වලට අදාල පිලිවෙලින් රු.5,919 ක් සහ රු.24,538 ක් වූ වියදම් අනුචිත ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායම් සහ වියදම් ගිණුමට ලියා [illegible]ර හැර තිබුණි.

(ආ) ආහාර ද්‍රව්‍ය, පරිභෝජ්‍ය ද්‍රව්‍ය, ලිපි ද්‍රව්‍ය, අළුත්වැඩියා හා නඩත්තු වියදම්, මෝටර් රථ රක්ෂණ ගාස්තු, අමතර කොටස් සහ පුවත්පත් වෙනුවෙන් දරන ලද රු.1,72,682 ක අයහාර වියදමක් ප්‍රාග්ධන ගත කර තිබුණි.

2:5:4 අනුචිත හෙලි කිරීම්

(අ) සුභ සාධක වියදම් වශයෙන් ගෙවූ රු.6,499 ක මුදල එම ගිණුමට හර කිරීම වෙනුවට පාරිතෝෂික දීමනා ගිණුමට හරකර තිබුණි.

(ආ) ජායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා සඳහා දරන ලද වියදම වූ රු.5,555 ක මුදල අළුත්වැඩියා හා නඩත්තු ගිණුම හර කිරීම වෙනුවට සේවා අත්තිකාරම් ගිණුම හර කර තිබුණි.

(ඇ) ප්‍රධාන පොකුණේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් වැයකර තිබූ රු.1,250 ක් ප්‍රධාන පොකුණ යටතේ ගිණුම් ගත කිරීම වෙනුවට ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී ලබාගෙන තිබූ ඉන්ධන සඳහා ගෙවන ලද රු.50,000 ක මුදලක් ඉන්ධන වියදම් යටතේ ගිණුම් ගත කිරීම වෙනුවට අත්තිකාරම් වශයෙන් දක්වා තිබුණි.

(ඉ) 1990 වර්ෂයේ සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී පුවත්පත් දැන්වීම සඳහා දරන ලද රු. [illegible],904 ක් වූ වියදම් ඉකුත් වර්ෂයේ ගැලපීම් ගිණුමට හර කර තිබුණි.

2:5:5 විගණනය සඳහා සාක්ෂි

ස්ථාවර වත්කම් ලේඛණය, සත්‍යාපණ වාර්තා, වත්කම් හා බැරකම් සනාථ කිරීමේ ලිපි සමහරක් වාහන වලට අදාල ධාවන සටහන් හා මාසික සාරාංශ, වාහන ලේඛණය, මිළදී ගැනීම් වලට අදාල ලිපිගොනු, ලදුපත් සහ බිල් පත්‍ර හා ඇතැම් ගෙවීම් වවුචර් නොමැති නිසා එකතුව රු.7,55,86,921 ක් වටිනා ස්ථාවර වත්කම්, ජංගම වත්කම්, ජංගම වගකීම් සහ වියදම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපණය කිරීමට හෝ පිලි ගැනීමට හෝ නොමැති විය.

2:5:6 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

(අ) 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනතේ 13 සහ 17 වගන්ති මගින් නියම කරන ලද ප පරිදි ජාතික ජලජ සම්පත් කළමනාකරණ සභාව සහ විද්‍යා සහ තාක්ෂණික කමිටුව පත්කර නොතිබුණි.

(ආ) ජාතික ජලජ සම්පත් නියෝජිතායතනයේ කාර්ය සංවිධාන සංග්‍රහයේ 4 වැනි පරිච්ඡේදයට අනුව ආයතනයට ලැබෙන මුදල් දිනපතා බැංකු ගතකල යුතු වුවද, දින හතක් පමණ රඳවාගෙන බැංකුගත කළ අවස්ථා දක්නට ලැබුණි.

(ඇ) ජාතික ජලජ සම්පත් නියෝජිතායතනයේ කාර්ය සංවිධාන සංග්‍රහයට අනුව නොගෙවූ වැටුප් දින 4 ක් ඇතුලත බැංකුගත කළයුතු වුවද, මුදල් අයකැමි විසින් එම මුදල් දින 20 කට වැඩි කාලයක් ආයතනය තුල රඳවාගෙන බැංකු ගතකර තිබූ අවස්ථා විගණනයේදී හෙළිදරව් විය.

(ඈ) ජාතික ජලජ සම්පත් නියෝජිතායතනයේ කාර්ය සංවිධාන සංග්‍රහයේ 13 වගන්තියට අනුව මුදල් වර්ෂය අවසන් වීමට පෙර තොග ගණනයක් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට තොග ආගණනයක් කර නොතිබුණි.

(ඉ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව 1989 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් 1990 අප්‍රේල් 30 දිනට හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද ඉදිරිපත් කරන ලද්දේ 1990 මැයි 17 දිනදී ය.

(ඊ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(1) වගන්තිය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(උ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(5) (බී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් නියම කරන ලද පරිදි තොග, ගබඩා භාණ්ඩ, ණය ගැතියන් සහ ණය හිමියන් පිළිබඳ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) මු.රෙ. අංක 396(ඩී) අනුව මාස 6 කට වැඩි කාලයක් පරිශේෂව පැවති චෙක්පත් වටිනාකම නිශ්කාශණය කිරීම හෝ ආදායමට ගැනීම කළයුතු වුවත්, රු.37,064 ක් වටිනා චෙක්පත් නිශ්කාෂණය කිරීම පිළිබඳව කටයුතු කර නොතිබුණි.

(එ) අංක 274 හා 1984 අගෝස්තු 15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපියේ 9 ඡේදයේ දැක්වෙන අයුරු වාහන පාලනය පිළිබඳ ක්‍රියා පරිපාටියක් සකස්කර නොමැත.

2:5:7 හඳුනාගත් පාඩු

(අ) 1989 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ කාර්ය මණ්ඩල ණයගැතියන් වශයෙන් පෙන්නුම් කර ඇති රු.6,79,910 ක් වූ මුදලෙහි නියෝජිතායතනයේ සේවය හැර ගිය සේවකයින් 7 දෙනෙකුගෙන් අයකර ගත යුතු එකතුව රු.21,674 ක් වූ සුළු මුදල් අග්‍රිම ඇතුලත් විය. ආපසු අයකර ගැනීම අනුමාන මෙම මුදල වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන කිසිවක් සලසා නොමැත.

(ආ) නියෝජිතායතනයේ 'වාඩිය' නැමැති භෝජනාගාරයේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් පාඩුව රු.56,109 ක් බව විගණනයේදී හෙළි දරව් විය.

2:5:8 මුදල් හිමිකම්

(අ) 1987 හා 1988 යන වර්ෂයයන් තුලදී සැපයීම් සහ සේවාවන් සඳහා ගෙවන ලද රු.8,16,047 ක් වූ අත්තිකාරම් 1989 දෙසැම්බර් 31 දින වන විටත් පරි--ශේෂව තිබුණි.

(ආ) ආයතනයේ නිලධාරීන්ට ගෙවන ලද රු.88,327 ක් සුළු මුදල් අත්තිකාරම් මාස 6 සිට වර්ෂ 4 කට වඩා වැඩි කලක් දක්වා විහිදෙන කාල පරිච්ඡේදයක් තුල සිට 1989 වර්ෂයේ අවසනට පරිශේෂව තිබුණි.

(ඇ) 1982 සිට 1988 දක්වා කාලය තුල සේ කයන්ට දී තිබූ අත්තිකාරම් සහ ණය මුදල් වලින් රු.22,263 ක් වූ මුදලක් සේවකයින් නියෝජිතායතනය හැර ගොස් ඇති නිසා අයකර ගැනීමට නොහැකිව තිබුණි.

2,5,9 සෙමින් වැයවන නිෂ්ක්‍රිය සහ ඌන උපයෝජිත වත්කම් හා ශ්‍රමය

(අ) මාළු බෝ කිරීමේ ටැංකි වර්ෂ පහක සිට නිශ්ක්‍රියව තිබුණි.

(ආ) රු.10,674 ක ශේෂයක් ඇති අංක 6600102565 දරණ බැංකු ගිණුම සමාලෝචිත වර්ෂය තුලම අක්‍රියව පැවතිණි.

(ඇ) මෝටර් වාහන 6 ක් අවුරුද්දකට වඩා වැඩි කාලයක් තුල කිසිම ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රියව තිබුණි.

(ඈ) වාහන වලින් ඉවත් කරන ලද අමතර කොටස් ඇතුළු අනෙකුත් භාණ්ඩ තොගයක් වර්ෂයකට වඩා වැඩි කාලයක් තුල නිෂ්ක්‍රියව තිබුණි.

2:5:10 වත්කම් අඩුවෙන් ගණනය කිරීම

1989 දෙසැම්බර් 31 දින රු.1,04,16,206.40 ක්වූ මහ බැංකුවේ ඩොලර් ගිණුමේ ශේෂය රු.88,53,775.44 ක් වශයෙන් පොත් වලට ගෙන ඇත.

## 3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 3:1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා වූ මෙහෙයුම් ඌනතාවය වන රු.61,29,198 ඊට අනුරූප ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය වූ රු.63,35,457 සමග සසඳන කළ මෙහෙයුම් ප්‍රතිඵල රු.2,06,259 කින් වර්ධනයක් පෙන්නුම් කරයි. පහත විස්තර කර ඇති මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් විද්‍යාමාන වන ද්‍රව්‍යාත්මක අවිනිශ්චිත භාවය හේතු කොට ගෙන මෙම විචලනය විශ්ලේෂණය කිරීමෙන් අර්ථවත් ප්‍රතිඵලයක් ලැබිය නොහැකිය.

නියෝජිතායතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශවලින් පෙන්නුම් කරන මූල්‍ය ප්‍රතිඵල පසු වර්ෂ වලදී නිරීක්ෂණය වන අත්හැරීම් සාවද්‍ය සටහන් යනාදිය සම්බන්ධයෙන් ගැලපුම් කිරීම නියෝජිතායතනය සිරිත් පරිදි සිදුවේ. ඒ අනුව 1988 වර්ෂය සඳහා ගිණුම් වල දක්වා තිබූ රු.63,35,457 ක් වූ ඌනතාවය, සමාලෝචිත වර්ෂය තුළ රු.10,58,134 කින් ගලපා තිබුණි. පසුගිය වර්ෂ හතර තුළ කරන ලද ඒ හා සමාන ගැලපීම් පහත දැක්වේ.

| වර්ෂය | මූල්‍ය ප්‍රතිඵල | පසු වර්ෂයේ කරන ලද ගැලපීම් |
|---|---|---|
| | රු. | රු. |
| 1985 | (19,74,832) | 1,10,123 |
| 1986 | (45,38,360) | (83,26,598) |
| 1987 | (38,58,065) | ( 37,962) |
| 1988 | (63,35,457) | (10,58,134) |

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් පසු වර්ෂ වලදී ඒ හා සමාන ගැලපීම් නොකෙරේ යැයි නිගමනය කළ නොහැක. ඒ හේතුවෙන් ගිණුම් වලින් නිරූපනය වන මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වය පිළිබඳව විශ්වාසයක් රැඳවිය නොහැකිය.

3:2 ප්‍රවාහන ඇණිය

සමාලෝචිත වර්ෂය තුල වාහන 28 කින් යුත් ඇණියක් නියෝජිතායතනය සතුව තිබූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ වාහන 25 ක් තිබුණි. සමාලෝචිත වර්ෂය තුල මෙම ඇණියේ ධාවන නඩත්තු යනාදියේ පිරිවැය රු.20,67,942 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූප වියදම රු.15,94,175 ක් විය. මෙම වාහන පාවිච්චි කිරීමට අදාල, ඇතැම් සැලකිය යුතු සංඛ්‍යා ලේඛණ පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ධාවනය කරන ලද කිලෝ මීටර් ගණන | : | 3,58,447 |
| පරිභෝජනය කරන ලද ඉන්ධන ලීටර් ගණන | : | 68,265 |
| ලීටරයකට සමස්ථ සාමාන්‍ය කාර්ය සාධනය කි.මී. | : | 5.25 |
| ඉන්ධන වෙනුවෙන් දරන ලද මුළු වියදම | : | රු. 7,04,006 |
| කිලෝ මීටරයකට ඉන්ධන වෙනුවෙන් වූ සාමාන්‍ය වියදම | : | රු. 1.96 |
| අළුත්වැඩියා වෙනුවෙන් දරන ලද මුළු වියදම | : | රු.13,63,936 |
| කිලෝ මීටරයකට අළුත්වැඩියා වෙනුවෙන් දරන සාමාන්‍ය වියදම | : | රු. 3.80 |

3:3 අයවැය පාලනය

අයවැය ගත සහ තථ්‍ය ප්‍රමාණයන් අතර සැලකිය යුතු විචලනයක් පෙනී යන අතර, අයවැය ලේඛණය පාලන කාරකයක් වශයෙන් ඵලදායී ලෙස යොදා ගෙන තිබූ බව නොපෙනේ.

4. <u>පද්ධති සහ පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු මාගේ විස්තරාත්මක වාර්තාව මගින් නියෝජිතායතනයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂෙත්‍රයන් අතරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

6 (අ) මුදල්

(ආ) අත්තිකාරම්

(ඇ) මිලට ගැනීම

(ඈ) ස්ථාවර වත්කම්

(ඉ) අයවැය

(ඊ) ගිණුම් ලියා තැබීම

විගණකාධිපති.